

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2021

වෙළෙඳ අමාත්‍යාංශය

වාණිජ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංක 295

පටුන

පරිච්ඡේදය 01 - ආයතන පැතිකඩ.....**01**

පරිච්ඡේදය 02- ප්‍රගතිය හා ඉදිරි දැක්ම.....**44**

පරිච්ඡේදය 03- වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය.....**47**

පරිච්ඡේදය 04- කාර්ය සාධන දර්ශක.....**62**

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය **(SDG).....63**

පරිච්ඡේදය 06- මානව සම්පත් පැතිකඩ..... **65**

පරිච්ඡේදය 07- අනුකූලතා වාර්තාව..... **69**

පරිච්ඡේදය 1

– ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

වෙළඳ අමාත්‍යාංශයේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන වාණිජ දෙපාර්තමේන්තුව විසින් ද්වීපාර්ශවික, කලාපීය සහ බහුපාර්ශවික මට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතාවල සමස්ත පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. මෙම සන්දර්භය තුළ වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්ය භාරයට වෙළඳ ප්‍රතිපත්ති සහ ප්‍රවර්ධනයට අදාළ කාර්යයන් ඇතුළත් වේ.

1.2. දෙපාර්තමේන්තු දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය

දැක්ම

"ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම"

මෙහෙවර

"සමස්ත නිෂ්පාදන, ආදායම් සහ සේවා නියුක්තිය දියුණු කිරීම තුළින් ජීවන තත්ත්වය නංවාලීම සහ ඉහළ ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීම මඟින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනය සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීමේ අරමුණින් යුතුව, රජයේ වෙළඳ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මඟින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතා ද්වීපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටම් වලින් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම."

1.3 වාණිජ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

1) ලෝක වෙළඳ සංවිධානයේ (WTO) සියලුම මට්ටමේ සාකච්ඡා ක්‍රියාවලිය (එනම් තීරණ ගැනීම සහ තාක්ෂණික) සඳහා සක්‍රීයව සහභාගීත්වයෙන් සහ ඵලදායී නියෝජනයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික හා වාණිජ අභිරුචියන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම පොදු ස්ථාවරයක් ඇතිකර ගැනීම උදෙසා බහුපාර්ශවීය සම්මේලනයන් හි සමාන අදහස් දරණ රටවල් සමඟ සමබන්ධ වීම.
2) ශ්‍රී ලංකාවේඅපනයනසඳහාවරණීයපොදුක්‍රමය (GSP) වැනි අන්‍යොන්‍ය නොවන වෙළඳ ගිවිසුම් යටතේ තීරුබදු සහන සුරක්ෂිත කිරීමට සාකච්ඡා පැවැත්වීම.
3) නිදහස්වෙළඳගිවිසුම් (FTA) සහකලාපීයවෙළඳගිවිසුම් (RTA) වැනිඅන්‍යොන්‍ය වෙළඳ ගිවිසුම් යටතේ වරණීය වෙළඳපොළ ප්‍රවේශය අත්පත් කර ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම. සාකච්ඡා යටතට අයත් ගිවිසුම් පහත පරිදි වේ.
   i. බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල ප්‍රවේශය (BIMSTEC) බංගලාදේශය, භූතානය, ඉන්දියාව, නේපාලය, ශ්‍රීලංකාව මියන්මාරය හා තායිලන්තය යන රටවල් මීට අයත් වේ.
   ii. චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA)
   iii. ඉන්දියාව සමඟ ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ECTA)
   iv. ශ්‍රී ලංකා- තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA)
4) වෙළඳපොළ ප්‍රවේශය සම්බන්ධ වර්ධනයන් අධීක්ෂණය කිරීම, ප්‍රධාන විදේශීය අපනයන වෙළඳපොළ තුළ පනවනු ලැබෙන තීරුබදු සහ තීරුබදු නොවන පියවරයන් සහ එවැනි පියවරයන් මඟින් ශ්‍රී ලංකාවේ අපනයනයන් සඳහා එල්ලවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීම හෝ ඉවත් කිරීම සඳහා ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය මට්ටමේ නිසි සාධනීය නියෝජනය තුළින් සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග ගැනීම.

5) ආනයන වෙළඳපොළ තුළ පවතින විශේෂිත වෙළඳපොළ ප්‍රවේශ බාධා විසඳීම සඳහා අවශ්‍ය ප්‍රමිති / ක්‍රියාපටිපාටි ජාතික මට්ටමින් සකස් කරමින් සහ කලාපීය / අන්තර්ජාතික ප්‍රමිති සැකසුම් ආයතනයන්ගෙන් අනුමැතිය / සහතික ලබාගනිමින් සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග දියත් කිරීම.
6) නිදහස් වෙළඳ ගිවිසුම්, කලාපීය වෙළඳ ගිවිසුම් සහ වරණීය පොදු ක්‍රමය යටතේ වෙළඳපොළ ප්‍රවේශ අවස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ / වැඩමුළුකොළඹ සහ ප්‍රාදේශීය නගර වල පැවැත්වීම.
7) විදේශීය වෙළඳපොළ තුළ පවතින තීරුබදු හා තීරුබදු නොවන පියවරයන් සහ එවැනි පියවරයන් මඟින් ශ්‍රී ලංකාවේ අපනයන්ට වන බලපෑම විශ්ලේෂණය කිරීම මඟින් සැපයුම් පාර්ශවීය බාධා විසඳීම සඳහා උපදෙස් ලබා දීම ද ඇතුළුව විදේශීය රටවල වෙළඳපොළ ප්‍රවේශයට අදාල වර්ධනයන් පිළිබඳ තොරතුරු බෙදාහැරීම.
8) නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ප්‍රභවස්ථාන සහතිකපත් ලබා ගැනීමට සුදුසුකම් ඇතිකර ගැනීම පිළිබඳ උපදෙස් ලබාදීම සහ මහපෙන්වීම ඇතුළු ප්‍රභවස්ථාන නීති, නිෂ්පාදනය, ක්‍රියාපටිපාටිමය අවශ්‍යතාවයන් පිළිබඳ විශේෂඥ උපදෙස් ලබාදීම.
9) පහත සඳහන් වරණීය ක්‍රමයන් සහ කලාපීය, ද්විපාර්ශවීය සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයන පහසුකම් සැලැස්වීම සඳහා ප්‍රභවස්ථාන සහතික කඩිනමින් නිකුත් කිරීම.
    i. වරණීය පොදු ක්‍රමය (GSP)
    ii. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)
    iii. දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)
    iv. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
    v. ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
    vi. පකිස්ථාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
    vii. ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)
    viii. සිංගප්පූරු ශ්‍රීලංකා නිදහස් වෙළඳ ගිවිසුම (SSLFTA)
10) අන්තර්ජාතික වෙළඳාමෙහි නව වර්ධනයන්ට අදාළ මාතෘකා පිළිබඳ සහ ලෝක වෙළඳ සංවිධානයේ ගිවිසුම් පිළිබඳ විදේශීය සම්පත් දායකයින් සමඟින් පුහුණු වැඩසටහන් / වැඩමුළු කොළඹ සහ ප්‍රාදේශීය නගරයන් හි සංවිධානය කිරීම.
11) ශ්‍රී ලංකාව තුළට සහ පිටතට භාණ්ඩයක් ආනයනය කිරීමේදී හෝ අපනයනය කිරීමේදී අනුකූල විය යුතු සියළුම අවශ්‍යතාවයන්ට අදාළ විමසීමකට පිළිතුරු වශයෙන් තොරතුරු ලබාදෙන, ආයතන 41ක අපනයන සහ ආනයන ක්‍රියාපටිපාටි පිළිබඳ යාවත්කාලීන තොරතුරු ඇතුළත් "ශ්‍රී ලංකා වෙළඳ බිහිදොර (SLTIP) " පවත්වා ගැනීම.
12) විදේශීය පාර්ශවයක් සහ ශ්‍රී ලංකාව අතර ඇති වන වෙළඳ ආරවුල් සාමකාමීව විසඳීම සඳහා සහය ලබා දීම.
13) අපනයනකරුවන් වෙත ආනයනික රටවල්වලින් සිය නිෂ්පාදනයන්ට යොමු කෙරෙන ප්‍රපාතන විරෝධී විමර්ශනයන් සඳහා පිළිතුරු සම්පාදනය කිරීමට මග පෙන්වීම සහ සහය ලබා දීම.
14) ශ්‍රී ලංකාවේ අපනයන, ආනයනික රට තුළ ප්‍රතිතෝලන බදු විමර්ශනයන් සඳහා යටත්වන විට එය විශ්ලේෂණය කිරීම හා ඊට පිළිතුරු සකස් කිරීම.
15) විදේශ වාණිජ නියෝජනය - වෙළඳාම ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සත්කාරක රටවලදී ශ්‍රී ලංකාවේ වාණිජ හා ආර්ථික අපේක්ෂා ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම සඳහා වන වාණිජ දෙපාර්තමේන්තුවේ විදේශ වාණිජ නියෝජනය කිරීමේ කාර්යයරටවල් 28ක ස්ථාපිත එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩල 31ක් නියෝජනය කරන නිලධාරීන් 33න් සමන්විත වේ.
16) පවතින්නා වූ මෙන්ම විභවීය ශ්‍රී ලාංකීය නිෂ්පාදන සඳහා වෙළඳපොළ ප්‍රවේශය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.
17) නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දීම.
18) ණය දෙන ආයතන අනුමත කිරීම.
19) ඒකාබද්ධ කොමිසම/කමිටු (JCs) සහ වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුම් (TIFAs) සංවිධානය කිරීම/ සම්බන්ධීකරණය කිරීම.

1.4 වාණිජ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ සහ එහි කාර්යසාධනය

1.5.1 බහුපාර්ශවික වෙළඳ සබඳතා අංශය

ශ්‍රී ලංකාවේ බහුපාර්ශවික වෙළඳ සබඳතා මඟින් මූලික වශයෙන් ලෝක වෙළඳ සංවිධානයේ (WTO) ගිවිසුම් කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD), ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ ලෝක වෙළඳ සංවිධාන නීතිය පිළිබඳ උපදේශක මධ්‍යස්ථානය (ACWL) ද ඇතුළත්ව, වෙනත් බහුපාර්ශවික සංවිධාන කිහිපයක් සමඟ ද ශ්‍රී ලංකාව සමීප සම්බන්ධතාවයක් පවත්වා ගෙන යනු ලැබේ.

I. 2018 මැයි මාසයේ දී පාර්ලිමේන්තුවේදී සම්මත වනලද 2018 අංක 2 දරණ ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත සහ 2018 අංක 3 දරණ ආරක්ෂණ පියවර පනත ක්‍රියාත්මක කිරීම.

අ.නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ට අනුව සහ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් කරන ලද සමාලෝචනය පරිදි ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පියවර පැනවීම පිළිබඳ විමර්ශන ආරම්භ කිරීම සඳහා ලිඛිත අයදුම්පත් සංශෝධනය කර ඇත. එම ආකෘති පත්‍ර දෙකම භාෂා තුනකින් ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු සිදු කෙරෙමින් ඇත.

ආ. වෙළඳ පිළියම් විමර්ශන ක්‍රියා පටිපාටිය වෙනුවෙන් මෙහෙයුම් අත්පොත කෙටුම්පත් කිරීම සම්පූර්ණ කර ඊට ලිඛිත අයදුම්පත් ඇතුළත් කිරීමට ඇත.

ඇ. වාණිජ දෙපාර්තමේන්තුවේ වෙළඳ පිළියම් ඒකකයෙහි විමර්ශන ක්‍රියාවලිය සඳහා අභ්‍යන්තර නීති කෙටුම්පත් කිරීම අවසන් කර ඇත.

II. ශ්‍රී ලංකාවට එරෙහිව ආරම්භ කර ඇති වෙළඳ පිළියම් (ප්‍රපාතන විරෝධී) විමර්ශන සඳහා පිළිතුරු ලබා දීම.

පහත විමර්ශන යටතේ, ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ගේ පිළිතුරු ලබා දීම් මෙන්ම විමර්ශකයින් සහ ශ්‍රී ලාංකීය අපනයනකරුවන් සම්බන්ධ කිරීම සඳහා පහසුකම් සැලසීම වාණිජ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය විය.

අ. ශ්‍රී ලංකාවෙන් ඇලුමිනියම් ෆොයිල් ආනයනය කිරීම සම්බන්ධයෙන් යුරෝපා සංගමය (EU)විසින් සිදු කරන ලද මගහැරීම් විරෝධී විමර්ශනය - අපනයනකරු සහ ප්‍රභවස්ථාන සහතික නිකුත් කරන ලද වෙළඳ මණ්ඩලය පෝලන්ත රේගු සමඟ සම්බන්ධ කරන ලදී.

ආ. ශ්‍රී ලංකාවෙන් බයිසිකල් ආනයනය කිරීමේදී යුරෝපා සංගමය විසින් පනවන ලද ප්‍රපාතන විරෝධී පියවර පිළිබඳ මගහැරීම් විරෝධී විමර්ශනය - මුල් තීරණය තහවුරු කරමින් යුරෝපා සංගමය මඟින් සිදු කළ නැවත විමර්ශනය අවසන් විය.

ඇ. ශ්‍රී ලංකාවෙන් කෘත්‍රිම රසකාරක ආනයනය කිරීම සම්බන්ධයෙන් ජර්මනිය විසින් සිදු කරන ලද මගහැරීම් විරෝධී විමර්ශනය - අපනයනකරු, ප්‍රභවස්ථාන සහතික නිකුත් කරන ලද වෙළඳ මණ්ඩලය ජර්මානු රේගුව සමඟ සම්බන්ධ කරන ලදී.

ඈ. තඹ සහ තඹ මිශ්‍ර ලෝහ පැතලි රෝල් කරන ලද නිෂ්පාදන ආනයනය කිරීම සම්බන්ධයෙන් ඉන්දියාව විසින් ප්‍රපාතන විරෝධී විමර්ශනය - ප්‍රතිචාර දැක්වීමට අපනයනකරුට මහපෙන්වීම, විමර්ශනය අවසන් විය

ඉ. සාමාන්‍ය මධ්‍යම ඝනත්ව තන්තු පුවරු (MDF Boards) මත ඉන්දියාව විසින් ප්‍රපාතන විරෝධී ක්‍රියාමාර්ග පිළිබඳ ඇඟයුම් සමාලෝචනය - ප්‍රතිචාර දැක්වීමට අපනයනකරුට මඟපෙන්වීම, සමාලෝචනය අවසන් විය.

ඊ. අත්වැසුම් ආනයනය සම්බන්ධයෙන් ආර්ජන්ටිනාව විසින් පැවැත් වූ ප්‍රපාතන විරෝධී විමර්ශනය - අපනයනකරු ප්‍රතිචාර දැක්වීමට මඟ පෙන්වූ නමුත් අපනයනකරු ප්‍රතිචාර නොදැක්වූ අතර විමර්ශනය අවසන් විය.

උ. මධ්‍යම ඝනත්ව තන්තු පුවරු (MDF Boards) පිළිබඳ ඉන්දියාව විසින් ප්‍රතිතෝලන බදු විමර්ශනය: ප්‍රතිචාර දැක්වීමට අපනයනකරුට මඟපෙන්වීම, විමර්ශනය අවසන් විය.

III. ලෝක වෙළඳ සංවිධානයේ 12 වන අමාත්‍ය සමුළුව (MC12)

අ. 2021 නොවැම්බර් 30 සිට දෙසැම්බර් 03 දක්වා පැවැත්වීමට නියමිතව තිබූ MC12 සමුළුව වසංගතයේ නව වර්ධන තත්ත්වය හේතුවෙන් අවසන් මොහොතේ කල් දමන ලදී. අවශ්‍ය සියලුම සම්බන්ධීකරණය, සම්පාදන කටයුතු සහ වැදගත් කාරණා යන අංශ සියල්ලම එය කල්දැමීමේදී සම්පූර්ණ කර තිබිණි.

ආ. න්‍යාය පත්‍ර අයිතම සම්බන්ධයෙන් රටේ ස්ථාවරය සකස් කිරීම ජිනීවා හි ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලය සමඟ අදාළ රේඛීය අමාත්‍යාංශවල සහයෝගය ඇතිව සම්පූර්ණ කරන ලදී.MC12 හි විවිධ අනෙකුත් ලේඛන වනMC12 දේශපාලන ප්‍රකාශනය, කෘෂිකර්මාන්තය, ධීවර සහනාධාර, කොවිඩ්-19 වසංගත සහ ඊ-වාණිජ්‍ය කටයුතු වැඩසටහනට WTO ප්‍රතිචාරය සහ තහනම දීර්ඝ කිරීම පිළිබඳ සාකච්ඡා සඳහා ජිනිවාදූතමෙහෙවරකාර්යාලයසහභාගී විය.

ඇ. MC12 හි සහභාගී වීමට නියමිතව සිටි නියෝජිතයින් සඳහා MC12 ට පෙර ධීවර සහනාධාර සහ කෘෂිකර්ම සාකච්ඡා වැනි වැදගත් විෂය කරුණු පිළිබඳ සාරාංශගත සැසි සංවිධානය කරන ලදී.

IV. ධීවර සහනාධාර නියාමනය පිළිබඳ සාකච්ඡා අඛණ්ඩව සිදු කිරීම

අ. පටිත (text based) මත පදනම් වූ WTO සාකච්ඡා දිගටම සිදු කෙරෙමින් පවතී. WTO ජිනීවා හි ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලයධීවර අමාත්‍යාංශය, ධීවර රාජ්‍ය අමාත්‍යාංශය සහ ධීවර දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ශ්‍රී ලංකා පාර්ශවයෙන් සාකච්ඡා සඳහා අවශ්‍ය අදාළ යෙදවුම් සපයයි. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා විශේෂ සහ වෙනස්කොට සැලකීම පිළිබඳ සාකච්ඡාවලදී රටේ අභිරුචිය සැලකිය යුතු ලෙස ආරක්ෂා කිරීමට ජිනීවා දූත මණ්ඩලය සමත් වී ඇත.

ආ. ධීවර සහනාධාර පිළිබඳ TNC (වෙළඳ සාකච්ඡා කමිටුවේ) මාර්ගගත අමාත්‍ය රැස්වීම
MC12 මගින් සාකච්ඡා අවසන් කිරීම සඳහා දේශපාලන උපස්ථය/නියමයක් ලබා ගැනීම සඳහා මාර්ගගත අමාත්‍ය රැස්වීමක් 2021 ජූලි 15 දින පවත්වන ලදී. ඒ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ගරු. වෙළෙඳ අමාත්‍ය සහ ගරු ධීවර රාජ්‍ය අමාත්‍යවරයා සහ රේඛීය අමාත්‍යාංශ, වාණිජ දෙපාර්තමේන්තුව සහ ජිනීවා හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල නිලධාරීන් සහභාගී විය.ගරු. වෙළඳ අමාත්‍යවරයා විසින් රටේ ප්‍රමුඛතා සහ MC12 දක්වා යොමු විය යුතු සාකච්ඡාවන් ශ්‍රී ලංකාව විසින් ප්‍රත්‍යක්ෂ කර ගන්නා ආකාරය ගෙනහැර දක්වන ලදී.

ඇ. ධීවර කටයුතු නිළධාරීන් සඳහා සාරාංශගත සැසිය

ජිනීවා හි ශ්‍රී ලංකා දූත මණ්ඩලයේසහභාගීත්වයෙන් ධීවර අමාත්‍යාංශයේ, ධීවර රාජ්‍ය අමාත්‍යාංශයේ සහ ධීවර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉලක්ක කර ගනිමින් පැවැත්වීමටනියමිතවූමාර්ගගත අමාත්‍ය රැස්වීමට පෙර, දැනුවත් කිරීමේ සාරාංශගත සැසියක් සංවිධානය කර තිබුණි. මෙම සැසියේදී ධීවර සහනාධාර සාකච්ඡාවල ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධයක් ලබා දුන් අතර අදාළ නිලධාරීන්ට තිබූ ගැටලු ගණනාවක් පිළිබඳව ද කරුණු පැහැදිලි කරන ලදී.WTO ධීවර සහනාධාර ගිවිසුමක් අවසන් කිරීමේදී ගත යුතු උපාය මාර්ගික ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳව බලධාරීන් දැනුවත් කිරීමට එමඟින් හැකි විය.

V. කෘෂිකාර්මික වෙළඳාම නියාමනය පිළිබඳ සාකච්ඡා අඛණ්ඩව සිදු කිරීම

අ. වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවූඅනෙකුත් ප්‍රමුඛතා හේතුවෙන් WTO කෘෂිකාර්මික සාකච්ඡා වල මන්දගාමී ප්‍රගතියක් දක්නට විය. කෙසේ වෙතත්, මැදිහත්වීම් ගණනාවක් ඔස්සේ ප්‍රධාන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවරය (දේශීය සහාය, පොදු කොටස් තබා ගැනීම සහ විශේෂ ආරක්ෂණ යාන්ත්‍රණය) ඉදිරිපත්කරන ලදී.

ආ. G-33 අමාත්‍ය මණ්ඩල රැස්වීම

MC12 සඳහා කණ්ඩායම් ස්ථාවරය ස්ථාපිත කිරීමේ අරමුණින් සාමාජික රටවල් 33 ක කණ්ඩායම (G-33) 2021 සැප්තැම්බර් 10 වන දින මාර්ගගත අමාත්‍ය රැස්වීමක් කැඳවන ලදී. මෙම රැස්වීමෙන් පසුව කණ්ඩායම විසින් MC12 සඳහා G-33 අමාත්‍ය ප්‍රකාශය නිකුත් කරන ලදී.ගරු. වෙළෙඳ අමාත්‍ය සහ ගරු කෘෂිකර්ම අමාත්‍ය යන අමාත්‍යවරුන් අදාළ නිලධාරීන් සමඟ රැස්වීමට සහභාගි විය. ගරු. වෙළෙඳ ඇමැතිවරයා රට නියෝජනයකරමින් ප්‍රකාශයක් නිකුත් කරන ලදී.

රැස්වීමට පෙර, කෘෂිකාර්මික සාකච්ඡා පිළිබඳ රටේ ස්ථාවරය පැහැදිලි කිරීම සඳහා ගරුවෙළෙඳඅමාත්‍යවරයා විසින් වත්මන් කණ්ඩායමේ සභාපති (ඉන්දුනීසියානු වෙළඳ අමාත්‍ය) සමඟ මාර්ගගත ද්විපාර්ශ්වික රැස්වීමක් පවත්වන ලදී.

ඇ. කෘෂිකාර්මික කටයුතු නිළධාරීන් සඳහා සාරාංශගත සැසිය

G-33 අමාත්‍යවරුන්ගේ රැස්වීම පිළිබඳ පසුබිමක් සැපයීමටමෙන්මWTO හි පැවැත්වෙන සියලුම කෘෂිකාර්මික සාකච්ඡාවන් හි තත්ත්වය පිළිබඳව සාරාංශගත සැසියක් සංවිධානය කරන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෙම දැනුවත් කිරීමේ සැසියට සහභාගි වූහ. අදාළ නිලධාරීන්ට තිබූ ගැටලු රැසක් පිළිබඳව සැසිවාරයේදී කරුණු පැහැදිලි කෙරිණි.

VI. ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම පහසුකරණ ගිවිසුමේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම

අ. අභියාචන හෝ සමාලෝචන සඳහා වූ ක්‍රියා පටිපාටි වාණිජ දෙපාර්තමේන්තුවෙ හි ස්ථාපිත කිරීම

ප්‍රභවස්ථාන සහතික පිළිබඳ කටයුතු සඳහා අභියාචන සහ සමාලෝචන ක්‍රියා පටිපාටි පිළිබඳ සාධාරණ නිශ්චිත කාල සීමාවක් ස්ථාපිත කරන ලද අතර එය දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි පළ කරන ලදී. එමෙන්ම එහි අනුකූලතාවය පිණිස කාර්යමණ්ඩලය වෙත කාර්යාලීය උපදෙස් ලබා දෙන ලදී.

ආ. වෙළඳාම පහසුකරණය පිළිබඳ ජාතික කමිටුවට (NTFC) සහ ඊට අදාළ රැස්වීම් සඳහා සහභාගී වීම

NTFC රැස්වීම් 3 කට සහ වෙනත් වෙළඳාමපහසුකරණගිවිසුම (TFA)සම්බන්ධ රැස්වීම් 2 කට සහභාගී වූ අතර රටෙසමස්තයක් ලෙස TFA විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සාමූහිකව ඇගයීමට ලක් කරන ලදී. තවද, වාණිජ දෙපාර්තමේන්තුව, ලෝක බැංකුව සහ ITC (පරිත්‍යාගශීලීන්) සමඟ රැස්වීම් 02ක්ස දහා සහභාගී වන ලදී.

ඇ. වෙළඳාමපහසුකරණගිවිසුම (TFA) ක්‍රියාත්මක කිරීමේ අවසන් දින දීර්ඝ කිරීම

වාණිජ දෙපාර්තමේන්තුව, ජිනීවා හි නිත්‍ය දූතමණ්ඩලය සමඟින් එක්ව 2021 දෙසැම්බර් 31 වන විට ක්‍රියාත්මක කර අවසන් කළ යුතු සී කාණ්ඩය (Category C) යටතේ බැඳීම් සඳහා ක්‍රියාත්මක කිරීමේ කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටීම පිණිස NTFC ලේකම් කාර්යාලය වෙත මගපෙන්වන ලදී. ඒ අනුව, ඔක්තෝබර් 19 වන දින පැවති WTO-TFA කමිටු රැස්වීමේදී,එය 2023 ජුනි 30 දක්වා දීර්ඝ කිරීමට ශ්‍රී ලංකාවට අනුමැතිය ලබා දෙන ලදී.

ඈ.වාණිජ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වෙළඳ බිහිදොර(SLTIP) සහ පියවරෙන් පියවර ක්‍රියාකාරිත්වය මගින් සපයනු ලබන සේවාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සමඟ එක්ව අපනයනකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පහක් වර්ෂය තුළ පවත්වන ලදී. වසරේ පළමු වැඩසටහන (සැසිවාර 4ක්) නොවැම්බර් 02-03 දක්වා හම්බන්තොටදී ද, දෙවන වැඩසටහන (සැසිවාර 4ක්) නොවැම්බර් 09-10 දක්වා අම්පාරේදී ද පැවැත්විණි. තෙවන වැඩසටහන (සැසිවාර 4ක්) නොවැම්බර් 11 සිට 12 දක්වා මඩකලපුවේදී පැවැත්විණි. සිව්වන වැඩසටහන දෙසැම්බර් 09-10 දක්වා කෑගල්ලේදී පැවැත්වුණු අතර පස්වන වැඩසටහන (සැසි 3ක්) දෙසැම්බර් 16-17 දක්වා මොණරාගලදී පැවැත්විණි.

ඉ. ශ්‍රී ලංකා වෙළඳ බිහිදොර (SLTIP) තුළ යාවත්කාලීන කිරීම් සිදු කිරීම

දේශසීමා අතර සිදුවන වෙළඳාම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන 40 ක තොරතුරු මාසිකව ලබාගැනීමෙන් ශ්‍රී ලංකා වෙළඳ බිහිදොර වර්ෂය පුරාම යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.

ඊ. ශ්‍රී ලංකා වෙළඳබිහිදොර (SLTIP) වෙත ශ්‍රී ලංකාව තුළ සත්කාරකත්වය දැරීමට කටයුතු සැලසීම

SLTIP හි වත්මන් සත්කාරකත්වය දරණ ලෝක බැංකුව, සත්කාරක පිරිවැය 2021 දෙසැම්බර් දක්වා දීර්ඝ කිරීමට එකඟ විය. දෙපාර්තමේන්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කර 2021 නොවැම්බර් මාසයේ සිට වසරක කාලයක් සඳහා SLTIP සත්කාරකත්වය සහ නඩත්තු කිරීම සඳහා M/S Arimac Lanka Pvt. Ltd යන පෞද්ගලික සමාගම වෙත ලබා දීමට තෝරා ගන්නා ලදී.

උ. පියවරෙන් පියවර ක්‍රියාකාරිත්වය

පියවරෙන් පියවර ක්‍රියාකාරීත්වය (SBSF) යනු වත්මන් ශ්‍රී ලංකා වෙළඳ බිහිදොර පරිශීලනපහසුවැඩිදියුණු කිරීම සඳහා වන අතිරේක ක්‍රියාකාරීත්වයකි. SBSF වැඩසටහන 2021 පෙබරවාරි 9 වන දින කොළඹ ෂැංග්‍රිලා හෝටලයේදී වෙළෙඳ අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මහතා විසින් දියත් කරන ලදී. අපනයන නිෂ්පාදන කාණ්ඩ 23කින් සහ ආනයන නිෂ්පාදන කාණ්ඩ 6ක්මෙයටඅයත්වේ.තොරතුරු පරතරය වෙනුවෙන් තොරතුරු එකතු කිරීමට සහ සැලසුම්ගත කළ තොරතුරු තහවුරු කිරීමට වාණිජ දෙපාර්තමේන්තුව සම්බන්ධ වූ අතර එම වලංගු කිරීම හරහා තොරතුරු වල 98% නිරවද්‍යතාවය සහතික කිරීමට හැකි විය.

VII. ශ්‍රී ලංකාව විසින් පවත්වාගෙන යනු ලබන ආනයන සීමා කිරීම්

අ. Covid-19 වසංගතයේ බලපෑම් මැඩපැවැත්වීම සඳහා හඳුන්වා දුන් ශ්‍රී ලංකාවේ ආනයන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳව WTO සාමාජිකයින් විසින් විවිධ WTO කමිටු රැස්වීම්/කවුන්සිලවලදී මතු කරන ලදී. විවිධ පාර්ශ්වවලින් එල්ල වූ බලපෑම් නොතකා ලෝක වෙළඳ සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලයට මෙම වැඩපිළිවෙළ ආරක්ෂා කිරීමට මෙතෙක් හැකි වී තිබේ.

VIII. ශ්‍රී ලංකාව සඳහා විශේෂ සහ වෙනස්කොට සැලකීම සුරක්ෂිත කිරීම

කුඩා හා අවදානම් ආර්ථිකයක් (SVE) සහිත සහ ශුද්ධ ආහාර ආනයනය කරන සංවර්ධනය වෙමින් පවතින රටක් (NFIDCC) ලෙස ශ්‍රී ලංකාව සඳහා විශේෂ සහ වෙනස්කොට සැලකීම ලබා ගැනීම

වෙනුවෙන් ජිනීවා හි WTO ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත විසින් ජිනීවා හි සමාන අදහස් දරණ රටවල් සමඟින් සාමූහිකව කටයුතු කරමින් සහ යෝජනා භාර දෙමින් සක්‍රීයව සිය කාර්යයෙහි නියැලී සිටී.

IX. UNCTADහි අමාත්‍ය සමුළුවේ 15 වැනි සැසිය (UNCTAD-15)

අ. 2021 ඔක්තෝබර්3-7 දිනයන්හි මාර්ගගත අයුරින් පැවති UNCTAD හි අමාත්‍ය සමුළුවේ 15 වැනි සැසිවාරය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම.
අමාත්‍ය සැසිවාර සඳහා ශ්‍රී ලංකා දූත පිරිස ගරුවෙළෙඳ අමාත්‍යවරයා මෙහෙයවූ අතර ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම් වෙළඳ අමාත්‍යාංශ ලේකම් විසින් මෙහෙයවන ලදී. මුදල් අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, විදේශ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව, වාණිජ දෙපාර්තමේන්තුව සහ ජිනීවා හි දූත මණ්ඩලයේ නිත්‍ය නියෝජිතයින් UNCTAD 15 සමුළුවේ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සාමාජිකයින් විය.

ආ. ශ්‍රී ලංකාව වැනි රටවල් සඳහා ජාත්‍යන්තර ආධාර ක්‍රියාමාර්ගවල හදිසි අවශ්‍යතාවය සහ ණය අර්බුදය, භාණ්ඩ මතයැපීම, ස්වාභාවික හා ස්වභාවික නොවන විපත්, ආහාර අනාරක්ෂිත භාවය වැනි ගෝලීය දකුණු මුහුණ දෙන පොදු අභියෝග පිළිබඳව වෙළඳ අමාත්‍යවරයා විසින් සිය ප්‍රකාශයේ දී ආවරණය කරන ලදී.

ඇ. UNCTAD-15 ප්‍රකාශය සහ G-77 ප්‍රකාශය පිළිබඳව අදාළ රේඛීය අමාත්‍යාංශ සමඟ සහයෝගයෙන් සමුළුවට පෙර අදහස් දැක්වීමට වාණිජ දෙපාර්තමේන්තුව කටයුතු කරනලදී.

ඈ. 77 කණ්ඩායම සහ චීන (G-77) අමාත්‍ය රැස්වීම
ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමට පෙර පැවති UNCTAD-15 ට සමගාමීව G-77 සිය අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වීය. මෙම රැස්වීමේ ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ නායකත්වය ගරු වෙළෙඳ අමාත්‍යවරයා මෙහෙයවන ලදී.රැස්වීම විසින් "G 77 කණ්ඩායමේ සහ චීනයේ Bridgetown අමාත්‍ය ප්‍රකාශය UNCTAD-15රැස්වීමේදී" සම්මත කරන ලදී.රටේ ප්‍රමුඛතා බොහොමයක් මෙම ප්‍රකාශනයට ඇතුළත් කිරීමට හැකි විය.

X. වෙළඳ භාණ්ඩ සඳහා වන පොදු අරමුදල (CFC)

අ. 2021 දෙසැම්බර් 14-15 දිනවල මාර්ගගත අයුරින් පැවති CFC හි 33 වන පාලක මණ්ඩල රැස්වීම නියෝජනය කිරීම.

ආ. CFC විසින් ව්‍යාපෘති යෝජනා කැඳවීම පිළිබඳ තොරතුරු ව්‍යාපාරික ප්‍රජාව අතර බෙදා හැරීම සහ CFC වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමට ඔවුන් සමඟ සම්බන්ධීකරණය කිරීම. කෙසේවෙතත්ව්‍යාපාරික ප්‍රජාවගෙන් ව්‍යාපෘති යෝජනා ලැබී නොමැත.

XI. බහුපාර්ශවික කටයුතු අංශය යටතේ සිදු කෙරෙන අනෙකුත් ක්‍රියාකාරකම්

අ. නියාමන ක්‍රියාමාර්ග හඳුන්වාදීම/ මාර්ගගත ව්‍යාපාර/ වෙළඳුන් සඳහා මාර්ගෝපදේශයක් හඳුන්වාදීම පිළිබඳ මහජනඋපදේශනය
පාරිභෝගික කටයුතුඅ ධිකාරිය විසින් වෙළෙන්දන් සඳහා සකස් කරනු ලබන මාර්ගෝපදේශ කෙටුම්පත් සහ මාර්ගගත ව්‍යාපාර සඳහා නියාමන ක්‍රියාමාර්ග හඳුන්වාදීම පිළිබඳව වාණිජ දෙපාර්තමේන්තුව විසින් උපදේශන හා අදහස් ලබා දෙන ලදී.

ආ. 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු අධිකාරී පනතේ සංශෝධන
වාණිජ නිලධාරීන් හරහා වෙනත් රටවල ක්‍රියාත්මක වන පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු සැපයීමට වාණිජ දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

ඇ. UNCTAD ලෝක ආයෝජන සංසදය 2021

2021 ඔක්තෝම්බර් 18-22 දිනවල මාර්ගගතලෙසින් පැවති 2021ලෝක ආයෝජන සංසදය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කරන ලදී. UNCTAD හි මහලේකම්වරයාගෙන් ලැබුණු විශේෂ ආරාධනයකට අනුව, ඔක්තෝබර් 21 වන දින පැවති තිරසාර සංවර්ධනය සඳහා ආයෝජනය පිළිබඳ අමාත්‍ය වට මේස රැස්වීමේ දී ගරු වෙළෙඳ අමාත්‍යවරයා විසින් ප්‍රකාශයක් සිදු කරන ලදී.

ඈ.COVID-19 වැළැක්වීම, පාලනය කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා බුද්ධිමය දේපල අයිතිවාසිකම් වෙළඳාමට අදාළ අංශ (TRIPS-Trade Related Aspects of Intellectual Property Rights) අත්හැරීම

ශ්‍රීලංකාව, ජිනීවා දූතමණ්ඩලය හරහා, COVID-19 පාලනය කිරීම සඳහා තිරණාත්මක භාණ්ඩ සඳහා ප්‍රවේශවීමේ අසමානතාවයන් විසඳීමට උත්සාහකරන බුද්ධිමය දේපළ අයිතිවාසිකම් අත්හැරීමේ වෙළඳාම ආශ්‍රිත අංශ පිළිබඳ සමාන අදහස් ඇති රටවල යෝජනාවකට සහාය දැක්වීය.

ඉ. WTO සාමාජිකයින්ගේ වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය (TPR)

ජිනීවා දූත මණ්ඩලය විසින් මෙම වසර තුළ ඉන්දියාව, තායිලන්තය, වියට්නාමය, සෞදි අරාබිය, කටාර්, මොංගෝලියාව, රුසියාව, සිංගප්පූරුව, කොරියාව, ආර්ජන්ටිනාව, ඕමානය, මොරිෂස් සහ චීනය යන රටවල වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචන වෙත මැදිහත්වීම් සිදු කරන ලදී.අදාළ අවශ්‍ය යෙදවුම් දෙපාර්තමේන්තුව සහ වාණිජ නිලධාරීන් විසින් සපයන ලදී. අදාළ රටවලට අපනයනය කිරීමට අනෙකුත්ශ්‍රී ලංකාවේ වෙළඳ ගැටළු අතර ශ්‍රී ලංකාවට බාධා කරන මැදිහත්වීම්දඇවරණය කෙරෙන ලදී.

ඊ. වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ උපදේශන සැපයීම

කොළඹ විවිධ ආයතනවල ඉල්ලීම පරිදි ජිනීවා දූත මණ්ඩලය විසින් විස්තීරණ වාර්තා/සටහන් 14ක් සකස් කර ඉදිරිපත් කරන ලදී.

1.5.2 ද්වීපාර්ශික කටයුතු අංශය

I. ඉන්දු- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම(ISFTA)

2000 වර්ෂයේ මාර්තු 01වන දින සිට බලාත්මක ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ((ISFTA) මඟින් ඉන්දියානු වෙළඳ පොළ වෙත ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා සුවිශේෂී දායකත්වයක් අඛණ්ඩව ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාවට සිදුකළ අපනයනවල සමස්ත වටිනාකම 2021 වර්ෂයේදී ඇ.ඩො. මිලියන 815.8වන විට2020 වර්ෂයේ ඇ.ඩො. මිලියන 602.3ක් ලෙසවාර්තා වී ඇත.කොවිඩ් 19 වසංගත තත්ත්වයේ බලපෑම නැවත ප්‍රකෘතිමත් වී ඇති බවට ඉඟියක් ලෙසින්, 2020වසරේ දී ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත සිදු කරන ලද ඇ.ඩො.මි 358.4 ක අපනයනයන්ට වඩා 47% ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2021 වසරේ දී ඇ.ඩො.මි. 525.8% ක් වටිනා භාණ්ඩ ප්‍රමාණයක් ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත අපනයනය කර ඇත.2021 දී ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත සිදු කරන ලද අපනයනවලින් 65%ක් ISFTA තිරුබදු සහන යටතේ සිදු කර ඇති බව සඳහන් කිරීම වටී.

ඉන්දියාව වෙතින් ශ්‍රී ලංකාවට සිදු කරන ආනයන පිළිබඳ සලකා බලන විට 2020 වසරේ සමස්ත වටිනාකම ඇ.ඩො.මි 3,002.1 ක් වූවද එය 2021 වසරේ දී ඇ.ඩො.මි 4,421,4 ක් ලෙස වාර්තා වී ඇත.ISFTA යටතේ ඉන්දියාවෙන් ශ්‍රී ලංකාව වෙත සිදු කර ඇති ආනයන 2021 වසරේ දී ඇ.ඩො.මි. 208.9ක් වන විට 2020 වසරේ දී ISFTA යටතේ ආනයන අගය ඇ.ඩො.මි. 158.6ක් ලෙස වාර්තා වේ. ඒ අනුව,ISFTA තිරුබදු සහන යටතේ 2021 වසරේ දී 5%කට ආසන්න ප්‍රමාණයක් පමණක් ඉන්දියාවෙන් ශ්‍රී ලංකාව ආනයනයකර තිබේ.

සත්ව ආහාර, කරුංකා පුවක්, සත්ව හෝ එළවළු මේද හා තෙල් සහ ඒවායේ අතුරු කොටස්, පරිවරණය කරන ලද තඹ රැහැන් සහ කේබල්, අපද්‍රව්‍ය සහ සුන්බුන් කඩදාසි සහ කඩදාසි පුවරු, ගෘහ භාණ්ඩ, අත්‍යවශ්‍ය තෙල්, බනිජ ජලය සහ වාතිත ජලය, බයිසිකල්, ඇඟලුම් ආදියISFTA යටතේ ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට අපනයනය කරනු ලබන ප්‍රධාන අයිතම අතර වේ.

තවද. ISFTA යටතේ තීරුබදු රහිත ප්‍රතිලාභයක් වශයෙන්මිලියන 8ක වාර්ෂික ඇඟලුම් කෝටාවක් හිමි වේ. සමාලෝචිත වසර තුළ ඇ.ඩො.මි. 33.63 ක අගයකින් යුතුඇඟලුම්කොටස්මිලියන 8 ක උපයෝගීතා අනුපාතය 92.64% විය.

ISFTA හි ඇමුණුම- C(ප්‍රභවස්ථාන නීති පාඨය) යටතේ සඳහන් කර ඇති මෙහෙයුම් සහතික කිරීමේ ක්‍රියා පටිපාටිය (OCP) පිළිබඳ අවසන් තීරණයකට එළඹීම සඳහා OCP පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම 2021.08.24 දින පවත්වන ලදී.මෙම රැස්වීම සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් වාණිජ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු නිලධාරීන් සහ ඉන්දියාවේ ස්ථානගත කර ඇති වාණිජ නිලධාරීන් සහභාගී වූ අතර නවදිල්ලියේ වක්‍ර බදු සහ රේගු මධ්‍යම මණ්ඩලය, ඉන්දීය වාණිජ දෙපාර්තමේන්තුව සහ කොළඹ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් ඉන්දියාව නියෝජනය කරමින් සහභාගී විය.මෙම රැස්වීමේදී එකඟ වූ පරිදි ශ්‍රී ලංකා පාර්ශ්වය OCP හි කෙටුම්පත් පෙළ ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශයහරහා ඉන්දියාවේ වක්‍ර බදු සහ රේගු මධ්‍යම මණ්ඩලය වෙත ඉදිරිපත් කර මේ වනවිට ඒ පිළිබඳ ඔවුන්ගේ ප්‍රතිචාරය අපේක්ෂාවෙන් සිටී.

II. පකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම(PSFTA)

2005 වර්ෂයේ සිට බලාත්මක පකිස්ථාන- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) මඟින් ද දෙරට අතර සිදුකරන ද්වීපාර්ශ්වික වෙළඳ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා දායකත්වයක්ලබාදී ඇත. පකිස්ථානය වෙත ශ්‍රී ලංකාවෙන් සිදුකරන ලද සමස්ත අපනයන වටිනාකම 2020 වසරේදී ඇ.ඩො.මි74.3 ක් වන විට 2021 වසරේදී එය ඇ.ඩො.මි91.9 ක් ලෙස වාර්තා වී ඇත. PSFTA යටතේ පකිස්ථානය වෙත ශ්‍රී ලංකාවෙන් සිදු කරන ලද අපනයනය 2020 වසරේදී ඇ.ඩො.මි. 53.0 වනවිට 2021 වර්ෂයේ දී එය ඇ.ඩො.මි62.2 ක් ලෙස වාර්තා වී ඇත. ඒ අනුව 2021 වර්ෂය තුළ පකිස්ථානය වෙත ශ්‍රී ලංකාවෙන් සිදු කර ඇති සමස්ත අපනයනයෙන් 68% ක් PSFTA යටතේ සිදුකර ඇත. 2020 වසරේ දී පකිස්ථානය වෙතින් ශ්‍රී ලංකාව සිදුකර ඇති ආනයන ප්‍රමාණයේ සමස්ත වටිනාකම ඇ.ඩො.මි.324.3 වෙනුවට 2021 වර්ෂයේ දී එය ඇ.ඩො.මි. 394.3 ක් ලෙස වාර්තා වී ඇත. PSFTA යටතේ පකිස්ථානයෙන් ශ්‍රී ලංකාව සිදුකර ඇති ආනයනය 2021 වසර තුළ ඇ.ඩො.මි 62.2 ක් ලෙස සඳහන් වනවිට 2020 වසරේ දී එහි අගය ඇ.ඩො.මි53.0 ලෙසින් වාර්තා වී ඇත.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ PSFTA ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදුකළ අපනයන අතර ප්‍රධාන නිෂ්පාදන වනුයේ පොල්, බුලත් කොළ, දුම් ගසන ලද ස්වාභාවික රබර්, අන්තරවරණ පොල්, එම්ඩීඑෆ් (MDF)පුවරු, කොප්පරා, ශල්‍ය අත්වැසුම්, ක්‍රේප් රබර්, පිරිපහදු කළ රබර් ආදිය.

PSFTA යටතේ, පකිස්ථානයෙන් වාර්ෂිකව මෙට්‍රික් ටොන් 6,000 ක බාස්මති සහල් ආනයනය කිරීමට ශ්‍රී ලංකාව අවසර දී ඇත. සමාලෝචිත වර්ෂය තුළ PSFTA යටතේ ශ්‍රී ලංකාව විසින් මෙ.ටොන් 296 ක් 2021 ආනයනය කර ඇත.

පකිස්ථානය හා ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ ආර්ථික කමිටුව (JC)

පකිස්ථානය හා ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ ආර්ථික කමිටුවේ 12 වන සැසිවාරය වෙළඳ ලේකම්වරුන්ගේ මට්ටමින් 2021 පෙබරවාරි මස 3න් වන දිනමාර්ගගතඅයුරින් පැවැත්විණි. එහි දී වෙළඳාම, ආයෝජන, තොරතුරුතාක්ෂණයසහ කර්මාන්ත සහයෝගීතාවය පිළිබඳ සාකච්ඡා පැවැත්විණි. වෙළඳ සබඳතාවය තවදුරටත් ශක්තිමත් කිරීමේ සහ PSFTA යටතේදිගු කලක් පුරාවට දෙරටේ සමාගම් විසින් මුහුණ පෑමට සිදු

වී ඇති වෙළඳ සහ ආයෝජන ගැටළු විසඳීමේ අරමුණු මුල් කර ගනිමින් සාකච්ඡා පවත්වන ලදී. සැසිවාරය තුළදී ධනාත්මක ප්‍රතිඵල කිහිපයක්ම මතු වූ අතර වෙළඳාම පිළිබඳ ක්‍රියාකරී කණ්ඩායම් රැස්වීම් අතරවාරයේ දී තාක්ෂණික මට්ටමින් වැඩිදුර සාකච්ඡා පැවැත්විය යුතු බවට දෙරට විසින් එකඟ වන ලදී.

පකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර වෙළෙඳ, ආයෝජන සහ මෝටර් රථඅංශය පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම

පකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර වෙළඳ ආයෝජන, රේගු සහයෝගිතාව සහ මෝටර් රථ අංශය පිළිබඳ 2වන ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම (JWG) 2021මැයි 21වැනි දිනමාර්ගගතලෙසින් පැවැත්විණි.ශ්‍රී ලංකා දූත පිරිස වාණිජ දෙපාර්තමේන්තුවේ වැඩබලන වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙහෙයවන ලද අතර පකිස්ථාන නියෝජිත පිරිස මෙහෙයවනු ලැබුවේ පකිස්ථානයේ වාණිජ අමාත්‍යාංශයේ FT-I අංශයේ ඒකාබද්ධ ලේකම් විසිනි.

ඉහත රැස්වීම් තුනේදී සාකච්ඡා වූ ප්‍රධාන කරුණු වූයේ:

i. පකිස්ථාන පාර්ශ්වයෙන් නිෂේධන ලැයිස්තුව ඒකපාර්ශ්විකව වෙනස් කිරීම පිළිබඳ කරුණු (මෝටර් රථ කොටස්අංශයේ සහ මෝටර් රථ අමතර කොටස් නොවන නිෂ්පාදන)
ii. ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන බුලත් කොළ සඳහා කිලෝග්‍රෑම් 1කට රුපියල් 400ක නියාමන බද්දක් පැනවීම.
iii. ශ්‍රී ලංකා රේගුව විසින් රඳවා තබා ගත් පකිස්ථානයේ බාස්මතී තොගසම්බන්ධ කාරණය.
iv. වසරකට මෙට්‍රික් ටොන් 6000 ක කෝටාව යටතේ පාකිස්ථානයෙන් බාස්මතී සහල් ආනයනය කිරීම.

පකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර රේගු සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම.

අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා රේගු සම්බන්ධ කරුණු සාකච්ඡා කිරීම උදෙසා දෙරටේ රේගු අධිකාරීන් විසින් සංවිධානය කරන ලද පකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර රේගු සහයෝගීතාව පිළිබඳ 2වන ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම2021 අගෝස්තු 04 වැනි දින මාර්ගගතආකාරයෙන් පැවැත්විණි. මෙම න්‍යාය පත්‍රයට රේගු නිලධාරීන් පුහුණු කිරීම, ඉලෙක්ට්‍රොනික දත්ත හුවමාරුව, රේගු කටයුතුවලට අදාළ තොරතුරු හුවමාරුව, රේගු කරුණු පිළිබඳ දැනුම බෙදාගැනීම සහ අදාළ රේගු අධිකාරීන් විසින් PSFTA යටතේ නිකුත් කරන ලද ප්‍රභවස්ථානය පිළිබඳ සහතිකවල සත්‍යතාව තහවුරු කිරීම ඇතුළත් විය.මෙම සාකච්ඡාවන් සඳහා වාණිජ දෙපාර්තමේන්තුව ද සහභාගී විය.

III. ශ්‍රී ලංකාව හා සිංගප්පූරුව අතර නිදහස් වෙළඳ ගිවිසුම(SLSFTA)

ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)2018.01.23 දින අත්සන් කරන ලද අතර එය 2018.05.01 දින සිට බලාත්මක විය. SLSFTA ගිවිසුම මඟින් භාණ්ඩ, සේවා, ආයෝජන, බුද්ධිමය දේපළ, විදුලි සංදේශ, ඊ-වාණිජ්‍යය, වෙළඳ පහසුකම් සැපයීම, රාජ්‍ය ප්‍රසම්පාදනය, තරඟකාරිත්වය සහ ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව ආවරණය කරයි.

SLSFTA ක්‍රියාවට නැංවීමෙන් පසුව, ජන සමාජයේ විවිධ පාර්ශව විසින් ඒ පිළිබඳ විවිධ මතවාද පළ කරන ලද අතර, 2018.08.10 දින එවකට සිටි අතිගරු ජනාධිපතිවරයා විසින් SLSFTA පිළිබඳ ඇගයීමක් සිදු කිරීම සඳහා විශේෂඥ කමිටුවක් (CoE) පත් කරන ලදී.2018.11.30 දින ඉදිරිපත් කරන ලද විශේෂඥ කමිටුවාර්තාවේ නිර්දේශ මත පදනම්ව, SLSFTA අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය සංශෝධන සිදුකිරීමට පියවර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කරන ලදී.

ඉන්පසුව, එවකට සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට (MODSIT) අදාළ රාජ්‍ය ආයතන 25කින් සංශෝධන සඳහා යෝජනා 31ක් ලැබී තිබේ.අනතුරුව, 2019.10.15 දින පැවති පස් පුද්ගල (5) අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ 2 වැනි රැස්වීමේදී, පළමු වටයේ සමාලෝචන ක්‍රියාවලියේදී සලකා බැලීම සඳහා යෝජනා 18ක් අනුමත කරන ලදී.

සමාලෝචන ක්‍රියාවලියේ ප්‍රධාන භූමිකාව වාණිජ දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදී. මෙම යෝජිත සංශෝධන 18වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා කෙටුම්පතක් වෙළඳ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.ඒ අනුව, වෙළඳ අමාත්‍යාංශය විසින් 2021.01.05 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ අතර, තාක්ෂණික සහාය කමිටුවක් සැකසීමට මෙන්ම ඉහත සංශෝධන පිළිබඳ ගිවිසුමකට එළැඹීමේ අරමුණින් යුතුව සිංගප්පූරුව සමඟ සාකච්ඡා කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2021.01.18 දින හිමි විය. සමාලෝචන ක්‍රියාවලිය සුදානම් කිරීම යටතේ, නීතිපති දෙපාර්තමේන්තුව, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධයෙන් අදාළ සංශෝධන තවමත් සමාලෝචනය කෙරෙමින් පවතී. සංශෝධන සඳහා ඔවුන්ගේ ප්‍රතිචාරය කඩිනම් කළ යුතු බවට සාකච්ඡා කිරීම සඳහා 2021 දෙසැම්බර් 24 වැනි දින නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පසු විපරම් ඇමතුමක් මාර්ගගත ලෙසින් සංවිධානය කරන ලදී.ඒ සමගම, ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති SSLFTA සඳහා වෙන වෙනම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධ ඉල්ලීම් නවයක් (9) තවමත් විභාග වෙමින් පවතී.සමාලෝචන ක්‍රියාවලිය අවසන් වන තුරු, WTO වෙත SSLFTA දැනුම්දීම ද තවමත් සිදු නොකර ඇත.

IV. යෝජිත චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම(CSFTA)

චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA) පිළිබඳ සාකච්ඡා 2014 සැප්තැම්බර් 16 වැනි දින රාජ්‍ය නායක මට්ටමින් දියත් කර ඇත. මේ වන විට එහි සාකච්ඡා වට 6ක් අවසන් කර ඇත.

වාණිජ දෙපාර්තමේන්තුව මුල පිරීමක් වශයෙන්, නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ තීරුබදු නිදහස්කරණ වැඩපිළිවෙළ පිළිබඳ ශ්‍රී ලංකාවේ ස්ථාවරය සැකසීම යන මැයෙන් වෙළඳ අමාත්‍යාංශය වෙත 2021.07.01 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය CSFTA ගිවිසුමෙහි තීරුබදු නිදහස්කරණ වැඩපිළිවෙළ සඳහා මගපෙන්වීම් සොයමින් සිදුකෙරුණු 2021.07.19 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ දී සලකා බලන ලදී.කෘෂිකාර්මික හා ධීවර නිෂ්පාදන සහ කුරුඳු, ගම්මිරිස් වැනි සුළු අපනයන භෝග ඇතුළු තෝරාගත් නිෂ්පාදන කිහිපයක් පදනම් කර ගනිමින් වරණීය වෙළෙඳ ගිවිසුමක් (PTA) යටතේ සාකච්ඡා පැවැත්වීම සඳහා රාජ්‍ය අමාත්‍යවරයකුගේ මට්ටමින් සාකච්ඡා වෙනුවෙන් ප්‍රධානියෙකු පත් කළ යුතු බවට අමාත්‍ය මණ්ඩලය නියම කරන ලදී.

ඉහත නියෝගයට අනුව, ශ්‍රී ලංකාව දැනට මුහුණ දෙන ආර්ථික අභියෝග හේතුවෙන් අංක 6ක මට්ටමෙන් යුතු තීරුබදු රේඛා (අයිතම150-200) සංඛ්‍යාවකට පමණක් සීමාවන පරිදි වරණීය වෙළඳ ගිවිසුමක (PTA) කට එළඹීම සලකා බලන ලෙස ගරු වෙළෙඳ අමාත්‍යවරයා විසින් කොළඹ චීන තානාපතිවරයා වෙත ඉල්ලීමක් කරන ලදී. කෙසේ වෙතත් චීන පාර්ශවය විසින් ඔවුන් වරණීය ගිවිසුමකටඑළඹීමට එකඟ නොවන බව 2021.09.10 දින ප්‍රකාශ කරන ලද අතර විස්තීරණ ද්වීපාර්ශවීය නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා නැවත ආරම්භ කළ යුතු බවට යෝජනා කරන ලදී.

V. යෝජිත **අනෙකුත් ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම්** (FTA) **සහ වරණීය වෙළඳ ගිවිසුම්** (PTA) **පිළිබඳ තත්ත්වය**

සමාලෝචන කාලසීමාව තුළ,වාණිජ දෙපාර්තමේන්තුව විසින් දැනට අත්හිටුවා ඇති පහත දැක්වෙන යෝජිත ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ තත්ත්ව වාර්තා සකස් කර ගරු වෙළෙඳ, මුදල් සහ විදේශ අමාත්‍යවරු, ප්‍රාදේශීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍ය, ජනාධිපති ලේකම් කාර්යාලය සහ ඒ ඒ අමාත්‍යාංශවල ලේකම්වරුන් වෙත ඉදිරිපත් කර ඇත.

i. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ආර්ථික සහ තාක්ෂණ සහයෝගිතා ගිවිසුම (ECTA) සාකච්ඡා 2016 අගෝස්තු මාසයේ දී ආරම්භ කරන ලද අතර සාකච්ඡාවට 11 ක් මේ වනවිට පවත්වා ඇත. 2021 වසරේ එහි කිසිදු ප්‍රගතියක් වාර්තා වී නොමැත.

ii. ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA)
2017.06.02 දින සාකච්ඡා ආරම්භ කරන ලද අතර සාකච්ඡා වට 02 ක් නිම විය. RTA, FTA සහ PTA සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ මෑතකාලීන අමාත්‍ය මණ්ඩල තීරණ සලකා බැලීමේදී, තායිලන්තය සමඟ නිදහස් වෙළඳ ගිවිසුමක් මෙම අදියරේදී කළ ඇතිකරගත නොහැක. ඒ අනුව 2021.10.27 දින තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපතිවරයා වෙත ඒ පිළිබඳ දැනුම් දෙන ලදී.

iii. බංගලාදේශය සමඟ වරණීය වෙළඳ ගිවිසුම (BSPTA):
සාකච්ඡා සිදුවෙමින් පවතී.2021 මාර්තු 19 - 20 යන දිනවල ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යතුමාගේ බංගලාදේශ සංචාරය අතරතුර,2014 වසරේ සිට සාකච්ඡා කෙරෙමින් තිබූ දෙරට අතර ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම (FTA) කඩිනමින් නිමා කිරීම සඳහා දෙරටේ නායකයින් කැපවිය යුතු බවට යළි යළිත් අවධාරණය කර ඇත. FTA වෙත එළඹීමේ මූලික පියවර ලෙස, කෙටි නිෂ්පාදන ලැයිස්තුවකින් සමන්විතව ආරම්භ වන පරිදි ද්විපාර්ශවික වරණීය වෙළඳ ගිවිසුමකට (PTA) අත්සන් කිරීමේ හැකියාව ගවේෂණය කිරීමට නායකයින් එකඟ විය.

මෙම නායකයින්ගේ පොරොන්දුවට පසු විපරමක් ලෙස, බංගලාදේශය සහ ශ්‍රී ලංකාව අතර FTA සහ PTA සම්බන්ධව 2021 අප්‍රේල් මාසයේදී වාණිජ අධ්‍යක්ෂ ජනරාල් මට්ටමින් දෙරට අතර සාකච්ඡා ආරම්භ විය. මෙම හමුවේදී, සාකච්ඡා කර අවසන් කිරීම සඳහා ක්‍රියාසැලැස්මක් පිළිබඳව දෙපාර්ශවයම එකඟ විය. අමාත්‍ය මණ්ඩලය, 2021 ජූනි 14 වන දින පැවති රැස්වීමේදී, බංගලාදේශය සමඟින් PTA පිළිබඳ සාකච්ඡා ආරම්භ කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

PTA මගින් භාණ්ඩ වෙළඳාම පමණක් ආවරණය වන අතර මූලික රේගු බදු ඉවත් කිරීම හෝ අඩු කිරීම පමණක් සිදු කරන බවට දෙපාර්ශවයම එකඟ විය. එහි නිෂ්පාදන ආවරණය අංක 8 මට්ටමේ තීරුබදු රේඛා 100 කි.ශ්‍රී ලංකාව සහ බංගලාදේශය දැනට කලාපීය වෙළඳ ගිවිසුම් පහක එනම් SAFTA, SAPTA, APTA, GSTP සහ BIMSTEC සඳහා පාර්ශවකරුවන් වන බැවින්, BSPTA යටතේ තීරුබදු සහන හුවමාරු කිරීමේ නිෂ්පාදන මූලික වශයෙන් ඉහත ගිවිසුම් 5 හි නිශේධන ලැයිස්තුවේ ඇති නිෂ්පාදන වේ.

2021 දී (ජූනි 30, නොවැම්බර් 02 සහ දෙසැම්බර් 22) සාකච්ඡා වට තුනක් පැවැත්විණි. ජාතික වෙළඳ සාකච්ඡා කමිටුවේ (NTNC) සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් යුතු ශ්‍රී ලංකා පාර්ශවයවැඩබලන වාණිජ අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙහෙයවන ලදී.මෙම රැස්වීම් වලදී BSPTA හි රාමු ගිවිසුමේ ප්‍රධාන අංග සාකච්ඡා කරන ලද අතර වගන්ති 2ක් එනම් ප්‍රභවස්ථානනීති සහ ගෙවීම් ක්‍රමවල ශේෂය, හැර බහුතරය වෙත එකඟතාවය පල කර ඇත. තීරු බදු අඩු කිරීමේ ක්‍රමවේදය පිළිබඳව ද මෙම රැස්වීම්වලදී සාකච්ඡා කෙරිණි.

NTNC විසින් වාණිජ දෙපාර්තමේන්තුව (DOC), මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව, අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සහ ආයෝජන මණ්ඩලය (BOI) ඇතුළත් කුඩා කණ්ඩායමක් පත් කර ශ්‍රී ලංකාවේ ඉල්ලීම් ලැයිස්තුව සකස් කිරීමේ කාර්යය පැවරීය. පාර්ශ්වකරුවන්ගේ උපදේශනයන්ගෙන් පසුව, කණ්ඩායම විසින් නිෂ්පාදන 112ක් සහිත ලැයිස්තුවක් සකස් කරන ලදී. බංගලාදේශ පාර්ශවය විසින් නිෂ්පාදන 131ක ඉල්ලීම් ලැයිස්තුවක් ශ්‍රී ලංකාවට ලබා දෙන ලදී. මේ වන විට දෙපාර්ශවය විසින්ම BSPTA යටතේ ලබා දීමට නියමිත තීරු බදු සහන සඳහා අදාළ ලැයිස්තු ඇගයීමට ලක් කරමින් සහ පිරිනැමීම් ලැයිස්තු සකස් කරමින් සිටී. මේ සම්බන්ධයෙන් මේ වන විට රේඛීය අමාත්‍යාංශ සමඟ රැස්වීම් 02ක් පවත්වා ඇත.

iv. ජපානය සමඟ වරණීය වෙළඳ ගිවිසුම (PTA)

ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල ප්‍රධානීන් සමඟ මුදල් අමාත්‍යාතුමා විසින් 2021.10.12 දින පැවැත් වූ රැස්වීමේ දී ශ්‍රී ලංකාව සමඟ වරණීය වෙළඳ ගිවිසුමකට එළඹීම පිළිබඳ ජපාන පාර්ශ්වයේ අදහස පිළිබඳව ප්‍රතිචාර ටෝකියෝ හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙන් ලබා ගන්නා ලෙස විදේශ අමාත්‍යාංශයෙන් 2021.11.15 දින ඉල්ලා සිටින ලදී.ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ජපාන විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා හමුවී සාකච්ඡාවක් ඉල්ලා ඇති බවත් ඒ පිළිබඳව සාකච්ඡා කිරීම 2022 ජනවාරි මස මුලදී සිදු කරන බවත් 2021.12.01 දින ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශය දැනුම් දෙන ලදී.

v. ඉන්දුනීසියාව සමඟ වරණීය වෙළඳ ගිවිසුම(PTA)

ශ්‍රී ලංකාව පැරා තීරුබදු ලෙස සැලකෙන බදු වර්ග 2ක එනම් වරාය සහ ගුවන් තොටුපොළ ගාස්තු (PAL) සහ භාණ්ඩ අපනයන සහනාධාර යෝජනා ක්‍රමය (CESS) යන බදු නොව , ආනයන තීරුබදු (CID) පමණක් අඩු කිරීමට හෝ ඉවත් කිරීමට පමණක් සූදානම් බැවින් ඉන්දුනීසියානු පාර්ශවය තීරුබදු ලිහිල් කිරීමේ වැඩසටහනකට එකඟ වන්නේ ආනයන තීරුබදු (CID) මත පමණක්ද යන්න තහවුරු කර ගන්නා ලෙස විදේශ අමාත්‍යාංශයට 2021.11.16 දින දැනුම් දී ඇත.

ආනයනය සඳහා අය කෙරෙන බදු 3ම ඉවත් කරන ලෙස හෝ කපා හරින ලෙස ඉන්දුනීසියාව ශ්‍රී ලංකාවෙන් ඉල්ලා සිටියහොත් ශ්‍රී ලංකාවට එයට එකඟ වීමට මේ අවස්ථාවේ දී හැකියාවක් නොමැති බවත් පසුව PTA යෝජනාව නැවත සලකා බැලීමට සිදු විය හැකි බව ඉන්දුනීසියාවේ වෙළඳ අමාත්‍යාංශයට දැනුම් දෙන ලෙස ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශය විසින් ජකර්තා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත දැනුම් දෙන ලදී.

vi. කෙන්යාව සමඟ වරණීය වෙළඳ ගිවිසුම(PTA)

කෙන්යානු රජය ශ්‍රී ලංකාව සමඟ වරණීය වෙළඳ ගිවිසුමසම්පූර්ණ කර නිම කිරීමට කැමති දැයි සොයා බලන ලෙස වාණිජ දෙපාර්තමේන්තුව විසින් 2021.11.16 දින විදේශ අමාත්‍යාංශයට දැනුම් දෙන ලදී.

vii. ඊජිප්තුව සමඟ වරණීය වෙළඳ ගිවිසුම(PTA)

ශ්‍රී ලංකාවෙන් වරණීය වෙළඳපල ප්‍රවේශය අපේක්ෂා කරන ඊජිප්තුවේ පළතුරු ශ්‍රී ලංකාව තුළ නිරෝධායනය තහනමට යටත්ව තිබේද යන්න තහවුරු කර ගැනීම සහ ආනයන බදු සහ අපේක්ෂිත ආදායම් අලාභය ඇස්තමේන්තු කිරීම පිණිස HS කේත සහිතව ඊජිප්තු පළතුරු ලැයිස්තුවක් ලබා ගන්නා ලෙසට වාණිජ දෙපාර්තමේන්තුව විසින් 2021.09.03දින විදේශ අමාත්‍යාංශයට දැනුම් දෙන ලදී .

viii. ඉරානය සමඟ වරණීය වෙළඳ ගිවිසුම(PTA)

ශ්‍රී ලංකාව ඉරානයේ නිෂ්පාදන 123ක් (ආරම්භයේදී භාණ්ඩ 211ක්) සඳහා අර්ධ තීරුබදු සහන ලබා දීමට එකඟ වූ අතර ඉරානය ශ්‍රී ලංකාවේ නිෂ්පාදන 150ක් සඳහා (ආරම්භයේ දී අයිතම 288ක්) අර්ධ තීරු බදු සහන ලබා දීමට එකඟ විය. 2016 පෙබරවාරි මස පැවති 11 වැනි ද්විපාර්ශ්වික ඒකාබද්ධ කමිටුවේ දී, අපනයනය සඳහා දෙපාර්ශවයේම උනන්දුවක් දක්වන තවත් නිෂ්පාදන කිහිපයක් ඇතුළත් කිරීම සඳහා සහ නව පිරිනැමීම් ලැයිස්තු කඩිනමින් නැවත ඉදිරිපත් කිරීම සඳහා ඔවුන්ගේ පිරිනැමීම් ලැයිස්තු සමාලෝචනය කිරීමට දෙපාර්ශවයම එකඟ විය. කෙසේ වෙතත්, ඉරානයට එරෙහිව එක්සත් ජනපදය විසින් දැමූ සම්බාධක හේතුවෙන් PTA පිළිබඳ කිසිදු ප්‍රගතියක් ඉන් පසුව සිදු වී නොමැත.

ix. මාලදිවයින සමඟ නිදහස් වෙළඳ ගිවිසුම (FTA)

ශ්‍රී ලංකා මාලදිවයින මහ කොමසාරිස්වරයා සමඟින් ගරු වෙළඳ අමාත්‍යතුමාගේ කෙටි ඇමතුම් සාකච්ඡාවේදී ඔහු විසින් ශ්‍රී ලංකාව සමඟ නිදහස් වෙළඳ ගිවිසුමකට එළඹීය යුතු බවට යෝජනා කළේය.ඊට ප්‍රතිචාර වශයෙන්, දෙපාර්ශවය අතර විෂය පථය පිළිබඳ සැසියක් ආරම්භ කිරීම සඳහා, ශ්‍රී ලංකාව සමඟ නිදහස් වෙළඳ ගිවිසුමකට එළැඹීමට රාජ්‍ය තාන්ත්‍රික මාර්ග හරහා මාලදිවයින් රජයේ කැමැත්ත ලැබීම පිළිබඳ ශ්‍රී ලංකාව සතුටු වන බව 2021.11.12 දින, ශ්‍රී ලංකාවේ මාලදිවයිනේ මහ කොමසාරිස්වරයාට දන්වා සිටින ලදී. විභවීය නිදහස් වෙළඳ ගිවිසුමට අදාළ විෂය පථය පිළිබඳව මාලදිවයිනේ අදාළ බලධාරීන් සමඟින් සාකච්ඡා කරන බව ශ්‍රී ලංකාවේ මාලදිවයිනේ මහ කොමසාරිස් විසින් 2021.11.23 වන දින දන්වා ඇත.

VI.ශ්‍රී ලංකාව හා යුරෝපා සංගමය අතර වෙළඳ සබඳතා

අ. ද්විපාර්ශවික වෙළඳ සබඳතා

ශ්‍රී ලංකාව දශක ගණනාවක් පුරා යුරෝපා සංගමය සමඟ වෙළෙඳ සබඳතා පවත්වයි. 2019 දී, ඇ.ඩො. බිලියන 3.5 ක් වන ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන ගමනාන්තය යුරෝපා සංගමය වූ අතර එය රටේ මුළු අපනයන ආදායමෙන් 1/3 කට ආසන්න විය. කෙසේ වෙතත්, යුරෝපා සංගමයෙන් බ්‍රිතාන්‍ය 2020.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත්වීම (BREXIT) හේතුවෙන් 2020 වර්ෂය තුළ යුරෝපා සංගමය වෙත කෙරෙන ශ්‍රී ලාංකීය අපනයන ඇ.ඩො.බි. 2.3 කින් පහත වැටී අති අතර 23% ක කොටසක් ගන්නා එක්සත් ජනපදය (ඇ.ඩො.බි. 2.5) ට පසු ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම අපනයන වෙළඳපොළ යුරෝපා සංගමය බවට පත්විය.

ශ්‍රී ලංකාවෙන් යුරෝපා සංගමය වෙත අපනයනය කෙරෙන ප්‍රමුඛතම අයිතමය ඇඟළුම් වේ. යුරෝපා සංගමය වෙත අපනයනය කෙරෙන අනෙකුත් ප්‍රධාන නිෂ්පාදන අතර වායවටයර්, තේ, දුම්කොළ, පොල් ආශ්‍රිත නිෂ්පාදන, මත්ස්‍ය නිෂ්පාදන ආදිය වේ. ඖෂධ නිෂ්පාදන, යන්ත්‍ර, රෙදිපිළි සහ නූල්, කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන ආදිය යුරෝපා සංගමයෙන් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන වේ. 2020 වසරට පෙර යුරෝපා සංගමයෙන් ආනයනය කෙරුණු ප්‍රධානතම අයිතමයමෝටර් රථ වාහන විය. කෙසේ වුවත්, ශ්‍රී ලංකාවට වාහන ආනයනය කිරීම තාවකාලිකව සීමා කර ඇති බැවින් එහි ආනයන පහත වැටී ඇත.

ආ.යුරෝපා සංගමයේ GSP + (EU GSP)සහන සහ එහි උපයෝජනය

ශ්‍රී ලංකාව විසින් 1971 සිට 2005 දක්වා යුරෝපා සංගමයේ සම්මත GSP යෝජනා ක්‍රමය භාවිතා කරන ලදී.මූලික මානව හිමිකම්, කම්කරු අයිතිවාසිකම් සහ අනෙකුත් තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතීන්27,ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ නීත්‍ය අධීක්ෂණය සහයෝගීතාව ව්‍යාප්ත කිරීම මත යුරෝපා සංගමය විසින් ආර්ථික වශයෙන් අවදානමට ලක්වන සංවර්ධනය වෙමින් පවතින රටවලට සහාය වීම සඳහා ලබා දී ඇති GSP+ පහසුකම 2005 දී ශ්‍රී ලංකාව වෙත පිරිනමා ඇත. 2010 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකාවට යුරෝපා සංගමයේ GSP +අහිමි වූ අතර එතැන් සිට 2017 මැයි දක්වා ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට සිදු කරන අපනයන සඳහා සම්මත GSP යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීය. ශ්‍රී ලංකාව 2017 මැයි 19 වන දින GSP+ නැවත ලබා ගැනීමට සමත් විය.

ආරම්භයේ සිටම, යුරෝපා සංගමයේ GSP යෝජනා ක්‍රමය, ශ්‍රී ලංකාව යුරෝපා සංගමය වෙත කරන සමස්ත අපනයන වැඩි දියුණු කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.වසර ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ අපනයනයන් විවිධාංගීකරණය කිරීමට GSP සහන උපකාරී විය.

ලෝක බැංකුවේ දළ ජාතික ආදායම් (GNI) ගණනය කිරීම්වලට අනුව 2018 දී ශ්‍රී ලංකාව ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් බවට පත් වූ නමුත් 2020 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද GNI දත්තවලට අනුව ශ්‍රී ලංකාව 2019 දී නැවතත් පහළ-මධ්‍යම ආදායම් ලබන රටක් බවට පත්විය.

2010 දී ශ්‍රී ලංකාවේ GSP + උපයෝගීතා අනුපාතය 73% ක් වූ අතර එය වසරක් තුළ වාර්තා වූ ඉහළම ප්‍රතිශතයයි. 2010 අගෝස්තු සිට 2017 දක්වා GSP යටතේ යුරෝපා සංගමයට සිදු කරන ලද ශ්‍රී ලංකාවේ අපනයන යුරෝ 2.1 බිලියන සිට යුරෝ 2.6 දක්වා ඉහළ ගොස් ඇති අතර, GSP උපයෝගීතා අනුපාතය 2011 දී 66% සිට 2017 දී 55% දක්වා අඩු වූ නමුත් 2018 දී 58% සිට 2019 දී 63% දක්වා වැඩි වී ඇත.

2011 සිට 2017 දක්වා කාලය තුළ අපනයන, 2013 හැර, සාමාන්‍යයෙන් ඉහළ ගොස් ඇති අතර, උපයෝගීතා අනුපාතය පහත වැටී ඇත. සාමාන්‍යයෙන් නිරීක්ෂණය වී ඇත්තේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, වැඩි දියුණු කරන ලද GSP සහන සහ 1990 සිට 2010 දක්වා දශකය තුළ ශ්‍රී ලංකාව යුරෝපා සංගමයට සිදු කළ අපනයනවල වර්ධනය අතර ධනාත්මක සහසම්බන්ධයක් ඇති බවය.මෙම ධනාත්මක සහසම්බන්ධය 2017 දී GSP + නැවත ලබා ගැනීමෙන් පසුවද අඛණ්ඩව පවතී.

GSP+ යටතේ, නිෂ්පාදන 7,000 කට වඩා ශුන්‍ය තීරුබදු මට්ටමක පැවතුනද, පහත වගුවේ දක්වා ඇති පරිදි මෑත කාලීන ක්ෂේත්‍ර අනුව GSP + උපයෝගීතාවය බැලූ කල GSP+ යටතේ ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන අංශ කිහිපයක් කෙරෙහි පමණක්වැඩියෙන් සංකේන්ද්‍රණය වී ඇති බව දක්නට ලැබේ. ඇඟලුම් ක්ෂේත්‍රයේ පහළ උපයෝගීතාවය සඳහා හේතුව වන්නේ දැඩි ප්‍රභවස්ථාන නීතීන්වලට (ROOs) අනුකූල වීමේ පිරිවැය තීරුබදු සහනවලින් ලැබෙන ප්‍රතිලාභයට වඩා බෙහෙවින් වැඩි වීමයි.

නිෂ්පාදන අංශය	**උපයෝගීතා අනුපාතය (2019)**	**සටහන්**
පරිච්ඡේදය 61 සහ 62-ඇඟලුම්	51.75%	දැඩි ප්‍රභවස්ථාන නීති (ROO) යටතේ නූල් සිට රෙදි දක්වාද රෙදි සිට ඇඟළුම් දක්වා ද ද දෙවරක් පරිණාමනය කළ යුතු වීම.
රබර් නිෂ්පාදන	96.38%	බොහෝ දුරට "අගය එකතු කළ" ROO සහිත "එම රටෙන්ම පමණක් ලබාගන්න අමුද්‍රව්‍යන්ගෙන් පමණක් නිෂ්පාදිත" ROO
මාළු නිෂ්පාදන	99.48%	"එම රටෙන්ම පමණක් ලබාගන්න අමුද්‍රව්‍යන්ගෙන් පමණක් නිෂ්පාදිත" ROO
ආහාරයට ගතහැකි සැකසූ	96.92%	"එම රටෙන්ම පමණක් ලබාගන්න අමුද්‍රව්‍යන්ගෙන් පමණක් නිෂ්පාදිත" ROO
බයිසිකල්	96.32%	බොහෝ දුරට "අගය එකතු කළ"ROO
ඇඟලුම් උපාංග	77.58%	61 වන සහ 62 වන පරිච්ඡේදවල ඇඟලුම්වලට වඩා සාපේක්ෂව දැඩි බව මදක් අඩු ROO
උපකරණ සහ කොටස්	41.28%	බොහෝ දුරට "අගය එකතු කළ"ROO
සෙල්ලම් බඩු	86.94%	"එම රටෙන්ම පමණක් ලබාගන්න අමුද්‍රව්‍යන්ගෙන් පමණක් නිෂ්පාදිත" ROOසහ "අගය එකතු කළ"ROO දෙකම
හිස් ආවරණ කොටස්	87.04%	බොහෝ දුරට "අගය එකතු කළ"ROO
තේ සහ කුළුබඩු	73.99%	බොහෝ දුරට "එම රටෙන්ම පමණක් ලබාගන්න අමුද්‍රව්‍යන්ගෙන් පමණක් නිෂ්පාදිත" ROO
සාමාන්‍ය උපයෝජනය	63%	2018 දී 58%කින් වැඩි විය

GSP + සහනය ලබා ගැනීමේ අරමුණ වන්නේ යුරෝපා සංගමයේ සාමාජික රටවලට සිදු කරන ශ්‍රී ලංකාවේ සමස්ත අපනයනය වැඩි දියුණු කිරීමයි. යුරෝපා සංගමය වෙත රටක් විසින් සිදු කරන අපනයනය වර්ධනය වන අවස්ථාවක දී්ර්ඝ සමානවම GSP ක්‍රමය උපයෝජනය අඩු වනු ඇත.එයින් ඇඟවෙන්නේ රටක අපනයනය GSP+ මත දැඩි ලෙස රඳා නොපවතින බවයි. GSP+ තීරුබදු සහනය නොමැතිව ශ්‍රී ලංකාවේ අපනයනයන්ට තරහ කළ හැකි වීම හිතකර වර්ධනයක් වේ.

ඇ.යුරෝපා සංගමයේ සෞඛ්‍ය සහ ස්වස්ථතා (SPS) සහ වෙළඳාම සඳහා තාක්ෂණික බාධා (TBT)

ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අනුකූල නොවන ඇඟවීම් (ආහාර සහ පෝෂණය පිළිබඳ සීඝ්‍ර අනතුරු ඇඟවීමේ පද්ධතිය- RASFF) සහ ශාක ආශ්‍රිත නිෂ්පාදන තොග පිළිබඳ අනුකූලනොවන බවට වූ නිවේදන (ශාක සෞඛ්‍යය සඳහා යුරෝපීය ශාක ස්වස්ථතා පිළිබඳ සීඝ්‍ර ඇඟවීම් පද්ධතිය- EUROPHYT):

ආහාර සහ පෝෂණය පිළිබඳ සීඝ්‍ර අනතුරු ඇඟවීමේ පද්ධතිය යනු යුරෝපා සංගමය (EU) තුල ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ගැටළු වාර්තා කරන ක්‍රමයකි. යුරෝපා සංගමය වෙතින් RASFF නිවේදන ලබා ගැනීමට සහ ප්‍රතිචාර දැක්වීමට වගකිවයුතු ආයතන ලෙස ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන කිහිපයක් හඳුනාගෙන ඇත.

2021 වසර තුළ යුරෝපා සංගමයෙන් දැනුම් දුන් රටෙහිවෙළඳපොළ තුළ හෝ යුරෝපා සංගමයේ අසල්වැසි රටක යුරෝපා සංගමයට ඇතුල්වන සීමාවේ රඳවා තබා ඇති බිස්කට්, සහල්, බුලත් කොළ, මිරිස්, ශීත කළ මාළු සහ ඖෂධ පැළැටි ආදී ආහාර, පෝෂණය හෝ ආහාරමය ද්‍රව්‍ය අයිතිමයන්ගේ අවදානම් සහිත බවට හඳුනා ගත් අනුකූල නොවන ඇඟවීම් 40ට වඩා වාර්තාවිය.

EU වෙතින් ලැබෙන EUROPHYT ඇඟවීම් ලබා ගැනීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට අදාළ රජයේ අධිකාරිය ලෙස ශ්‍රී ලංකා ජාතික ශාක නිරෝධායන සේවාව (NPQS) හඳුනාගෙන ඇත. EUROPHYT යටතේ පැලැටි මත පදනම් වූ තොග සඳහා අනුකූල නොවන ඇඟවීම් සංඛ්‍යාවක්2021 දී ලැබී ඇත.

ලෝක වෙළඳ සංවිධානයේ අනෙකුත් බහුපාර්ශවික නීති මෙන්ම ආහාර සුරක්ෂිතතාව පිළිබඳ නීති ක්‍රියාත්මක කරන ප්‍රධාන ජාතික ආයතනය වන වාණිජ දෙපාර්තමේන්තුව වෙත ප්‍රධාන වශයෙන් යුරෝපා සංගම් සාමාජික රටවල් මෙන්ම කැනඩාව, ජපානය, එක්සත් ජනපදය, මැද පෙරදිග, ආදි රටවල්වලින් ශ්‍රී ලංකාවේ ආහාර අපනයනයේ ඉහත සඳහන් අනුකූල නොවන ඇඟවීම් සහ දැනුම්දීම් ලැබෙයි.මෙම සිදුවීම ශ්‍රී ලංකාවෙහි ආහාර අපනයනය කිරීම ප්‍රවර්ධනයෙහි ලා බාධාවක් බවට පත් වී ඇත. එබැවින්, EU වෙත අපනයනය කරන භාණ්ඩ සඳහා ප්‍රතික්ෂේප කිරීම් සහ ඇඟවීම් සංඛ්‍යාව අවම බව සහතික කිරීම සඳහා, වාණිජ දෙපාර්තමේන්තුව ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟින් පසු විපරම් කටයුතු සිදු කරයි.තවද, බ්‍රසල්ස් හි ශ්‍රී ලංකා දූත මණ්ඩලය මඟින් ලැබෙන්නා වූ ආහාර සහ ශාක පදනම් කරගත් නිෂ්පාදන අපනයනයට අදාළ යුරෝපා සංගමයේ ප්‍රමිතීන් සහ රෙගුලාසි පිළිබඳ තොරතුරු, ශ්‍රී ලංකාවේ පාර්ශවකරුවන්ගේ ආයතන සහ ව්‍යාපාර සමඟ වාණිජ දෙපාර්තමේන්තුව විසින් වරින් වර ලබා දෙනු ලබයි.

2021 පෙබරවාරි මාසයේදී, ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය (SLFPA) සමඟ සමීප සහයෝගයෙන් ක්‍රියා කරන ශ්‍රී ලංකා ආහාර විද්‍යා හා තාක්ෂණ ආයතනය (IFSTSL) සමඟ සම්බන්ධීකරණයෙන් වාණිජ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ ආහාර ලෝකය පුරා අපනයනය කිරීමේදී අනුකූල නොවීම් වළක්වා ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කර ඇත.ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ජාත්‍යන්තර විශේෂඥයකු සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු මහාචාර්යවරයකු වන සම්මානනීය මහාචාර්ය උපාලි සමරජීව මහතා ශ්‍රී ලංකාවේ ආහාර අපනයනයේ අනුකූලතාවය නොමැති වීම් පිළිබඳ සියලු ඇඟවීම් සහ දැනුම්දීම් පිළිබඳ අධ්‍යනය කර, ශ්‍රී ලංකාවේ ආහාර අපනයනයේදී අනුකූල නොවීමට බලපාන මූලික හේතුව හඳුනාගෙන ඒ පිළිබඳව සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක් සකස් කර ඇත.

තවද, ශ්‍රී ලංකා පාර්ශවකරුවන් සහ DG SANTE (EU හි ආහාර පරීක්ෂණ අධිකාරිය) නිලධාරීන් අතර සත්ත්ව සම්භවයක් නොමැති ආහාර සඳහා යුරෝපා සංගමයේ ආනයන රෙගුලාසි පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් හා සමඟින් වීඩියෝ ඇමතුම් සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම සඳහා බ්‍රසල්ස් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට වාණිජ දෙපාර්තමේන්තුව සහය ලබා දී ඇත.

යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ආයෝජක සංවාදයේ මීළඟ සැසිවාරය පැවැත්වීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කරමින් සිටින අතර බොහෝ විට එම සැසිවාරය 2022 ජනවාරි මාසයේදී පැවැත්වීමට නියමිතය.

ඇ. සාධාරණ වෙළඳාම සංවර්ධනය පිළිබඳ සහයෝගීතා රාමුව*(FoC)*

මෙම විෂය පිළිබඳ මුලින් කටයුතු කරන ලද්දේ වාණිජ දෙපාර්තමේන්තුවයි. කෙසේ වෙතත්, FOC කෙටුම්පතේ නියමයන් නැවත සලකා බැලීමෙන් අනතුරුව, සාධාරණ වෙළඳ ප්‍රඥප්තිය සහ සහතික කිරීමේ ක්‍රියාවලිය යනාදිය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීමෙන්, අපනයන වෙළෙඳපොළ සඳහා ශ්‍රී ලංකාවේ කාබනික උප අංශයට සමාන උප අංශයක් සංවර්ධනය කිරීමට අදාලවන සාධාරණ වෙළඳාමට අදාළ කාර්යයන් වාණිජ දෙපාර්තමේන්තුවෙහි කාර්යය විෂය පථයට අයත් නොවන බව දෙපාර්තමේන්තුව නිරීක්ෂණය කර තිබේ.එබැවින් යෝජිත සහයෝගීතා රාමුව (FOC) සඳහා අත්සන් තැබීමට ඇති නොහැකියාව පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් බ්‍රසල්ස්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලයට දැනුම් දෙන ලදී.

පසුව අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) මෙම කාර්යය මෙහෙයවීමට එකඟ විය. වාණිජ දෙපාර්තමේන්තුව FOC සඳහා සහය ලබා දෙන ආයතනයක් ලෙස පවතී.

ඉ. යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකාවේ වෙළඳාම ආශ්‍රිත සහයෝගීතා ව්‍යාපෘතිය

යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටුවේ18 වැනි සැසිවාරයට සමගාමීව 2013 දෙසැම්බර් 02 වැනි දින බ්‍රසල්ස් නුවරදී පැවැත්වුණු වෙළෙඳ හා ආර්ථික සබඳතා පිළිබඳ යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායමට කරන ලද යෝජනාවට අනුව යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකාවේ වෙළඳාම ආශ්‍රිත සහයෝගීතා ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ අපනයන අංශය පහත සඳහන් ක්ෂේත්‍ර තුළින් සංවර්ධනය කිරීමට සහාය ලබා දෙමින් විශේෂයෙන් ආහාර, කුළුබඩු සහ තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාරික ක්‍රියාවලි සඳහා භාහිර සේවය ලබා ගැනීම (BPO) පිළිබඳක්ෂේත්‍රයේ සමස්ත කාර්ය සාධනය ඉහළ නැංවීම කෙරෙහි ව්‍යාපෘතිය අවධානය යොමු කර ඇත.

- ව්‍යාපාර සහ වෙළඳ ප්‍රතිපත්තිය
- වෙළඳාම් පහසුකරණය
- ගුණාත්මක ප්‍රමිතීන්ට අනුකූල වීම සහ සෞඛ්‍ය හා ස්වස්ථතා (SPS) පියවරයන්
- ආංශිකව නිශ්චිත වූ අගය දාම සංවර්ධනය සහ සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර (SME) කලාපීය සහ ගෝලීය අගය දාමයන් වෙත ඒකාබද්ධ කිරීම.

මෙම ව්‍යාපෘතිය සඳහා යුරෝපා සංගමය යුරෝ මිලියන 8ක් වටිනාකමෙන් යුතු අරමුදල් සම්පාදනය කර ඇති අතර ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) ක්‍රියාත්මක කිරීමේ නියෝජිතයා ලෙස ක්‍රියා කරන අතරම වාණිජ දෙපාර්තමේන්තුව ව්‍යාපෘතියේ ජාතික සම්බන්ධීකාරක ලෙස කටයුතු කරයි.වසර 4ක් පුරා ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා , තානාපති, නියෝජිත ප්‍රධානියා සහ ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා යුරෝපා සංගමයේ නියෝජිත කණ්ඩායම යන අයගේ සහභාගීත්වයෙන් 2016 නොවැම්බර් 15 වැනි දින ආරම්භ කරන ලද අතර ව්‍යාපෘතිය 2021 පෙබරවාරි මාසයේදී නිම කරන ලදී.

ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලබන ප්‍රධාන වර්ධනයන් කිහිපයක් නම්;

- ජාතික අපනයන ක්‍රමෝපාය (NES) දියත් කිරීම,
- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් GSP+ මාර්ගෝපදේශ පොත ප්‍රකාශයට පත් කිරීම,
- වෙළඳ ප්‍රතිපත්තිය, වෙළඳ සාකච්ඡා, නිදහස් වෙළඳ ගිවිසුම්, වෙළඳ පිළියම්, සෞඛ්‍ය හා ස්වස්ථතා ගැටළු ආදිය සම්බන්ධ විවිධ සම්මන්ත්‍රණ / පුහුණු / වැඩමුළු පැවැත්වීම.

- ජාතික තත්ත්ව යටිතල පහසුකම් උපායමාර්ගය සහ ජාතික ඇසුරුම් පරීක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සහ
- ලංකා කුරුඳු ආදිය සඳහා භූගෝලීය දර්ශකය (GI) ලබා ගැනීමට සහාය වීම

ඊ. යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකා වෙළඳ සහ ආර්ථික සබඳතා සහයෝගීතාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ මීළඟ සැසිවාරය(WGTEC)

යුරෝපා සංගම්-ශ්‍රී ලංකා වෙළඳ සහ ආර්ථික සබඳතා සහයෝගීතාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ පසුගිය සැසිවාරය 2019 ඔක්තෝබර් මස 24 දින පවත්වන ලදී. එහි මීළඟ සැසිවාරය 2022 ජනවාරි මස 26 වන දින මාර්ගගත අයුරින් පැවැත්වීමට නියමිතව ඇත. වාණිජ දෙපාර්තමේන්තුව, රැස්වීම සංවිධානය කිරීමේ ප්‍රධාන කේන්ද්‍රස්ථානය ලෙස පසුවිපරම් ක්‍රියාමාර්ග ගෙන ශ්‍රී ලංකා පාර්ශවකරුවන්ගේ ආයතන සමඟ සාකච්ඡා කර මීළඟ සැසියේ න්‍යාය පත්‍රය සඳහා යෝජනාව සකස් කරන ලදී.

i. ඉන්දුනීසියාවෙන් ප්‍රභවය වූ අමුද්‍රව්‍ය භාවිතයෙන් යුරෝපා සංගමයේ GSP යටතේ අපනයනය කරන ශ්‍රී ලංකාවේ රෙදිපිළි නිෂ්පාදන සඳහා කලාප අතර සමුච්චයන (Cross- Regional Cumulation) පහසුකම: ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියා රජයේ අදාළ බලධාරීන් විසින් අත්සන් කරන ලද ඒකාබද්ධ ඉල්ලීමක් යුරෝපා කොමිසම වෙත ඉදිරිපත් කරන ලදී. EU පාර්ශවයේ සම සභාපතිවරයා ප්‍රකාශ කළේ 2022 ජනවාරි මස පැවැත්වීමට නියමිත යුරෝපා සංගම්- ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසමේ 23 වන සැසිවාරයේදී ඒකාබද්ධ ඉල්ලීම පිළිබඳ EU තීරණය ඉක්මනින් දැනුම් දෙන බවයි.

ii. EUවෙත අපනයනය කිරීමට නිපදවන නිෂ්පාදන සඳහා එක්සත් රාජධානියෙන් ලබාගත් අමුද්‍රව්‍ය වෙනුවෙන් විස්තීරණ සමුච්චයනපහසුකම: 2020.01.01 දින එක්සත් රාජධානිය EU (BREXIT) හැර යාමත් සමඟ සහ සංක්‍රාන්ති කාලපරිච්ඡේදයෙන් පසුව, EUGSP+ ප්‍රතිලාභීන් විසින් EU වෙත අපනයනය කිරීම සඳහා නිෂ්පාදනය කර ඇති නිෂ්පාදන සඳහා භාවිතා කරන සමුච්චිත පහසුකම යටතේ එක්සත් රාජධානියේ අමුද්‍රව්‍යවල වටිනාකම EUවිසින් 2021.01.01 සිට බලපැවැත්වෙන පරිදි පිළි නොගනී. යුරෝපා සංගම් වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් ඇඟලුම් නිෂ්පාදනය සඳහා එක්සත් රාජධානියෙන් රෙදි වර්ග ආනයනය කරනු ලැබූ ශ්‍රී ලාංකීය ඇඟලුම් අපනයනකරුවන්ට ඉහත තීරණය හේතුවෙන් අහිතකර බලපෑම් එල්ල වී ඇත. ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදය (JAAF) සහ වාණිජ දෙපාර්තමේන්තුව එක්සත් රාජධානියෙන් ආනයනය කරන ලද රෙදි සඳහා EU වෙතින් දීර්ඝ සමුච්චිත පහසුකම සඳහා යෝජනාවක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී.එක්සත් රාජධානියේ පාර්ශවය විසින් සිය සංවිධානාත්මක සහයෝගීතාවය මේ සඳහා ලබා දෙන බවට වාචිකව ප්‍රකාශ කර ඇත.වාණිජ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඔස්සේ එම යෝජනාව සඳහා එක්සත් රාජධානියේ සංවිධානාත්මක සහය ඉල්ලා සිටීමට අපේක්ෂා කරන අතර එක්සත් රාජධානියේ කැමැත්ත ඇතිව වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීම පිළිබඳ සලකා බැලීම සඳහා යුරෝපා සංගමය වෙත ඉදිරිපත් කරනු ඇත.

VII. එක්සත් රාජධානිය යුරෝපා සංගමයෙන් ඉවත් වීම (BREXIT), එකසත් රාජධානියේ GSP (UK GSP) යෝජනා ක්‍රමය සහ මහජන උපදේශන

2020.02.01 දින සිට බලපැවැත්වෙන පරිදි එක්සත් රාජධානිය නිල වශයෙන් යුරෝපා සංගමයෙන් (EU) ඉවත් වූ අතර, එම ක්‍රියාවලිය BREXIT නම් විය. එතැන් සිට 2020.12.31 වන දින දක්වා ශ්‍රී ලංකාව ඇතුළු යුරෝපා සංගමයේ GSP ප්‍රතිලාභීන්ගේ රටවලට එක්සත් රාජධානියේ GSP යටතේ එම ප්‍රතිලාභය ලබා ගැනීමට හිමිකම ලබා දී ඇත.මේ අතර, එක්සත් රාජධානියේ ජාත්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව (DIT) විසින් 2020.02.06 සිට 2020.03.05 දක්වා කාලය තුළ එක්සත් ජනපද ගෝලීය තීරුබදු නමින් ඔවුන්ගේ

යෝජිත නව තීරුබදු ක්‍රමය පිළිබඳ පාර්ශ්වකරුවන් සහ සාමාන්‍ය ජනතාවට අදහස් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත මහජන උපදේශනයක් විවෘත කරන ලදී.

ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුවඇඟලුම්, තේ, රබර්, කුළුබඩු, සහ පොල්, ධීවර නිෂ්පාදන, පිඟන් මැටි, ආහාර සැකසුම්, පාන වර්ග සහ විවිධ නිෂ්පාදන ක්ෂේත්‍රයන්ගේ උපදේශන ඇතුළුව රජයේ සහ පෞද්ගලික අංශයේ උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව කරුණු ඉදිරිපත් කරන ලදී.මෙම මාර්ගගත මහජන උපදේශනවලින් ලැබුණු ප්‍රතිචාර සමාලෝචනය කිරීමෙන් පසුව, DIT විසින් EU හි පොදු විදේශීය තීරුබදු යෝජනා ක්‍රමය ප්‍රතිස්ථාපනය කරමින් 2021.01.01 දින සිට ක්‍රියාත්මක කරන ලද එහි සංශෝධිත එක්සත් රාජධානියේ ගෝලීය ගාස්තු 2020.05.19 දින ප්‍රකාශයට පත් කර ඇත. EU GSP+ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභියෙකු ලෙස ශ්‍රී ලංකාව, 2021 ජනවාරි 1 සිට EU GSP+ මඟින් ලද සමාන වරණීය ප්‍රතිලාභ එක්සත් රාජධානියේ වෙළඳපොළ තුළින්ද අඛණ්ඩව ලබා ගැනීමට හැකි වී ඇත. ඒ අනුව, එක්සත් රාජධානියේ අපනයන මූල්‍ය(EF)යටතේ පවතින ශුන්‍ය තීරුබදු සහන ප්‍රයෝජනයට ගැනීම සඳහා එක්සත් රාජධානිය වෙත අපනයනය කරන ශ්‍රී ලාංකීය අපනයන කරුවන් සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් තොරතුරු සහ තාක්ෂණික මාර්ගෝපදේශ සපයන ලදී.

එක්සත් රාජධානියේ ගෝලීය ගාස්තු, එහි අතුරු GSP යෝජනා ක්‍රමය සහ අපනයන මූල්‍ය ක්‍රියාත්මක කරන අතරම, එක්සත් රාජධානියේ රජය 2022 වසරේ සිට සිය නව GSP යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.එවැනි නව GSP යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම සඳහා, එක්සත් රාජධානිය 2021 අගෝස්තු/සැප්තැම්බර් මාසවලදී තවත් සති 8ක පාර්ශවකරුවන්ගේ මාර්ගගත උපදේශනයක් දියත් කරන ලදී. වාණිජදෙපාර්තමේන්තුවවිසින් දේශීය සාකච්ඡා ක්‍රියාවලියට නායකත්වය දුන් අතර ඇඟලුම්, රබර්, තේ, පොල්, ධීවර, කුළුබඩු, පිඟන් මැටි සහ වීදුරු, සැහැල්ලු ඉංජිනේරු, පාපැදි, පාවහන්, මැණික් සහ ස්වර්ණාභරණ, ප්ලාස්ටික්, විදුලි, නිෂ්පාදන සහ සැකසූ ආහාර යන ක්ෂේත්‍ර 14ක් 2021.09.12 අවසන් දිනය වන විට මාර්ගගතව ඉදිරිපත් කිරීම සම්පූර්ණ කිරීමට පහසුකම් සැලසීය.තවද, තනි පුද්ගල සාකච්ඡාවන්හි සමස්ත ප්‍රතිඵලය දෙස බලා වාණිජ දෙපාර්තමේන්තුව විසින් වෙනම ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.ඔවුන්ගේ නව GSP යෝජනා ක්‍රමයේ ආකෘතිය සහ අන්තර්ගතය තීරණය කිරීම සඳහා ප්‍රතිලාභීන්ගෙන් යෙදවුම් ලබා ගැනීමේ අරමුණින් පවත්වන ලද එක්සත් රාජධානියේ මහජන උපදේශන සඳහා ශ්‍රී ලංකාව අවස්ථා දෙකකදී සහභාගී විය. මෙම උපදේශන එක්සත් රාජධානියේ GSPයෝජනා ක්‍රමය සඳහා ශ්‍රී ලංකාවේ ඉල්ලුම්කිරීමක් ලෙස නොසැලකිය යුතුය.

VIII. ශ්‍රීලංකාව සහ වියට්නාමය අතර පුළුල් යුරෝපා සංගම් ප්‍රභවස්ථාන සමුච්චිතය සඳහා වූ යෝජනාව

ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර වෙළඳාම පිළිබඳ අනු කමිටුවේ 2වන රැස්වීමේ පසු විපරම් ක්‍රියාවක් ලෙස ශ්‍රී ලංකාව විසින් වියට්නාමයෙන් ප්‍රභවය වූ රෙදි යොදාගෙනයුරෝපා සංගම් වෙළෙඳපොළ වෙත ඇඟලුම් නිෂ්පාදනය කිරීමෙන් යුරෝපා සංගමයේ පුළුල් සමුච්චිත පහසුකම ඉල්ලුම් කිරීමට වියට්නාම් රෙදිපිළි හා ඇඟලුම් සංගමයේ (VITAS) සහාය ඉල්ලා ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදය (JAAF) විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් වියට්නාමයට ඉදිරිපත් කර පසුව පසුවිපරම් කටයුතු කර ඇත. වියට්නාම් ප්‍රභවය වූ රෙදිපිළි සමඟ යුරෝපා සංගම් GSP + සහනය භාවිතා කිරීමේ වේගය වැඩි කිරීම තුළින් ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර පුළුල් සමුච්චනයක් ඇති කිරීමෙන් ඇඟලුම් අපනයනයේ වටිනාකම ඉහළ නැංවීමට සැලකිය යුතු දායකත්වයක් සපයනු ඇතැයි JAAF සංගමය සුබවාදී මත පලකරයි.

IX. ශ්‍රීලංකාව -ඕස්ට්‍රේලියාව අතර වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුම

වෙළඳාම හා ආයෝජන වැඩි කිරීමෙන් ලැබෙන අන්‍යෝන්‍ය ප්‍රතිලාභ මත ද්විපාර්ශ්වික ආර්ථික සබඳතා වැඩිදියුණු කිරීමේ අරමුණින් ඕස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව 2017 නොවැම්බර් මස දී වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුමකට (TIFA) අත්සන් තබන ලදී. වෙළෙඳ හා ආයෝජන පිළිබඳ ශ්‍රී ලංකා-ඕස්ට්‍රේලියා ඒකාබද්ධ කමිටුව (JC) මෙම වැඩපිළිවෙළ යටතේ පිහිටුවනලදී. එහි 1 වැනි සැසිවාරය 2018 අප්‍රේල් මාසයේ

ඕස්ට්‍රේලියාවේ දී පැවැත්වුණු අතර JCහි 2 වැනි සැසිවාරය 2019 සැප්තැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ දී පැවැත්විණි.

JC හි 3 වන සැසිවාරයට පෙර, 2020-2021 කාලය සඳහා එහි ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කර අනුමත කිරීම උදෙසා TIFA හි අතුරු රැස්වීමක් 2021 නොවැම්බර් 17 වන දින මාර්ගගත අයුරින් පැවැත් වූ අතර, එය වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඕස්ට්‍රේලියාවේ විදේශ කටයුතු සහ වෙළඳ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟින් එක්ව සංවිධානය කරන ලදී. රජයන් අතර සම්බන්ධතා, සංවර්ධන හවුල්කාරිත්වය, වෙළඳපල ප්‍රවේශය සහ වාණිජ අවශ්‍යතා සඳහා අදාළ ප්‍රධාන ක්‍රියාකාරකම් කාණ්ඩ හතරකින් ක්‍රියාකාරී සැලැස්ම සමන්විත වේ. දෙරටෙම නව යෝජනා සමාලෝචනය කර මීළඟ පසුවිපරම් රැස්වීම්සඳහා සහ 2022 මැද භාගයේදී ඕස්ට්‍රේලියාවේ පැවැත්වීමට බලාපොරොත්තු වන ශ්‍රී ලංකා-ඕස්ට්‍රේලියා ඒකාබද්ධ කමිටුවේ (JC) 3 වැනි සැසිවාරය සඳහා අපේක්ෂිත දින නියම කරන ලදී.

ක්‍රියාකාරී සැලැස්මට නව යෝජනා කිහිපයක් ද ඇතුළත් විය. ඕස්ට්‍රේලියානු පාර්ශවය විසින් ශ්‍රී ලංකාවට අධ්‍යාපන මධ්‍යස්ථානයක් පිහිටුවීමේ හැකියාව සහ ඕස්ට්‍රේලියානු අධ්‍යාපන ආයතන මගින් ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීමේ හැකියාව, වෙළඳ භාණ්ඩ මධ්‍යස්ථාන, ලෝක බැංකුවේ සහය ඇතිව වෙළඳාම සඳහා ජාතික නිශ්කාශන කවුළුව (National Single Window) වැඩසටහන්, ආයෝජක යෙදුම්වල ප්‍රගතිය, නැව් සම්බන්ධතා යනාදිය පිළිබඳ වැඩි දුර විස්තර ප්‍රකාශ කරන ලදී. අනුකූලතා තක්සේරුව පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම (MRA) හඳුනාගත් නිෂ්පාදන සඳහා නිරෝධායන නිෂ්කාශනය වේගවත් ලෙස සැකසීම, මල් වගා ක්ෂේත්‍රය ඉලක්ක කර ගනිමින් ක්ෂේත්‍ර සහතික කිරීමේ ක්‍රමය සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සහාය සහ කහටගහ මිනිරන් පතලට අවශ්‍ය වාසර සමීක්ෂණයක් සඳහා සහාය වැනි ප්‍රමුඛතා හතරක් ශ්‍රී ලංකා පාර්ශ්වය විසින් ඉස්මතු කරන ලදී. 1 වන අතුරු රැස්වීමේදී එකඟ වූ පරිදි, දෙපාර්ශවය විසින්ම අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුගමනය කිරීම සඳහා ඕස්ට්‍රලියානු මහ කොමසාරිස් කාර්යාලය (AHC) සමඟ 1 වන සමාලෝචන රැස්වීම 2021 දෙසැම්බර් 07 වන දින පවත්වන ලදී.

X. ආර්ථික සහ වෙළඳ සහයෝගිතාව පිළිබඳ චීන-ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටුවේ (JETC) 07 වන සැසිවාරය.

ද්විපාර්ශවික වෙළඳාම සහ දෙරට අතර ආර්ථික සහයෝගිතාව තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් 1982 දී අත්සන් කරන ලද වෙළඳ සහ ගෙවීම් ගිවිසුම සහ ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ ගිවිසුම් යන ගිවිසුම් දෙකක් ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව 1991 දී ශ්‍රී ලංකා-චීන ආර්ථික සහ වෙළඳ සහයෝගිතාව සඳහා වූ ඒකාබද්ධ කමිටුව (JETC) පිහිටුවන ලදී.

චීන ශ්‍රී ලංකා JETC හි 7 වැනි සැසිවාරය 2021 සැප්තැම්බර් 24 වැනි දින මාර්ගගත අයුරින් පැවැත්වුණු අතර ශ්‍රී ලංකා නියෝජිත පිරිස වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙහෙයවන ලද අතර චීන නියෝජිත පිරිස මෙහෙයවනු ලැබුවේ චීනයේ වාණිජ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා විසිනි. 7 වැනි සැසිවාරය සඳහා දෙරටෙන්ම නව යෝජනා කිහිපයක් ගෙන එන ලද අතර එහි අවබෝධතා ගිවිසුම් හතරක් (MOU) එනම් ;21 වැනි සියවසේ චීනයේ සේද සමුද්‍ර මාවත සහ ශ්‍රී ලංකාවේ සෞභාග්‍යයේ දැක්ම ඒකාබද්ධව ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමඟ අවබෝධතා ගිවිසුම, ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාකාරී කණ්ඩායම පිහිටුවීම පිළිබඳ අවබෝධතා ගිවිසුම, ඩිජිටල් ආර්ථිකයේ ආයෝජන සහයෝගිතාව ශක්තිමත් කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම සහ හරිත සංවර්ධනය සඳහා ආයෝජන සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම චීනය විසින් ශ්‍රී ලංකා පාර්ශවය වෙත සලකා බැලීම පිණිස යෝජනා කරන ලදී.

වෙළඳපල ප්‍රවේශය, ආයෝජන ප්‍රවර්ධනය, ආර්ථික සහයෝගිතාවය සහ තාක්ෂණික සහාය පිළිබඳ ගැටළු සම්බන්ධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රමුඛතා යෝජනා ශ්‍රී ලංකා පාර්ශ්වය විසින් මතු කර දක්වන ලදී.සුදුසුකම් ලත් නව මත්ස්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම, ආහාරයට

ගතහැකි නව මත්ස්‍ය ප්‍රභේද, ශ්‍රී ලංකාවේ නැවුම් අඹ සහ අන්නාසි සඳහා සෞඛ්‍ය හා ශාක ස්වස්ථතා නිෂ්කාශනය, වෙළෙඳපොළ ප්‍රවේශය අපේක්ෂා කරන ප්‍රමුඛතා නිෂ්පාදන, ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට චීන පාර්ශවයෙන් සහය ලබා දීම ,නැහෙනහිර පළාතේ එරාවුර්හි පිහිටුවා ඇති "රෙදිපිළි නිෂ්පාදන කලාපය", චීනයෙන් ආනයනය කරන ලද රෙදි සඳහා ‘‘නිකුත් කිරීමේ සැකසුම් යෝජනා ක්‍රමය’’ සඳහා පහසුකම් සැලසීම සහ විශ්වාසදායී වෙළඳ සහතික කිරීමේ පද්ධතියක් සඳහා සුදුසු ක්‍රමයක් පිහිටුවීමඇතුළු යෝජනා පිළිබඳව සාකච්ඡා කෙරිණි.

දෙපාර්ශවය විසින් එකඟ වූ යෝජනා ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමට දෙපාර්ශවයටම හැකිවන පරිදි චීන ශ්‍රී ලංකා JETC හි 7 වැනි සැසිවාරයේදී ඉදිරිපත් වූ කරුණු පිළිබඳව පසු විපරම් රැස්වීමක් ද 2021 දෙසැම්බර් 15 වැනි දින පවත්වන ලදී.

XI. ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකා-තුර්කි ඒකාබද්ධ කමිටුවේ (JCETC) 02 වැනි සැසිවාරය

ශ්‍රීලංකාව සහ තුර්කිය (JCETC)අතර ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ගිවිසුමේ 02 වැනි සැසිවාරය කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මාර්ගගත අයුරින් 2021 ජුනි 10 වැනි දින පවත්වන ලදී.රැස්වීමේ සත්කාරකත්වය දරන ලද්දේ ශ්‍රී ලංකාව විසිනි.ශ්‍රී ලංකා දූත පිරිසේ ප්‍රධානත්වයවෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා විසින් දරනු ලැබූ අතර තුර්කි නියෝජිත පිරිසේ ප්‍රධානත්වය එරට ජාතික අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය Dr. ZiyaSelçukමහතා විසින් දරනු ලැබීය. ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුවේ වැඩබලන වාණිජ අධ්‍යක්ෂ ජනරාල් ආනන්ද ධර්මප්‍රිය මහතා සහ තුර්කියෙ හි වෙළඳ අමාත්‍යාංශයේ ජාත්‍යන්තර ගිවිසුම් සහ යුරෝපීය කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් Atilla Bastirmaciමහතා විසින් මෙම රැස්වීමේ තාක්ෂණික සැසියේ සම මුලසුන හොබවන ලදී.

අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් සහ තිරසාරාත්මක ලෙස ද්වීපාර්ශවීය වෙළඳ කටයුතු, ආර්ථික, තාක්ෂණික සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කිරීමට සහ වැඩි දියුණු කිරීමට දෙපාර්ශය විසින් සිය එකඟතාවය පළ කරන ලදී. JCETCහි නෛතික රාමුව, ද්විපාර්ශ්වික වෙළඳ සබඳතා, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව (ඉදිකිරීම් සේවා, තොරතුරු තාක්ෂණ, සංචාරක, ප්‍රවාහන, වෛද්‍ය උපකරණ, මූල්‍ය අංශය, ආහාර සැකසුම්, රෙදිපිළි, රබර් යන ක්ෂේත්‍රවල ඇතුළත් විය. නිෂ්පාදන, සෞඛ්‍ය, මෝටර් රථ, විදුලි සහ ඉලෙක්ට්‍රොනික, ලෝහ සහ ඛනිජ අංශ), කොන්ත්‍රාත් සහ ඉංජිනේරු උපදේශන සේවා, අධ්‍යාපනය, විද්‍යාව, තාක්ෂණ සහ මිනුම් විද්‍යාව, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසාය, ප්‍රමිතිකරණය, සිවිල් ගුවන් සේවා, සමුද්‍ර ප්‍රවාහනය, සෞඛ්‍ය, සංස්කෘතිය සහ සංචාරක, බලශක්ති, කෘෂිකර්ම සහ ජල සුරක්ෂිතතාව සහ ජල ගුණාත්මක බව ආදිය මෙම සැසියේ දී සාකච්ඡා කරන ලද ප්‍රධාන වැදගත් කරුණු වේ.

JCETCහි සාකච්ඡා කර ඇති කරුණුවල ප්‍රගතිය පිළිබඳව අන්කාරා හි ශ්‍රී ලංකා දූත මණ්ඩලය හරහා ශ්‍රී ලංකාවේ පාර්ශවකාර ආයතන සහ තුර්කි බලධාරීන් සමඟ අදාළ පසු විපරම් කටයුතු වාණිජ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

XII. ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර වෙළෙඳ හා ආයෝජන පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (WGTI) පිහිටුවීම

ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර ද්විපාර්ශ්වික සහයෝගීතාව සඳහා වූ ඒකාබද්ධ කමිටුවක් (JCBC) පිහිටුවීම පිළිබඳ අවබෝධතා ගිවිසුමක් 2007 ඔක්තෝබර් 01 වන දින අත්සන් කරන ලද අතර එහි 1 වන රැස්වීම 2012 ජනවාරි 26 වන දින කොළඹදී පැවැත්විණි. 2014 ඔක්තෝම්බර් 13 වන දින ජකර්තාහි පැවති JCBC හි 2 වන රැස්වීමේ දී, **JCBC** යටතේ දෙරට අතර වෙළඳාම සහ ආයෝජන පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමක් (WGTI) පිහිටුවීමට එකඟ විය. සාකච්ඡා වට කිහිපයකින් පසුව, WGTI හි කාර්යය නිර්දේශය **(**ToR**)** කෙටුම්පතට දේපාර්ශවය විසින් එකඟතාවය පළකර ඇත.

වෙළඳ අමාත්‍යාංශය සහ වාණිජ දෙපාර්තමේන්තුව හැකි ඉක්මනින් WGTI හි ToR අත්සන් කිරීමටකටයුතු සම්පාදනය කරමින් සිටී.අදාළ අවශ්‍ය පැහැදිලිකිරීම් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති අතර යෝජිත වෙනස්කම් ඉන්දුනීසියානු පාර්ශවය වෙත ඔවුන්ගේ සලකා බැලීම සඳහා දැනුම් දෙන ලදී.TOR කෙටුම්පතට ඉන්දුනීසියාව එකඟ වූ පසු එය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරෙනු ඇත.

XIII. වෙළඳ, ආර්ථික, විද්‍යා සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකා-රුසියානු අන්තර් රාජ්‍ය ඒකාබද්ධ කමිටුව

වෙළෙඳ, ආර්ථික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ (IGC) ශ්‍රී ලංකා රුසියානුඅන්තර් රාජ්‍ය කමිටුවේ 3 වැනි සැසිවාරයේ සම සභාපතිවරුන්ගේ රැස්වීම -
සම සභාපතිවරුන්ගේ රැස්වීම 2021.06.15 දින මාර්ගගත ආකාරයෙන් පැවැත්විණි. රුසියානු දූත පිරිස රුසියාවේ ධීවර කටයුතු පිළිබඳ ෆෙඩරල් නියෝජිතායතනයේ ප්‍රධානියා විසින් මෙහෙයවන ලද අතර ශ්‍රී ලංකා නියෝජිත පිරිස වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙහෙයවන ලදී.

මැණික් හා ස්වර්ණාභරණ අංශයේ Carnet සහතිකපත්‍ර, ලංකා තේ ප්‍රවර්ධනය, නව මුහුදු ආහාර අපනයන සමාගම් සහ සුදුසුකම් ලත් ලැයිස්තුවට ශ්‍රී ලංකාවෙන් නව ධීවර නිෂ්පාදන පරාසයක් ඇතුළත් කිරීම, සහ කෘෂිකර්ම හා ධීවර ක්ෂේත්‍ර පිළිබඳ තාක්ෂණික සහය ලබා ගැනීම වැනි කරුණු IGCහි සාකච්ඡා කරන ලද ශ්‍රී ලංකාවේ යෝජනාවලට ඇතුළත් විය. රුසියානු පාර්ශවයේ යෝජනාවලට රේගු, බලශක්ති, කර්මාන්ත, කෘෂිකර්ම සහ තොරතුරු තාක්ෂණ අංශයේ සහයෝගිතාව ඇතුළත් විය. IGC හි 3වන සැසිවාරය 2022 පෙබරවාරි 09වන දින පුද්ගල සහභාගීත්වයෙන් කොළඹදී පැවැත්වීමට නියමිතය.

XIV. නවසීලන්තය සහ ශ්‍රී ලංකාව අතර වෙළෙඳ සහ ආර්ථික සහයෝගීතාව පිළිබඳ සංවාදය

කෘෂිකර්මාන්තය, අධ්‍යාපනය, වෙළඳාම, ආයෝජන සහ සහයෝගීතාව සඳහා පදනම වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව සංචාරක, බලශක්ති, රාජ්‍ය අංශයේ පාලනය සහ සේවා සැපයීම, සෞඛ්‍ය, මූල්‍ය සේවා, යටිතල පහසුකම්, ක්‍රීඩා විද්‍යාව සහ නවෝත්පාදන ආදිය ඇතුලත් එහෙත් සීමිත අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන අංශ හරහා සහභාගිවන්නන් අතර වෙළඳාම, ආයෝජනය සහ සහයෝගීතාව සඳහා පදනම වැඩිදියුණු කිරීමේ අරමුණින් නවසීලන්තය සහ ශ්‍රී ලංකාව අතර වෙළෙඳ සහ ආර්ථික සහයෝගීතාව පිළිබඳ සංවාදයක් ස්ථාපිත කිරීම 2018/2019 කාලය තුළ ආරම්භ කරන ලදී.ශ්‍රී ලංකා පාර්ශ්වය විසින් යෝජිත සංශෝධන කෙටුම්පත 2019 මැයි මාසයේදී ඉදිරිපත් කරන ලදී. නවසීලන්ත පාර්ශවයෙන් ප්‍රති නිරීක්ෂණ 2021.08.06 දින වන විට ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශය හරහා වාණිජ දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත.ශ්‍රී ලංකා පාර්ශවය විසින් නවසීලන්තයේ නිරීක්ෂණ අධ්‍යයනය කරමින් සිටින අතර ඒ අනුව අදාල ප්‍රතිචාර ඉදිරිපත් කරනු ඇත.

XV. ශ්‍රී ලංකාව සහ යුක්‌රේනය අතර වෙළඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ අන්තර් රාජ්‍ය ඒකාබද්ධ කමිටුවක් පිහිටුවීම පිළිබඳ යෝජිත ගිවිසුම

ශ්‍රී ලංකාව සහ යුක්‌රේනය අතර ද්විපාර්ශ්වික වෙළෙඳ සහ ආර්ථික සහයෝගීතාව ඉහළ නැංවීමට පියවර ගන්නා බවට දෙරට අතර අන්‍යෝන්‍ය එකඟතාවයකට පැමිණ තිබේ. එබැවින්, (රටවල් අතර වෙළඳාම් කරන භාණ්ඩ සඳහා තීරුබදු සහන හුවමාරු නොකර) වෙළඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ අන්තර් රාජ්‍ය ඒකාබද්ධ කමිටුවක් පිහිටුවීමේ ගිවිසුමකට එළඹීමට ශ්‍රී ලංකාව සහ යුක්‌රේනය එකඟ වී ඇත. 2016 ජුනි 28 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගිවිසුම අත්සන් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

2016 වසරේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත් පසු අමාත්‍යාංශවල කටයුතු වෙනස් වූ බැවින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය නැවත අලුතින් ලබාගන්නා ලෙස විදේශ අමාත්‍යාංශය මෙම දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත.

වාණිජ දෙපාර්තමේන්තුව විසින් යෝජිත ගිවිසුමේ අන්තර්ගතය පිළිබඳව 2021 ඔක්තෝම්බර් 06 වැනි දිනැති ලිපිය මගින් නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලද අදහස්වලට අනුව ගිවිසුම නැවත සකස් කරන ලදී.සංශෝධිත ගිවිසුම් කෙටුම්පත අන්කාරා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට ඉදිරිපත් කිරීම සඳහා 2021 නොවැම්බර් 09 වන දින විදේශ අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. නැවත සකස් කරන ලද ගිවිසුම පිළිබඳ යුක්රේන පාර්ශ්වයේ අදහස් අපේක්ෂා කෙරේ.

XVI. ශ්‍රී ලංකාව සහ සෞදි අරාබිය අතර ඒකාබද්ධ ආර්ථික සහයෝගිතා ගිවිසුමක් (JEC) ස්ථාපිත කිරීම

1992 දී ශ්‍රී ලංකාව පාර්ශවයෙන් ඉදිරිපත් කළ යෝජනාව මත පදනම්ව, ශ්‍රී ලංකාව සහ සෞදි අරාබිය අතර ආර්ථික, වෙළඳ, ආයෝජන, විද්‍යාත්මක, තාක්ෂණික, සංස්කෘතික, තරුණ සහ ක්‍රීඩා සහයෝගීතාව පිළිබඳ පොදු ගිවිසුම 2003 දෙසැම්බර් 17 වන දින අත්සන් කරන ලදී. ගිවිසුමේ 7 වැනි වගන්තියට අනුව සහ ආංශික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා, සෞදි අරාබිය සමඟ ඒකාබද්ධ ආර්ථික සහයෝගීතා ගිවිසුමක් (JEC) සඳහා කෙටුම්පත විදේශ අමාත්‍යාංශය මඟින් රියාද් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත යොමු කරන ලදී.

XVII. චීනය සමඟ තවමත් නොනිමි අවබෝධතා ගිවිසුම් පිළිබඳ පසු විපරම් කටයුතු.

- චීනයේ 21 වැනි සියවසේ සේද මාවත සහ ශ්‍රී ලංකාවේ සෞභාග්‍යයේ දැක්ම ඒකාබද්ධව ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමඟ අවබෝධතා ගිවිසුම (MoU). යෝජිත අවබෝධතා ගිවිසුම මුදල් අමාත්‍යාංශය විසින් වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාකාරී කණ්ඩායම පිහිටුවීම පිළිබඳ අවබෝධතා ගිවිසුම. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අවබෝධතා ගිවිසුමේ කෙටුම්පත සිය නිරීක්ෂණ ද සමඟින් විදේශ අමාත්‍යාංශයේ නීති අංශය වෙත ඔවුන්ගේ පරීක්ෂාව සඳහා යවා ඇත.
- ඩිජිටල් ආර්ථිකය තුළ ආයෝජන සහයෝගීතාව ශක්තිමත් කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම. රේඛීය අමාත්‍යාංශය වන තාක්ෂණ අමාත්‍යාංශයේ පිළිතුරු අපේක්ෂාවෙන් සිටී.
- හරිත සංවර්ධනය සඳහා ආයෝජන සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම. රේඛීය අමාත්‍යාංශය වන පරිසර අමාත්‍යාංශය, අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට එකඟ වී ඇති අතර විදේශ අමාත්‍යාංශයේ නීති අංශය විසින් පටිත නිරවුල් කොට ඇත.

XVIII. ශ්‍රී ලංකාවේ ජාතික වෙළඳ ප්‍රතිපත්තිය සකස් කිරීම

2020 අග භාගයේදී ශ්‍රී ලංකාව වෙනුවෙන් ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සැකසීමේ කාර්යය වෙළෙඳ අමාත්‍යාංශයට පැවරිණි. විධිමත් සාකච්ඡා සහ උපදෙස් සම්පාදනය 2021 දී ආරම්භ කරන ලදී.වාණිජ දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර වෙළඳ කමිටුව, විදේශ වෙළඳ කමිටුව, සේවා වෙළඳ කමිටුව සහ නීති කටයුතු කමිටුව යන අනු කමිටු හතරක තාක්ෂණික යෙදවුම් සපයන ලදී.

ද්විපාර්ශවික, කලාපීය සහ බහුපාර්ශවික වෙළඳ විධිවිධාන, අපනයන සහ ආනයන සඳහා අදාළ වන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිය සහ විදේශ වෙළඳාමට අදාළ නීතිමය රාමුව පිළිබඳව අවශ්‍ය උපදේශනලබා දෙමින් විදේශ වෙළඳාම පිළිබඳ ප්‍රතිපත්තියක් සැකසීම සඳහා දෙපාර්තමේන්තුව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන ලදී.වාණිජ දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් විසින් කමිටු සාමාජිකයින් වෙත අදාළ පර්යේෂණ ලේඛන, සංඛ්‍යාලේඛන සහ අනෙකුත් තොරතුරු ලබා දුන් අතර නීතිපතා රැස්වීම්වලට ද සහභාගී වන ලදී.

1.5.3 කලාපීය කටයුතු අංශය

I. දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)

SAPTA සාමාජික රාජ්‍යන් වනුයේ බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය හා ශ්‍රී ලංකාව වේ. දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) 1993 අප්‍රේල් මස 11 වන දින අත්සන් කරන ලද අතර 1995 දෙසැම්බර් මස 07 වන දින සිට එය බලාත්මක වන ලදී. එබැවින් දකුණු ආසියානු නිදහස් වෙළඳ ප්‍රදේශය (SAFTA) මඟින් SAPTA ගිවිසුම ක්‍රම ක්‍රමයෙන් ප්‍රතිස්ථාපනය කිරීමට නියමිතය. එනිසා, SAPTA යටතේ පවතින තීරු බදු වරණ ක්‍රමිකව අඩුවෙමින් පවතී.

SAPTA ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ අපනයන 2021වර්ෂයේඇ.ඩො.මි. 1.42ක අගයක් ගත් අතර 2020 වර්ෂයේ දී ඇ.ඩො.මි. 0.78 ලෙස වාර්තා වී ඇත. SAPTA ගිවිසුම යටතේ 2021 අපනයනය කරන ලද ප්‍රධාන අයිතමයන් වූයේ වල්කනයිස් කරන ලද රබර් තහඩු, සීට්, තීරු, පොලු සහ පැතිකඩ හැඩතල, අනෙකුත් වල්කනයිස් කරන ලද රබර් ද්‍රව්‍ය, පාප්ප මැලියම් සහ තේ ය.

2021 වර්ෂය තුළ SAPTA යටතේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතිකපත් 220ක් වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇත. SAPTA යටතේ ශ්‍රී ලංකාව ආනයනය කිරීමේ වටිනාකම 2021දී ඇමරිකානු ඩොලර් මිලියන 0.13 ක් ලෙස සටහන් වූ අතර එය 2020 දී ඇමරිකානු ඩොලර් මිලියන 0.12 සිට සුළු වැඩිවීමකි.

II. දකුණු ආසියානු නිදහස් වෙළඳ කලාපය (SAFTA)

දකුණු ආසියානු නිදහස් වෙළඳ කලාපය (SAFTA) පිළිබඳ ගිවිසුම යටතේ අදියර IIIසංවේදී ලැයිස්තු අඩු කිරීම ඇතුළු සාකච්ඡා මේ වන විට සිදුවෙමින් පවතී.

2021 ජූලි 28-29දක්වා පැවැත්වීමට නියමිතව තිබූ SAFTA විද්වත් කමිටුවෙහි (SCOE)10වැනි රැස්වීම කල් දමන ලදී.

SAFTA ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ වාර්තා වූ අපනයන ප්‍රමාණය 2021 වර්ෂයේ දී ඇ.ඩො.මී101.64 වන අතර එය 2020 වර්ෂයේ දී ඇ.ඩො.මී 42.25 ට වඩා140% කින් වැඩි වීමකි.2021 දී SAFTA යටතේ අපනයනය කරන ලද ප්‍රධාන භාණ්ඩ වූයේ ගම්මිරිස් (තලා හෝ අඹරා නැති) වියලන ලද පොල්, ඇලුමිනියම් බහාලුම්, ඩෙසිටෙක්ස් 67කින් යුත් කෘතිම ඒක තන්තු; වියා නොමැති, කාවද්දා ඇති හෝ නොමැති, ආලේප කරන ලද, ආවරණය කර හෝ ලැමිනේට් කර, බූලි, බෝතල්, උණුවතුර බෝතල්, ජෝගු, කුප්පි,ඇම්පියුල සහ වෙනත් වීදුරු බහාලුම්, සාදික්කා, පොල්, පට්ටා ආදියයි. SAFTA යටතේ ශ්‍රී ලංකාව ආනයනය කළ අගය 2021 දී ඇ.ඩො.මී.7.65ක් වාර්තා කර ඇත්තේ 2020 දී ට වඩා ඇ.ඩො.මී 4.13 ක වැඩි වීමකිනි.

III. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) යටතේ මේ වන විට සාකච්ඡා වට 4 ක් අවසන් කර ඇති අතර සාමාජික වන රාජ්‍යයන් විසින් නිෂ්පාදන10,461 ක් සඳහාතීරුබදු සහන ලබා දී ඇත. APTA හි 05 වැනි වටය යටතේ වාණිජ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ එක්ව දැනට ස්ථාවර කමිටු (SC) සැසිවාරවල සාකච්ඡා (භාණ්ඩ වෙළඳාම පිළිබඳ සාකච්ඡා ඇතුළුව) සහ ආයෝජන, වෙළඳ පහසුකම්, සේවා සහ ප්‍රභවස්ථාන නීති පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම්වල රැස්වීම්වල නිරත වේ. 2020 පෙබරවාරි 03 සිට 05 දක්වා තායිලන්තයේ බැංකොක් නුවර පැවැත්වීමට නියමිතව තිබූ APTA හි 57 වැනි ස්ථාවර කමිටු රැස්වීම සහ 6 වැනි ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් දින නියමයක් නොමැතිව කල් දමන ලදී.

2020.09.29 දින සිට මොංගෝලියාව නිල වශයෙන් APTA හි හත්වන සාමාජිකයා බවට පත්විය. ඒ අනුව, 2021.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මොංගෝලියාව සහ ශ්‍රී ලංකාව ඇතුළු අනෙකුත් සමාජික වන රාජ්‍යයන් තීරුබදු සහන අන්‍යෝන්‍යව හුවමාරු කර ගනු ලබයි.මොංගෝලියාව විසින් පිරිනමනු ලබන ධීවර, පලතුරු, කුළුබඩු, ඛනිජ, ලී භාණ්ඩ, පිඟන් භාණ්ඩ, නූල්, රෙදි සහ මුතු ඇතුළු නිෂ්පාදන386 කින් සමන්විත මූලික සහන ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට භාවිත කළ හැකිය.

APTA යටතේ ශ්‍රී ලංකාවේ අපනයනවල අගය 2021 දී ඇ.ඩො.මි238.61ක් වාර්තා කළ අතර එය 2020 දී වූ ඇ.ඩො.මි 204.67 වඩා වැඩි අගයක් ගනී. 2021 වසරේ APTA යටතේ අපනයනය කරන ලද ප්‍රධාන භාණ්ඩ වූයේ තේ, පොල්, පට්ට, සක්‍රීය කාබන්, ඇඟලුම්, ඇඟලුම් ද්‍රව්‍ය, ධීවර නිෂ්පාදන යනාදියයි. APTA යටතේ ශ්‍රී ලංකාවේ ආනයනයන්හි වටිනාකම 2021 දී ඇ.ඩො.මි 24.22 ක් වාර්තා කළේ 2020 දී ඩොලර් මිලියන 20.51කට වඩා සුළු වැඩිවීමක් පෙන්නුම් කරමිනි.

IV. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය(GSTP)

වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD) විසින් සංවර්ධනය වන රටවල් අතර වෙළඳ අවස්ථා වැඩි දියුණු කිරීම සඳහා ආරම්භ කරනු ලැබූ ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) 1989 අප්‍රේල් මස 19 වන දින සිට බලාත්මක විය.මෙහි සාමාජික රාජ්‍ය සංඛ්‍යාව 42කි.

ගෝලීය වෙළඳ වරණ ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව විසින් 2021 වර්ෂයේදි සිදුකළ අපනයන ඇ.ඩො.මි. 91.82ක් වේ. මෙම ගෝලීය වෙළඳ වරණ ක්‍රමය යටතේ සිදුකළ සමස්ත අපනයන වලින් ප්‍රධානතම අපනයන ද්‍රව්‍ය වනුයේ 85.98% ක් වූ කුරුඳු ය.ඉන්පසු ප්‍රධාන අයිතම වනුයේ පිළිවෙලින් ඇලුමිනියම් පිප්ප,බෙර,කෑන්,පෙට්ටි හා සමාන බහාලුම් භාජනසහ පොල් ආශ්‍රිත නිෂ්පාදන වේ. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවේ ආනයන වටිනාකම 2021 දී ඇ.ඩො.මි. 0.01 කි. එය 2020 දී තිබූ ඇ.ඩො.මි 0.17 ට වඩා අඩු වීමකි.

V. බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල ප්‍රවේශය(BIMSTEC)

2004 පෙබරවාරි 08 වැනි දින තායිලන්තයේ දී රාමුගත ගිවිසුම අත්සන් කිරීමත් සමඟ ආරම්භ වූ බිම්ස්ටෙක් නිදහස් වෙළඳ කලාපය (FTA) පිළිබඳ සාකච්ඡා තවමත් සිදු වෙමින් පවතී. 2021.02.08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකාවේ තීරුබදු ලිහිල්කරණ වැඩසටහන (TLP) සමාලෝචනය කිරීමට සහ එය ජාතික ප්‍රතිපත්ති රාමුවේ “රට හදන සෞභාග්‍යයේ දැක්ම” අනුව සකසා අවසන් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

සමාලෝචනය සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශ / රාජ්‍ය අමාත්‍යාංශවලින් අදාළ උපදෙස් ඉල්ලා ඇති අතර නිරීක්ෂණ ලබා ගැනීම 2021.07.15 දින අවසන් කරන ලදී. ලැබී ඇති නිරීක්ෂණ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (D/TIP) වෙත සලකා බැලීම සඳහා යවන ලදී. D/TIP විසින් කරන ලද නිරීක්ෂණය සැලකිල්ලට ගනිමින්, වාණිජදෙපාර්තමේන්තුවවිසින් BIMSTEC FTA යටතේ යෝජිත ක්‍රමයේ වෙනස්කම් පිළිබඳව කර්මාන්ත අමාත්‍යාංශයෙන් නිරීක්ෂණ ඉල්ලා සිටියේය. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ වෙළඳාම ලිහිල්කරණය (TLP) දැනටමත් HS2007 සිට HS2017 දක්වා මාරු කර ඇත.

ROO හි 20 වැනි ක්‍රියාකාරී කණ්ඩායම 2022 ජනවාරි 10 සිට 11 දක්වා මාර්ගගත අයුරින් පැවැත්විණි. ප්‍රභවස්ථාන නීති පරිච්ඡේදය, මෙහෙයුම් සහතික කිරීමේ ක්‍රියා පටිපාටිය සහ භාණ්ඩ වෙළඳාම පිළිබඳ ගිවිසුම් වන නිෂ්පාදන විශේෂිත රීතිවල කෙටුම්පත් පිළිබඳ වැදගත් කරුණු සාකච්ඡා කර අවසන් වෙමින් පවතී.

1.5.4. වෙළඳ ප්‍රවර්ධන අංශය

I. විදේශ වාණිජ නියෝජනය

වෙළඳාම ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සත්කාරක රටවලදී ශ්‍රී ලංකාවේ වාණිජ හා ආර්ථික අපේක්ෂා ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම සඳහා වන වාණිජ දෙපාර්තමේන්තුවේ විදේශ වාණිජ නියෝජනය කිරීමේ කාර්යය එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩල 31ක් නියෝජනය කරන නිලධාරීන් 33 න් සමන්විත වේ.

එතෙර සිටින වාණිජ නිලධාරීන් විසින් ඉටු කරන ප්‍රධාන කාර්යයන් පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය.

- ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා අපනයන අවස්ථා හඳුනා ගැනීම පිණිස වෙළඳපොළ සමීක්ෂණ / වාණිජමය අගයක් සහිත තොරතුරු සම්පාදනය කිරීම.
- සත්කාරක රට තුළ පවතින ද්විපාර්ශවීය, කලාපීය සහ අන්තර්ජාතික නීත්‍යානුකූල බැඳීම්වලට අනුකූලව සත්කාරක රටෙහි වෙළඳ ප්‍රතිපත්ති වල වෙනස් වීම්, පිළියම් ක්‍රියාමාර්ග සඳහා නිර්දේශයන් ඇතුළු තීරුබදු හා තීරුබදු නොවන පියවරයන් අධීක්ෂණය කිරීම හා වාර්තා කිරීම.
- ශ්‍රී ලංකාවේ අපනයනයන් සඳහා එල්ලවිය හැකි තීරුබදු සහ තීරුබදු නොවන පියවරයන්ගේ අහිතකර බලපෑම අවම කිරීම සඳහා සුදුසු අයුරින් සත්කාරක රටතුළ අදාල නියෝජනයන් සිදුකිරීම.
- ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ප්‍රදර්ශන / අවස්ථා සඳහා විදේශීය ව්‍යාපාරික දූත පිරිස් සංවිධානය කිරීම.
- ව්‍යාපාරික හමු සඳහා අභ්‍යන්තර මිලදී ගැනීම් නියෝජන සංවිධානය කිරීම, ශ්‍රී ලංකාව තුළ පවත්වන ප්‍රදර්ශන සඳහා සහභාගීත්වය සංවිධානය කිරීම.
- සත්කාරක රටවල ශ්‍රී ලංකාවට සුවිශේෂී (තනි රටක්) ප්‍රවර්ධන මෙහෙයුම් පැවැත්වීම.
- ව්‍යාපාරික අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා වෙළඳ, ආයෝජන හා සංචාර දූත පිරිස් ශ්‍රී ලංකාව වෙත හා ශ්‍රී ලංකාවෙන් වෙනත් රටවල් වෙත සංවිධානය කිරීම.
- ව්‍යාපාරික අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා ඒක පුද්ගල ව්‍යාපාරික සංචාර ශ්‍රී ලංකාව වෙත හා ශ්‍රී ලංකාවෙන් වෙනත් රටවල් වෙත සංවිධානය කිරීම.
- සත්කාරක රටවල වෙළඳ, ආයෝජන හා සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ක්ෂේත්‍ර වල රජයේ නිලධාරීන් සමඟ සම්බන්ධ වීම සහ විවිධ රාජ්‍ය හා ජාත්‍යන්තර සංවිධානවලදී ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික අපේක්ෂා හා සම්බන්ධ ගැටළු / කරුණු වලට අදාළව ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.
- වෙළඳ, ආයෝජන හා සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත විමසුම් සම්බන්ධයෙන් සේවා සැපයීම, විදේශව්‍යාපාරිකයන් හමු වීම/ ඔවුන් සමඟ සාකච්ඡා පැවැත්වීම, ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට තාක්ෂණික සහය සැපයීම, වෙළඳ ආරවුල් නිරාකරණය කර ගැනීම ආදිය සඳහා සහය ලබා දීම.
- විදේශීය වෙළඳපොළ තුළ සිය නිෂ්පාදනය / සන්නාම නාමය ලියාපදිංචි කිරීම සඳහා අපනයනකරුවන්ට / නිෂ්පාදකයින්ට සහය ලබා දීම.
- ශ්‍රී ලංකාවෙන් අපනයන කරන ලද භාණ්ඩ තොග නිෂ්කාශන කටයුතු පහසු කිරීම සඳහා ආනයනික රටෙහි රේගුව / ආහාර සුරක්ෂණ ආයතන සමඟින් මැදිහත් වී කටයුතු කිරීම.
- නිෂ්පාදන වර්ධනය කිරීම, තාක්ෂණය, ඇසුරුම්කරණය, අලෙවිකරණය ආදිය පිළිබඳ දැනුම ලබා ගැනීම / වැඩිදියුණු කිරීම සඳහා විදේශීය ශක්‍යතා ගොඩනැංවීමේ වැඩසටහන් / පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට ශ්‍රී ලාංකික නිෂ්පාදකයින් / වගාකරුවන් වෙත අවස්ථා ලබා ගැනීම.
- ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවා අපනයනය සඳහා වෙළඳපොළ ප්‍රවේශය පුළුල් කිරීමට ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය මට්ටමින් වෙළඳාම වෙත බලපෑම් කෙරෙන ප්‍රතිපත්තිමය ගැටළු පිළිබඳ සාරාංශ/ යොමු සකස් කිරීම.
- ආනයනික රටවල් විසින් දියත් කරන ලද ප්‍රපාතන විරෝධී විමර්ශනයන් සඳහා ශ්‍රී ලංකාවේ නිෂ්පාදන යටත්වන අවස්ථාවන්වලදී ඒ සඳහා පිළිතුරු සම්පාදනය කිරීමට සහ සැපයුම් පාර්ශවීය

බාධා සඳහා විසඳුම් ලබා ගැනීමට තනි අපනයනකරුවෙකුට අවශ්‍ය පරිදි සකසන ලද සුවිශේෂී මඟපෙන්වීම් මෙන්ම උපදෙස් ලබා දීම.

- විදේශීය කටයුතු අමාත්‍යාංශය විසින් ආරම්භ කොට දියත් කරන ලද ''ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය'' යන වැඩසටහන් යටතේ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අදාළ රාජ්‍ය ආයතන, වෙළඳ මණ්ඩල, ව්‍යාපාරික සංගම් සහ අදාල පාර්ශවකරුවන් සමඟින් එක්ව ආරම්භ කරන ලද අපනයන, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් නිළ සංවර්ධන ආධාර සම්බන්ධ (Official Development Assistance / ODAS) වැඩ සහ ව්‍යාපෘති හැසිරවීම, මෙහෙයවීමේ කටයුතු සිදු කිරීම (චීනය/ බීජිං)
- ශ්‍රී ලංකා රජයට සිය අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා සහය ලබා දීම.

වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරී සේවයේ ස්ථාපිත දූත මෙහෙවර කාර්යාල;

I කාණ්ඩයේ තනතුරු	II කාණ්ඩයේ තනතුරු	III කාණ්ඩයේ තනතුරු
I. බෙල්ජියම / බ්‍රසල්ස්	I. ඕස්ට්‍රේලියාව / සිඩ්නි	I. බ්‍රසීලය / බ්‍රසීලියාව
II. ඉන්දියාව / නවදිල්ලිය	II. කැනඩාව / ටොරොන්ටෝ	II. ඊජිප්තුව / කයිරෝව
III. ඉතාලිය / රෝමය	III. චීනය / බීජිං	III. ඉන්දියාව / චෙන්නායි
IV. පකිස්ථානය / කරච්චි	IV. ප්‍රංශය / පැරිස්	IV. ඉන්දියාව / මුම්බායි
V. සිංගප්පූරුව	V. ජර්මනිය / ෆ්‍රැන්ක්ෆර්ට්	V. සෞදි අරාබිය / රියාද් රාජධානිය
VI. ස්විට්සර්ලන්තය / ජිනීවා (ජ්‍යෙෂ්ඨ)	VI. ජපානය / ටෝකියෝ	VI. මැලේසියාව / ක්වාලාලම්පූර්
VII. එක්සත් රාජධානිය / ලන්ඩන් (ජ්‍යෙෂ්ඨ)	VII. දකුණු කොරියාව / සෝල්	VII. රුසියාව / මොස්කව්
VIII. එක්සත් අරාබි එමීර් රාජ්‍යය / ඩුබායි	VIII. ස්විට්සර්ලන්තය / ජිනීවා (කනිෂ්ඨ)	VIII. දකුණුඅප්‍රිකාව / ප්‍රිටෝරියා
IX. ඇමරිකා එක්සත් ජනපදය / වොෂිංටන්	IX. ඇමරිකා එක්සත් ජනපදය / ලොස් ඇන්ජලීස්	IX. ස්වීඩනය / ස්ටොක්හෝම්
		X. තායිලන්තය / බැංකොක්
		XI. තුර්කිය / අන්කාරා
		XII. එක්සත් රාජධානිය / ලන්ඩන් (කනිෂ්ඨ)
		XIII. වියට්නාම් / හැනෝයි
		XIV. ඉන්දුනීසියාව / ජකර්තා
		XV. බංගලාදේශය/ ඩකා

අදාළ කාල පරිච්ඡේදය තුළ එතෙර සේවයේ නියුතු වාණිජ නිලධාරීන් විසින් ඉටුකළ කාර්යය පිළිබඳ සාරාංශයක් පහත වගුවේ දැක්වේ

	කාර්ය	ක්‍රියාකාරකම් ගණන මුළු එකතුවක් ලෙස
1	ව්‍යාපාර ගැලපුම් කටයුතු සිදු කිරීම	1,356
2	ව්‍යාපාර ජාල සැසිවාර පැවැත්වීම	214
3	වෙනත් රටවල ශ්‍රී ලාංකික වෙළඳාම ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම (ව්‍යාපාරික සම්මේලන, සම්මන්ත්‍රණ ආදිය)	216
4	වෙනත් රටවල පැවැත්වෙන වෙළඳ ප්‍රදර්ශන/ සල්පිල් සඳහා ශ්‍රී ලාංකීය සහභාගීත්වය සංවිධානය	70
5	ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ප්‍රදර්ශන/ වෙලඳ සල්පිල් වෙත අභ්‍යන්තර ගැනුම් මෙහෙයුම් සහභාගීත්ව සංවිධානය.	05
6	වෙළඳාම පිළිබඳ පැමිණිලි විසඳීමට කටයුතු කිරීම	217
7	අපනයන වෙළඳ විමසුම් වෙනුවෙන් කටයුතු කිරීම	1,307
8	ශ්‍රී ලාංකීය ප්‍රදර්ශන සත්කාරක/ බලයලත් රට තුළ ප්‍රවර්ධනය කිරීම	108
9	විභවීය ව්‍යාපාරික පාර්ශවකරුවන් සහ වෙළඳ මණ්ඩල හමුවීම් පැවැත්වීම	850
10	වෙළඳපොළ ප්‍රවේශය පිළිබඳ කාරණා සඳහා මැදිහත් වීම.	193
11	ආයෝජන පිළිබඳ සම්මන්ත්‍රණ පැවැත්වීම	69
12	ආයෝජන යෝජනාවන් පිළිබඳ කටයුතු කිරීම	155
13	අයෝජන ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.	98
14	සංචාරක ප්‍රවර්ධන කාර්යයන් සංවිධානය කිරීම/පහසුකරණය	183
15	වෙනත් රටවල පැවැත්වෙන සංචාරක ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම/ පහසුකරණය	19
16	වෙළඳපොළ තොරතුරු වාර්තා කිරීම	337

අ.වෙළඳ ප්‍රවර්ධනය

වර්ෂය තුළදී වාණිජ නිලධාරීන් විසින් සිදුකරන ලද තෝරාගත් ප්‍රධාන වෙළඳ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් පහත ලැයිස්තු ගතකර ඇත;

ඕස්ට්‍රේලියාව

1. ඕස්ට්‍රේලියානු වෙළඳපොළ පිළිබඳ දැනුම ලබා දීමට සහ ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා ඕස්ට්‍රේලියාවේ ඇති අවස්ථා පිළිබඳශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය සමඟ වෙබ් සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
2. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, ඕස්ට්‍රේලියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සහ වික්ටෝරියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සමඟ සංවිධානය කරන ලද ව්‍යාපාරික පරිසරය සහ ඕස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව අතර සහයෝගිතාව සඳහා ඇති අවස්ථා පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය.
3. ඕස්ට්‍රේලියානු-ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලය ස්ථාපිත කිරීම සහ ශ්‍රී ලංකාවේ වෙළඳ, සංචාරක සහ ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා කවුන්සිලය විධිමත් ලෙස දියත් කිරීමට කටයුතු කරමින් පවතී.

බ්‍රසීලය

1. බොගොටා වාණිජ මණ්ඩලය සහ Pro-Colombiaහි සහයෝගිතාවයෙන්, සවිස්තරාත්මක තොරතුරු පිළිබඳ සහ වෙළඳපොළ අවස්ථා ලබා දීම වෙනුවෙන් ශ්‍රී ලාංකීය අපනයනකරුවන් සඳහා කොලොම්බියානු වෙළඳපොළ පිළිබඳ වෙළඳපොළ දැනුවත් කිරීමේ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම.
2. දෙරට අතර බෝට්ටු තැනීමේ ක්ෂේත්‍රයේ සහයෝගිතාව සඳහා බ්‍රසීලියානු බෝට්ටු නිෂ්පාදන සහ උපාංග සංගමය (ACOBAR) සහ ශ්‍රී ලංකා බෝට්ටු සැකසීමේ තාක්ෂණ වැඩිදියුණු කිරීමේ ආයතනය (BTI) අතර සහයෝගිතාව ස්ථාපිත කර ඇති අතර දෙපාර්ශවයටම අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායකවන සහ වෙළඳපල තොරතුරු ලබා ගැනීම සඳහා මෙන්ම අවස්ථා හඳුනා ගැනීම සඳහා සංගම් දෙක අතර වෙළඳපොළ දැනුවත් කිරීමේ රැස්වීම් කිහිපයක් සංවිධානය කරන ලදී.
3. වෙළඳපොළ තොරතුරු සහ විභවය නිෂ්පාදන පිළිබඳ දැනුවත් කිරීම සඳහා අපනයනකරුවන්ගේ ජාතික වෙළඳ මණ්ඩලය සමඟින් එක්ව ‘වෙළඳපොළ කරා, ඉදිරියටම (Go beyond, Reach market)’ යන මැයෙන් වෙළඳපොළ ප්‍රවේශය පිළිබඳ සෘජුවම අපනයකරුවන් සම්බන්ධ කිරීමේ වෙබ් සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
4. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය සහ සාඕ පාවුලෝ වාණිජ මණ්ඩලය සමඟින් අන්‍යෝන්‍ය සහයෝගිතාවය අපේක්ෂාවෙන් අවබෝධතා ගිවිසුමක් යෝජනා කිරීමට රැස්වීමක් සංවිධානය කිරීම.
5. රටවල් දෙකෙහිම තොරතුරු තාක්ෂණ අංශය ප්‍රවර්ධනය කිරීමට සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා එක්ව කටයුතු කිරීම වෙනුවෙන් බ්‍රසීලයේ තොරතුරු තාක්ෂණ සංගමය (ABRAT) සහ ශ්‍රී ලංකාවේSLASSCOMඅතර අවබෝධතා ගිවිසුමක් 2021 අගෝස්තු 17 වන දින අත්සන් කරන ලදී.

ජර්මනිය

1. අපනයන සමාගම් 300 ක පමණ සහභාගීත්වයෙන් කෘෂි නිෂ්පාදන සඳහා යුරෝපා සංගමයේ ප්‍රමිතීන් සහ සහතික කිරීම පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණ හතරක් සංවිධානය කරන ලදී.
2. ශ්‍රී ලාංකික සමාගම් 45 කට පමණ ඔවුන්ගේ සමාගම් පසුබිම් සහ නිෂ්පාදන පරාසය පිළිබඳ

ප්‍රවර්ධනය සඳහා වෙළඳපල තොරතුරු සහ මගපෙන්වීම ලබා දීම.

ඉන්දියාව

1. ශ්‍රී ලංකාවේ අලිපේර සහ පැෂන් අපනයනකරුවන් මුම්බායි හි ඉහළ මට්ටමේ සුපිරි වෙළඳසැල් සහ ආනයනකරුවන් සමඟ සම්බන්ධ කිරීම සඳහා මාර්ගගත ව්‍යාපාරික(B2B)රැස්වීම් 20 ක් සංවිධානය කරන ලදී.

පකිස්ථානය

1. ශ්‍රී ලංකාවේ ‘‘iComplast සහ iRubexpo’’ මාර්ගගත ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (PRISL) සමඟ සම්බන්ධීකරණයෙන් පාකිස්තාන රබර් නිෂ්පාදකයින්ගේ සංගමය අතර මාර්ගගත රැස්වීමක් දූත මෙහෙවර මගින් සංවිධානය කරන ලදී.
2. පාකිස්ථානයේ ශ්‍රී ලංකා ව්‍යාපාරික සංසදය (PSLBF) සමග දූත මණ්ඩලය සහ කරච්චි හි ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරිකයන් විසින් කොන්සල් ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් PSFTA හි පූර්ණ හැකියාවන් උපයෝගී කර ගනිමින් නව විභවීය නිෂ්පාදන සොයමින් පාකිස්තානය වෙත ශ්‍රී ලංකාවේ අපනයන වැඩි දියුණු කිරීම සඳහා විවිධ උපාය මාර්ග සාකච්ඡා කිරීමට ව්‍යාපාරික ජාල සැසියක් සංවිධානය කරන ලදී.

ජපානය

1. ජපානයේ සිටින ශ්‍රී ලංකා තේ, කුළුබඩු, MCT තෙල්, ආලේපන, අත්‍යවශ්‍ය තෙල්, ශාකසාර ආලේපන, පොල් අරක්කු ගැනුම්කරුවන් සඳහා ශ්‍රී ලංකා අපනයනකරුවන්වෙනුවෙන්B2B රැස්වීම් සංවිධානය කරමින් හඳුන්වා දීම.
2. ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය සමඟ සහයෝගයෙන් ජපාන ජාතික අපනයනකරුවන්ගේ (NCE) වෙළඳපල ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ‘‘ජපානය සමඟ ව්‍යාපාර කිරීම’’ පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම.
3. ජපන් ගැනුම්කරුවන් 100ක් පමණ සහභාගි වන ලද ලංකා කුරුඳු පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම.
4. ‘කොවිඩ්-19 න් ඔබ්බට: ජපානයේ ව්‍යාපාරික අවස්ථා’ පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලද අතර ඒ පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ශ්‍රී ලාංකික අපනයනකරුවන් 120 දෙනෙකු සමඟ සම්බන්ධ විය.

සිංගප්පූරුව

1. සමාගම් 120 ක් පමණ සහභාගී වූ සිංගප්පූරු වෙළඳපොළ තුළ වෙළඳපොළ අපේක්ෂාවන් සහ දේශසීමා හරහා වෙළඳ කටයුතු ආරම්භ කිරීමේ අවස්ථා පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.
2. ආහාර අංශය සඳහා "Sri Lanka Food Buyer - Seller Meet" නමින් මාර්ගගත වෙබ් සම්මන්ත්‍රණයක් සහ B2B ව්‍යාපාරික සැසියක් සංවිධානය කරන ලද අතර එයට රටවල් දෙකෙන්ම 60 දෙනෙක් සහභාගී වූහ.
3. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), රාජ්‍ය අමාත්‍යාංශය සහ සිංගප්පූරු බෝට්ටු සංගමයේ සහභාගීත්වයෙන් බෝට්ටු සැකසුම් අංශය සහ වෙරළාශ්‍රිත සංවර්ධනය පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.
4. සිංගප්පූරුවේ ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන ආනයනය සහ බෙදාහරින්නෙක් වෙත ශ්‍රී ලාංකික සමාගම් 18ක් හඳුන්වා දෙන ලදී.

දකුණු කොරියාව

1. පොල් නිෂ්පාදන, රබර් නිෂ්පාදන, කුළුබඩු නිෂ්පාදන, ආහාර පාන, පෝසිලේන් නිෂ්පාදන, කෘෂි නිෂ්පාදන, මුහුදු ආහාර, රබර් අත්වැසුම්, කොහු නිෂ්පාදන සහ ලංකා තේ විභවීය කොරියානු ආනයනකරුවන් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් සමඟ B2B සැසි සංවිධානය කරන ලදී.
2. ශ්‍රී ලාංකේය නැව් සැකසීමේ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ හඳුන්වාදීමේ අදහසින් කොරියානු නැව් තැනීමේ කර්මාන්ත සංගමයේ (KOMSSIC) සාමාජිකයින් සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ සහයෝගයෙන් මාර්ගගත ලෙසින් ‘‘බෝට්ටු සහ නැව් තැනීම පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක්’’ සංවිධානය කරන ලදී.
3. මෙම දූත මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) සහ කොරියානු මැණික් වෙළඳ සංගමය (KGTA) සමඟ එක්ව ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ අංශය කොරියානු මැණික් ආනයනකරුවන් සහ බෙදාහරින්නන් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා විස්තරාත්මක මාර්ගගත වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.
4. ශ්‍රී ලංකාවෙන් කොරියානු ජනරජය වෙත කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය සඳහා යෝජිත සාධනීය නිෂ්පාදන ලැයිස්තු ක්‍රමය (PLS) සාකච්ඡා කිරීමේ අරමුණින් දූත මණ්ඩලය, EDB සමඟ සහයෝගයෙන්, ශ්‍රී ලංකා බලධාරීන් සහ අපනයනකරුවන් සඳහා කොරියාවේ ආහාර සහ ඖෂධ සුරක්ෂිතතා අමාත්‍යාංශය (MFDS) සමඟ මාර්ගගත ජාල රැස්වීමක් සංවිධානය කරන ලදී.
5. දූත මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සමඟ සහයෝගයෙන් 2021 ජූලි 22-24 දක්වා සෝල් හි Coex ප්‍රදර්ශන ශාලාවේ පැවති ආනයන භාණ්ඩ ප්‍රදර්ශනය (IGF) 2021 සඳහා ශ්‍රී ලාංකීය කුටියක් සංවිධානය කරන ලදී.

එක්සත් අරාබි එමිර් රාජ්‍ය

1. ඩුබායි හි අල් මායා සුපිරි වෙළඳසැල් ජාලයේ ශ්‍රී ලංකා නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහනක් සති දෙකක් පුරා පැවත්වීම සංවිධානය කරන ලදී.
2. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ සහයෝගයෙන් Gulfood 2021 සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම.

ඇමරිකා එක්සත් ජනපදය

1. එක්සත් ජනපද වෙළඳපල තත්ත්වය සහ එහි මෑත කාලීන ප්‍රවණතා පිළිබඳව ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් දැනුවත් කිරීම සඳහා ෆ්ලොරිඩා, ලාස් වේගාස්, ලොස් ඇන්ජලීස්, වර්ජිනියා සහ නිව් යෝර්ක් යන ප්‍රාන්තවල පිහිටි ශ්‍රී ලාංකීය ව්‍යාපාරික මණ්ඩල/සංගම්වල සහභාගීත්වයෙන් ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලය සමඟ සහයෝගීතාවයෙන් වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම.
2. ශ්‍රී ලංකා මෘදුකාංග සේවා සමාගම් සංගමය (SLASSCOM) සමඟ එක්ව ගෝලීය යොමු කිරීමේ` වැඩසටහන(Global Refferal Programme) සංවිධානය කරන ලද අතර ශ්‍රී ලාංකික වෘත්තිකයන් සහ ව්‍යාපාරිකයින් විශාල පිරිසකට වැඩසටහනට සහභාගී වීමට පහසුකම් සලස්වන ලදී.
3. ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලයේ (NCE) සාමාජිකයින් සඳහා "ඇමරිකා එක්සත් ජනපදයේ නැවිගත කිරීමේ සහ සැපයුම් කර්මාන්තයට බලපාන වත්මන් තීරණාත්මක සාධක" යන මාතෘකාව යටතේ නැවිගත කිරීම සහ සැපයුම් පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.

එක්සත් රාජධානිය

1. එක්සත් රාජධානියේ ජාත්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව (UKDIT) විසින් මෙහෙයවනු ලබන එක්සත් රාජධානියේ ගෝලීය වෙළඳ වරණ ක්‍රමය- වැඩිදියුණු කළ රාමුව පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණ වැඩසටහනක් දියත් කරන ලදී.
2. එක්සත් රාජධානි- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය පිහිටුවීමට කටයුතු සම්පාදනය කරන ලදී.
3. ශ්‍රී ලංකා කොමර්ෂල් බැංකුව සහ බ්‍රිතාන්‍යසමඟින් ව්‍යාපාර කිරීම සඳහා වූ කවුන්සිලය සමඟ සහයෝගීතාවයෙන් 'මහාබ්‍රිතාන්‍ය වෙත අපනයන අවස්ථා' පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.

ආ. **සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම**

එතෙර සේවය සඳහා ස්ථානගත කර සිටින වාණිජ නිලධාරීන්විසින් රට තුළට සෘජු විදේශ ආයෝජනය ආකර්ෂණය කර ගැනීම සඳහා වැදගත් කාර්යභාරයක් අඛණ්ඩව සිදු කරනු ලැබේ. මේ සඳහා එතෙර සිටින ප්‍රධාන ආයෝජකයන් හා ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතන සමඟ දැඩි සබඳතා ජාල ඇතිකර ගැනීමේ කාර්යයයේ ඔවුන් නියුක්තව සිටිනු ලැබේ. තවද, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත පුළුල් කිරීම සඳහා ශක්‍යතාවය සහිත හවුල් ව්‍යාපාර පාර්ශවකරුවන් හඳුනාගැනීම සහ ශ්‍රී ලංකාවෙන් එම රටවලට පැමිණෙන ව්‍යාපාරික දූත පිරිස් සඳහා තනි පුද්ගල ව්‍යාපාරික හමුවීම් සංවිධානය කිරීමද මොවුන් විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ දී වාණිජ නිලධාරීන් විසින් ශක්‍යතා සහිත ආයෝජකයන් ඔවුන්ගේ වෙළඳපොළවල් වලදී හමුවී දිවයින තුළ පවතින ආයෝජන අවස්ථා සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කර ඇත.

ඒ ඒ රටවල ස්ථාපිත වාණිජ නිලධාරීන් විසින් පහසුකම් සපයා ඇති තෝරාගත් ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ;

ඉන්දියාව

1. ගුජරාටයේ ආයෝජකයින් ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා පිළිබඳ සැසියක් සංවිධානය කරන ලදී.

ඉන්දුනීසියාව

1. හම්බන්තොට ඖෂධ කලාපයේ ආයෝජනය කිරීමට උනන්දුවක් දක්වන ඉන්දුනීසියානු ඖෂධ සමාගම් 02ක් ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලයට හඳුන්වා දීම.
2. ශ්‍රී ලංකාවේ විදුලි මෝටර් බයිසිකල් එකලස් කිරීමට උනන්දුවක් දක්වන ඉන්දුනීසියානු විදුලි වාහන කර්මාන්ත සංගමයේ (Periklindo)සාමාජිකයින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට (BOI) හඳුන්වා දෙන ලදී.

තුර්කිය

1. ආයෝජන මණ්ඩලය, කොළඹ වරාය නගර ව්‍යාපෘති සමාගම, තුර්කි කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමය සහ තුර්කි වෙළඳ අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ප්‍රමුඛ තුර්කි විභවය ආයෝජකයින් සඳහා ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.

දකුණු කොරියාව

1. කොරියානු රෙදිපිළි කර්මාන්ත සන්ධානය (KOFOTI), ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI), කොළඹ කොරියානු තානාපති කාර්යාලය සහ ශ්‍රී ලංකා ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදය (JAAFSL)සහයෝගීතාවයෙන් විභවීය කොරියානු ආයෝජකයින් වෙත ශ්‍රී ලංකාවේ ඇඟලුම් සහ රෙදිපිළි ක්ෂේත්‍රවල ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.

2. කොරියානු ඖෂධ වෙළෙඳ සංගමය (KPTA) විසින් InBioPharmප්‍රදර්ශනය සහ Global Bio-Pharmaceuticals Plazaඋපදේශන සැසියට සමගාමීවසංවිධානය කරන ලද කොරියාවේIncheon, නගරයේ පැවති "Bio Pharmaceuticals Global Conference (BIG C Conference)" හි "ශ්‍රී ලංකාව පිළිබඳ ආයෝජන ප්‍රවර්ධනසැසියක්" සංවිධානය කරන ලදී.
3. ශ්‍රී ලංකාව සහ කොරියානු ජනරජය අතර ඉදිකිරීම් සහ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ද්විපාර්ශවික සහයෝගිතාව ඉහළ නැංවීමේ අරමුණින්, කොරියාවේ ජාත්‍යන්තර කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමය විසින් සත්කාරකත්වය සපයන ලද ගෝලීය යටිතල පහසුකම් සහයෝගිතා සමුළුව (GICC) 2021 හි ශ්‍රී ලංකාව පිළිබඳ ජාලකරණ සැසියක් සඳහා පහසුකම් සපයන ලදී.

සිංගප්පූරුව

1. පුනර්ජනනීය බලශක්ති අංශය වෙත ආයෝජන හවුල්කරුවන් ගවේෂණය කිරීම සඳහා සිංගප්පූරු ව්‍යාපාර සම්මේලනය සහ සිංගප්පූරු එන්ටර්ප්‍රයිස් සමඟ "ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති ආයෝජන කඩිනම් කිරීම" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් එකක් පවත්වන ලදී.
2. සිංගප්පූරු ආයෝජකයින් ඉලක්ක කර ගනිමින් දේපොළ වෙළඳාම් අංශය සංවර්ධනය කිරීම පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් පවත්වන ලද අතර, එයට උනන්දුවක් දක්වන පාර්ශ්ව 125කට අධික සංඛ්‍යාවක් සහභාගී විය.

එක්සත් අරාබි එමිර් රාජ්‍ය

1. කොළඹ කොටස් හුවමාරුව (CSE) සහ සුරුකුම්පත් විනිමය කොමිෂන් සභාව (SEC)සමඟ එක්ව ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

ඇ. සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

සංචාරක අංශයේ ඇති අසිමිත විභවය හඳුනා ගෙන ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා වාණිජ නිලධාරීන් විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහ ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ සහයෝගිතාවයෙන් විදේශ රටවලදී විවිධ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරන ලදී. විශේෂ සමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම, ශ්‍රී ලංකාව සම්බන්ධව ප්‍රවර්ධන ඉසව් සංවිධානය කිරීම, ජාත්‍යන්තර සංචාරක සල්පිල් සඳහා සහභාගීවීමට පහසුකම් සැලසීම, ශ්‍රී ලංකාව වෙත මාධ්‍ය දූත පිරිස් හා සංචාරක නියෝජිතයන් සඳහා දැනුවත් කිරීමේ සංචාර සංවිධානය කිරීම, සංචාරක ප්‍රවර්ධන කවුන්සිල් පිහිටුවීම, සත්කාරක රටවල්වලදී ඉලෙක්ට්‍රොනික් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණ ලබාදීම ආදිය ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා වාණිජ නිලධාරීන් විසින් යොදාගන්නා ප්‍රධාන උපායමාර්ග අතර වේ.

ශ්‍රී ලංකාවේ එතෙර දූත මණ්ඩල විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා ප්‍රදර්ශන සහ සම්මේලන කාර්යාංශය සහ සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ අනෙකුත් ආයතන සමඟ සහායෝගිතාවයෙන් සංවිධානය කළ ප්‍රධාන කටයුතු කිහිපයක් පහත දැක්වේ;

ඉන්දියාව

1. මුම්බායි හි කීර්තිමත් චිත්‍රපට නිෂ්පාදන ආයතනයක් වන Tiger Babyනිෂ්පාදන ආයතනයෙන් ගවේෂණාත්මක චාරිකාවක් සංවිධානය කරන ලද අතර දූත පිරිසේ ප්‍රධානියා වූයේ සම්මානලාභී අධ්‍යක්ෂක Zoya Aktharමහත්මියයි.

2. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය (SLCB) සමඟ එක්ව ශ්‍රී ලංකාවේ MICE (රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ වැඩසටහන්) සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා මාර්ගගත උත්සවයක් සංවිධානය කරන ලදී.
3. ඉන්දියානු MICEනියෝජිතයින් රැස්වීම්, සම්මන්ත්‍රණ සැලසුම්කරුවන් සහ සංගම් සඳහා කොළඹ නගරය අවට MICE සහ විශ්‍රාන්තිමය අත්දැකීම් ප්‍රදර්ශනය කිරීමට මාර්ගගත ලෙසින් MICEදැනුම ලබා ගැනීමේ චාරිකා වැඩසටහන සංවිධානය කිරීම.

සෞදි අරාබිය

1. සෞදි අරාබියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශය සහ සෞදි අරාබියේ ශ්‍රී ලංකන් ගුවන් සේවා කාර්යාලයේ සහාය ඇතිව, සංචාරක සමාගම් 90 ක පමණ සහභාගීත්වයෙන් සෞදි අරාබියේ විදේශගත සංචාරක ක්‍රියාකරුවන් සඳහා දැනුවත් කිරීමේ වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.

සිංගප්පූරුව

1. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය විසින් සංවිධානය කරන ලද 'Virtual MICE Expo'මාර්ගගත ප්‍රදර්ශනයෙහි සිංගප්පූරු MICE නියෝජිතයින් 10දෙනෙකු සහ MICEසංවිධායකයින් සහභාගී වීම සංවිධානය කරන ලදී.
2. සංචාරක මාර්ගෝපදේශ සඟරාවේ ශ්‍රී ලංකාව පිළිබඳ පිටු 3ක ලිපියක් පළ කිරීමට කටයුතු යොදා ඇත.

ජපානය

1. ශ්‍රී ලංකාවේ ආයුර්වේදය පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක් පැවැත්වීමසහඊට ජපන් ජාතිකයින්200ක් පමණ සහභාගී විය.

වියට්නාමය

1. ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති අවස්ථාවන් පිළිබඳව වියට්නාම භික්ෂූන් වහන්සේලා, භික්ෂුණීන් වහන්සේලා සහ ගිහියන් දැනුවත් කිරීම සඳහාEDBසමඟ එක්ව සමුළුවක් සංවිධානය කරන ලදී.
2. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB)සමඟ එක්ව වියට්නාමයේ සිටින සංචාරක ක්ෂේත්‍රයේ නියෝජිතයින් 75 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ සැසියක් සංවිධානය කරන ලදී.

ඕස්ට්‍රේලියාව

1. SLTPBසමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය පිළිබඳ දේශීය විද්‍යුත් මාධ්‍ය තුළ ප්‍රචාරණය සංවිධානය කිරීම. තවද, අන්තර්ජාල සතිපතා සංචාරක සඟරාවේ ශ්‍රී ලංකා MICEසංචාරක ව්‍යාපාරය පිළිබඳ ප්‍රචාරණය කරන ලදී.

තුර්කිය

1. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම උදෙසා තුර්කියේ (Bursaසහ Trabzon) නගරවල ප්‍රවර්ධන වීඩියෝ ප්‍රදර්ශනය කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී.

2. ශ්‍රී ලංකා සංචාරක සහ තුර්කි සංචාරක නියෝජිත සංගමයේ (TURSB) සහයෝගීතාවයෙන්

ප්‍රමුඛ තුර්කි සංචාරක ක්‍රියාකරුවන්, සංචාරක නියෝජිතයින්, මාධ්‍යවේදීන්, බ්ලොග්කරුවන්, සමාජ ක්‍රියාකාරීන් සහ ගුවන් සමාගම් සඳහා සංවිධානය කරන ලද සංචාරක ප්‍රවර්ධන සම්මන්ත්‍රණය.

දකුණු කොරියාව

1. කොරියානු සංචාරක කර්මාන්තය නියෝජනය කරමින් සහභාගිවන්නන්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ අවධානය දිනාගත් දින 3ක් පැවති කොරියානු ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනය (KITS 2021) තුළ ශ්‍රී ලංකාව වෙනුවෙන් කුටියක් සංවිධානය කරන ලදී.

2. කොරියා පදනම විසින් සංවිධානය කරන ලද 4 වන මහජන රාජ්‍යතාන්ත්‍රික සතියේදී දිවයිනේ සංචාරක තේමාවන් එහි උරුමය මෙන්ම සංස්කෘතිය නිරූපණය කරමින් ශ්‍රී ලංකා සංචාරක කුටියක් සංවිධානය කරන ලදී.

3. ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, කොරියානු ජනරජය සහ Mode tour Network Incසමාගමෙහි දෙවන විශාලතම සංචාරක ක්‍රියාකරු සමඟ එක්ව සවිස්තරාත්මක වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.

එක්සත් අරාබි එමිර් රාජ්‍ය

1. ශ්‍රී ලංකාවේ වෙළඳ, සංචාරක, ආයෝජන සහ සංස්කෘතිය ප්‍රවර්ධනය කරමින් රූපවාහිනී වැඩසටහන් 2 කට සහභාගී විය.

ඇමරිකා එක්සත් ජනපදය

1. කොළඹ වරාය නගර ව්‍යාපෘතිය සහ ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව පිළිබඳ එක්දින ප්‍රදර්ශනය සහ සංචරක ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලදී.

2. ඇමරිකා එක්සත් ජනපදයේ විශාලතම ගුවන් ගමන් සහ හෝටල් කාමර වෙන්කරවා ගැනීමේ ආයතනයක් වන Expediaමඟින් ඔවුන්ගේ මාර්ගගත වෙබ් අඩවිය තුළින් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ යෝජනාවක් පිළිගන්නා ලදී.

එක්සත් රාජධානිය

1. එක්සත් රාජධානියේ සංචාරක නියෝජිතයින්, සංචාරක සංගම්, ගුවන් සේවා සහ මාධ්‍යවේදීන් ඉලක්ක කර ගනිමින් 'Hello Again: එක්සත් රාජධානියේ සංචාරකයින් සඳහා මීළඟ නිවාඩු ගමනාන්තය; ශ්‍රී ලංකාව' යන තේමාව යටතේ SLTPB සමඟ එක්ව, දැනුවත් කිරීමේ සැසියක් සංවිධානය කරන ලද අතර, එයට 120 කට අධික පිරිසක් සහභාගී වූහ.
2. BBC Planet Earth වැඩසටහනේ මීළඟ කථාංගයේ රූගත කිරීම් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි මාධ්‍යවේදීන් 3 දෙනෙකුගේ සංචාරය සංවිධානය කර පහසුකම් සැලසීය.
3. සුපිරිතරු5 හෝටලයක් වන The Dorchester හෝටලයේ සති 3ක් පුරා පැවති ශ්‍රී ලංකා ආහාර උළෙලේදී ඉහළ පෙළේ හෝජකයින් 2000ක් පමණ ශ්‍රී ලංකාවේ ආහාර අත්විඳීමට සැලැස්වීම තුළින් ශ්‍රී ලාංකේය ආහාර සහ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා සහය දැක්වීය.

II. වෙළඳ විමසුම් පිළිබඳ කටයුතු කිරීම

සමාලෝචිත කාලය තුල වාණිජ නිලධාරීන් වෙතවෙළඳ විමසුම් 1307ක ප්‍රමාණයක් ලැබී ඇති අතර විදේශීය වෙළෙඳපොළ තුල ශ්‍රී ලාංකීය නිෂ්පාදනයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව ඒවාට නිසි පිළිතුරු වශයෙන් අදාල තොරතුරු/ මහපෙන්වීම් ලබා දෙන ලදී. ශ්‍රී ලංකාවේ අනාගත අපනයනකරුවන්ගෙන් සහ වෙනත් වෙළඳාම ආශ්‍රිත ආයතනවලින් ලද විමසීම් වාණිජ නිලධාරීන් වෙත වහාම පසු විපරම් කටයුතු සඳහා යොමු කරන ලදී.

III. වෙළඳ ආරවුල් විසඳීම සඳහා සහයෝගය

අපනයන සහ ආනයන කටයුතු ආශ්‍රිත වෙළඳ ආරවුල් ඊට අදාළ පාර්ශව අතර සුහදශීලී අයුරින් විසඳාගැනීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව අතරමැදියෙකු/පහසුකම් සපයන්නෙකු වශයෙන් කටයුතු කරනු ලැබේ. සමාලෝචිත කාල සීමාව තුළ ලැබී ඇති එවැනි පැමිණිලි 217ක් සම්බන්ධයෙන් එතෙර ස්ථානගත වාණිජ නිලධාරීන්ගේ සහයෝගයෙන් අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

IV.නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දීම

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටිනු ලැබ ඇති පරිදි වෙළඳ අමාත්‍යාංශ ලේකම් විසින් බලය පවරා ඇති පරිදි වාණිජ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණ කාර්යාල, ශාඛා කාර්යාල හෝ විදේශ සමාගම්, අනෙකුත් වෙළඳ හා වාණිජ ව්‍යාපාරවල සේවයේ යොදවා ඇති නිපුණ විදේශ පුද්ගලයන්, උපදේශකයන්, විශේෂඥයන් හා ඔවුන්ගේ යැපෙන්නන් සඳහා එවැනි සේවා නියුක්ත කරවීම්වලින් අපනයන වෙළඳාම, ජාතික ආර්ථිකය සඳහා වන තාක්ෂණික හුවමාරුව හා ඵලදායිතා වැඩි දියුණුව සැලකිල්ලට ගෙන නිර්දේශ ලිපි නිකුත් කරනු ලැබේ.

2021 වර්ෂය තුළ දී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් වෙළඳ හා සේවා අංශවල විදේශිකයන් 124 දෙනෙකු සහ යැපෙන්නන් 80 දෙනෙකු සඳහා නේවාසික වීසා නිර්දේශ ලිපි නිකුත් කරන ලදී.

V. ණය දෙන ආයතන අනුමත කිරීම

1949 අංක 06 දරන උකස් පනත යටතේ, සමාගමක්, ආයතනයක් හෝ තැනැත්තෙකු අනුමත කරන ලද ණය නියෝජිතායතනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත බලය පවරා ඇත. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එසේ සිය අනුමැතිය ලබා දෙනුයේ, 1949 අංක 06 දරන උකස් පනතේ 114(1) වගන්තිය යටතේ ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකුගෙන් හා තවත් පුද්ගලයන් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක නිර්දේශ මතය.

ගරු වෙළඳ අමාත්‍යතුමා විසින් අංක 2220/56 අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කරමින් 2021 මාර්තු 15 දින සිට බලපැවැත්වෙන පරිදි සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුත් නව මණ්ඩලයක් පත් කරන ලද අතර නීතිඥ ජයන්ත ද සිල්වා මහතා (සභාපති); ජේ.ආර්.සී ජයතිලක මහතා/ අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය (සාමාජික) සහ කාන්ති ගුණවර්ධන මෙනවිය/ අතිරේක ලේකම්, වෙළඳ අමාත්‍යාංශය (සාමාජික) ඊට අයත් වේ.පත් කරන ලද නව මණ්ඩලයේ පළමු රැස්වීම 2021 අප්‍රේල් 29 වන දින වාණිජ දෙපාර්තමේන්තුවේ දී පැවැත්වුණු අතර නව නිර්ණායක මාලාවක් ඉදිරිපත් කිරීමට තීරණය විය. මණ්ඩලය විසින් ඊළඟ රැස්වීම සඳහා අයදුම්පත් ඇගයීම වෙනස් කරන ලදී.ඇගයුම් නිර්ණායක සහ අයදුම්පත්‍රයේ ආකෘතිය වෙනස් කොට අවසන් කිරීම සඳහා ජුනි 17 වන දින ණය මණ්ඩලයේ සාමාජිකයින් අතර zoom

තාක්ෂණය ඔස්සේ රැස්වීමක් පවත්වන ලදී. සංශෝධිත අයදුම් පත්‍රයක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර බෙදා හැර ඊට ඔවුන්ගේ එකඟතාව ලබා ගන්නා ලදී. සංශෝධිත අයදුම්පත ඉදිරි අයදුම්කරුවන් අතර බෙදා හරින ලද අතර දෙපාර්තමේන්තුව ඔවුන්ගේ අයදුම්පත් භාරදීම අපේක්ෂාවෙන් සිටියි.ඇගයුම් නිර්ණායක සකසා අවසන්කිරීම සඳහා අවශ්‍යවන තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලැබී ඇත. නොවැම්බර් මස පැවැත්වීමට නියමිත ණය මණ්ඩලයේ රැස්වීම 2022 ජනවාරි මස පැවැත්වීමට යොදා ගන්නා ලදී.

1.5.5 පර්යේෂණ හා සංවර්ධන අංශය

I. පර්යේෂණ කටයුතු:

අ. නිදහස් වෙළඳ ගිවිසුම් හා සම්බන්ධ පර්යේෂණ

නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ පහත සඳහන් පර්යේෂණ කටයුතු සිදු කරන ලදී:

1. PSFTA යටතේ බාස්මතී කෝටාව භාවිතා කිරීම පිළිබඳ වාර්තාව
2. SAFTA යටතේ බංගලාදේශ නිශේධන ලැයිස්තුවේ සංයුතිය පිළිබඳ අධ්‍යයනය
3. නව අවස්ථා හඳුනා ගැනීම සඳහා ජපානයේ නව GSP යෝජනා ක්‍රමය පිළිබඳ අධ්‍යයනය
4. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවෙකු බවට ඉන්දියාව පත්වීම පිළිබඳ විශ්ලේෂණ වාර්තාව
5. එක්සත් රාජධානිය තුළ ශ්‍රී ලංකා ඇඟලුම් වෙළඳපොළ වෙත ඌණ සංවර්ධිත රටවල් (LDC)වලින් එල්ල වන තර්ජනය පිලිබඳ විශ්ලේෂණය
6. මාලදිවයින-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම- ශක්‍යතා අධ්‍යයනයක්
7. විහවීය ශ්‍රී ලංකා - කෙන්යා වරණීය වෙළඳ ගිවිසුම (PTA) පිළිබඳ සාරාංශගත අධ්‍යයනය
8. යුක්‍රේන ශ්‍රී ලංකා වරණීය වෙළඳ ගිවිසුම (PTA) පිළිබඳ සාරාංශගත අධ්‍යයනය
9. ඉන්දුනීසියානු වෙළඳපොළ තුළ අසමාන වෙළඳපොළ විශ්ලේෂණ

ආ. ශ්‍රී ලංකාව ලෝකය සමඟ සිදුකරන වෙළඳාමට අදාළ පර්යේෂණ

ශ්‍රී ලංකාව ලෝකය සමඟ සිදු කරන වෙළඳාම පිළිබඳ පහත සඳහන් පර්යේෂණ කටයුතු සිදු කරන ලදී:

1. ඇමරිකා එක්සත් ජනපදයේ වෙළඳපොළවෙත ශ්‍රී ලංකාව අපනයනය කිරීම
2. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා චීනය තුළ අසමාන වෙළෙඳපොළ ප්‍රවේශය
3. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා බංගලාදේශයේ පැරා තීරු බදු ව්‍යුහය පිළිබඳ අධ්‍යනය
4. චීන ආනයන තීරුබදුවල කෘෂිකාර්මික නිෂ්පාදන සහ කාර්මික නිෂ්පාදනවල තීරුබදු සංයුතිය පිළිබඳ වාර්තාව
5. SL-SFTA යටතේ සාකච්ඡා කිරීමට නියමිත කරුණු පිළිබඳ වාර්තාව
6. WTO සහ S-SLFTA යටතේ ශ්‍රී ලංකා සේවා බැඳීම් පිළිබඳ සවිස්තරාත්මක සංසන්දන වාර්තාව
7. DoC වෙබ් අඩවිය සඳහා නව නිතර අසන පැන කොටස සැලසුම් කිරීම
8. යෝජිත ජාතික කාර්මික සංවර්ධන ප්‍රතිපත්තිය පිළිබඳ වාණිජදෙපාර්තමේන්තුනිරීක්ෂණ සම්පාදනය කිරීම
9. USJ විසින් ඉදිරිපත් කරන ලද NTPF පිළිබඳ සාමූහික නිරීක්ෂණ
10. ශ්‍රී ලංකාවට ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදන සැපයුම්කරුවන්ගේ දිගුකාලීන BOT ස්ථාවර හඳුනා ගැනීම සඳහා විශ්ලේෂණයක් සිදු කරන ලදී.
11. ඉන්දියාවේ ඇඟලුම් වෙළෙඳපොළේ ප්‍රවණතා අධ්‍යයනය

12. 2021 සඳහා අයවැය යෝජනා සම්පාදනය කිරීම
13. ජාත්‍යන්තර වෙළඳ සාරාංශ (BIT) මාලාව/ ලිපි පිළිබඳ සාරාංශ හතක් (7) බෙදාහැරීම
14. වාණිජ සහ ව්‍යාපාර තොරතුරු හැත්තෑවක් (70) බෙදා හැරීම
15. "ශ්‍රී ලංකාව ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් දක්වා ළඟා වීම පිළිබඳ නිමානය කිරීම" පිළිබඳ කාර්ය මණ්ඩල කර්යය පත්‍රිකාව

II. පුහුණු හා වැඩමුළු

අ. ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්:

පහත දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

1. BIDTI හි අලුතින් පත් කරන ලද දූතමණ්ඩල ප්‍රධානීන් (HOM) සහ අනෙකුත් රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

ආ.වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ අනෙකුත් රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා දේශීය පුහුණු සහ වැඩමුළු:

පහත පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී:

1. වෙළඳ අමාත්‍යාංශයේ අලුතින් බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් වෙත වාණිජ දෙපාර්තමේන්තුක්‍රියාකාරකම් පිළිබඳ ඉදිරිපත් කිරීම.
2. කොළඹ සහ COs හි සිටින නිලධාරීන් සඳහා කොළඹ වරාය නගර අවස්ථා පිළිබඳ මාර්ගගත වෙබ් සම්මන්ත්‍රණයක්.
3. ශ්‍රී ලංකා කොටස් වෙළඳපොලේ ආයෝජන අවස්ථා පිළිබඳව වෙබ් සම්මන්ත්‍රණයක් සංවිධානය.
4. නීතිමය සිද්ධි විශ්ලේෂණය පිළිබඳ විශේෂ ඉදිරිපත් කිරීම.
5. "රාජ්‍ය තාන්ත්‍රිකයින් සඳහා ඩිජිටල් අලෙවිකරණ මෙවලම්" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයක්.
6. කොළඹදී අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම පිළිබඳ මාර්ගගත පුහුණු වැඩසටහන.
7. රාජ්‍ය මූල්‍ය රෙගුලාසි පිළිබඳ පුහුණුව.
8. පුහුණුකරුවන්ගේ ඵලදායිතා වර්ධනය සහ තරඟකාරීත්වය සඳහා ප්‍රතිසංස්කරණ න්‍යායපත්‍ර පුහුණුකිරීම.
9. පුද්ගලික ගොනු කළමනාකරණය පිළිබඳ වැඩමුළුව.
10. ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව.

ඇ. ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ සහභාගීත්වය

වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පහත සඳහන් ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට කටයුතු සම්පාදනය කරන ලදී: ඒවාබොහෝ දුරට මාර්ගගත අයුරින් පැවැත්විය.

1. ජිනීවා හි මාර්ගගත විධායක වෙළඳ පාඨමාලාව.
2. WTO දූත මෙහෙවර සීමාවාසික පුහුණුව.
3. වෙළඳාම පහසුකරණයේ වැදගත්කම පිළිබඳ ජ්‍යෙෂ්ඨ රේගු නිලධාරීන් සඳහා වන ජාත්‍යන්තර පාඨමාලාව.
4. ජිනීවා හි ප්‍රපාතන විරෝධී සහ ආරක්ෂණ පියවර පිළිබඳ WTO නීතිය
5. ඇමරිකා එක්සත් ජනපදය තුළ පැවති ගෝලීය වෙළඳ නීති වැඩසටහන් .

6. සිංගප්පූරුවේ ආහාර සැපයුම් දාම සහ WTO රීති පිළිබඳ මාර්ගගත පුහුණුව.
7. අසීරු ආරවුල් විසඳීම පිළිබඳ WTO මාර්ගගත වැඩමුළුව, ජිනීවා.
8. තරහකාර ප්‍රතිපත්ති, වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ WTO විද්‍යුත් සම්මන්ත්‍රණය.
9. සංවර්ධනය වෙමින් පවතින රටවල රාජ්‍ය ව්‍යවසාය විධායකයින් සඳහා වූ සම්මන්ත්‍රණය.
10. අර්බුද සහ වසංගත කාලවලදී වෙළඳාම සඳහා කලාපීය වෙළඳ ගිවිසුම් සාකච්ඡා කිරීම පිළිබඳ නියමු පාඨමාලාව.
11. ඉදිරියේදී පැවැත්වීමට නියමිත WTO අමාත්‍ය සමුළුව සඳහා තෝරාගත් ගැටළු පිළිබඳව ආසියානු රටවල් සඳහා විශේෂිත පුහුණු වැඩසටහනක්.
12. විද්‍යුත් වාණිජ්‍යය: ආර්ථිකය ප්‍රතිනිර්මාණය කිරීමට අවස්ථාවක්.
13. ආනයන බලපත්‍ර සහ දැනුම්දීම් පිළිබඳ WTO මාර්ගගත වැඩමුළුව.
14. රජයේ ප්‍රසම්පාදනය පිළිබඳ WTO උසස් ගෝලීය විද්‍යුත් වැඩමුළුව.
15. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ පුළුල් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය.
16. බෙංගාල බොක්ක ආශ්‍රිත කලාපීය වෙළඳ සම්බන්ධතා ශක්‍යතා ගොඩනැගීමේ වැඩසටහන යටතේ පුහුණු සහ ශක්‍යතා ගොඩනැගීමේ වැඩසටහන.

1.5 ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම

පහත සඳහන් වරණීය යෝජනා ක්‍රම සහ කලාපීය, ද්විපාර්ශ්වික හා නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය කරන ශ්‍රී ලංකාවේ සම්භවය සහිත නිෂ්පාදන සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කරනු ලැබේ.

- වරණීය පොදු ක්‍රමය (GSP)
- ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)
- දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම(SAPTA)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම(SAFTA)
- ඉන්දු- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම(PSFTA)
- ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)

COVID-19 වසංගතය හමුවේ මෙම වසරේ දී සංඛ්‍යාත්මක බලපෑමක් ඇතත් සාමාන්‍ය වැඩ කරන දිනයකදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික 200කටවඩාසහතික නිකුත් කරනු ලැබේ. පූර්ණ කාලීනව ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමේ අංශයට අනුයුක්ත කර ඇති ඒ සම්බන්ධ ඉහළ විශේෂඥ දැනුම හා පලපුරුද්ද සහිත නිලධාරී කණ්ඩායම උපදෙස් ලබාදීම සඳහා සහ වැඩිදුර තොරතුරු පැහැදිලි කරදීම සඳහා සුදානමින් සිටියි. කලින් වේලාව වෙන් කර ගැනීමකින් තොරවම, රාජකාරී වේලාව තුළ ඕනෑම අවස්ථාවක මොවුන් හමුවිය හැකි වේ. මේ සම්බන්ධව වාණිජ දෙපාර්තමේන්තුවේ වගකීම වනුයේ;

අ. තීරුබදු සහන සඳහා නිෂ්පාදනයක යෝග්‍යතාවය තක්සේරු කිරීම.

ආ. අපනයනකරුවන්ගේ තොරතුරු (exporters' profiles) ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම.

ඇ. යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අපනයනකරුවන් විසින් සපයනු ලබන පිරිවැය ප්‍රකාශන හා අනෙකුත් ආධාරක ලේඛන ඇගයීම.

ඈ. වරණීයතීරුබදු සහන ලබාදෙන රටවල ඉල්ලීම පරිදි ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමෙන් පසු විගණන පැවැත්වීම

ඉ. ප්‍රභවස්ථාන සහතික ආශ්‍රිත දත්ත හා විශ්ලේෂණ වාර්තා සකස්කිරීම.

I. කොවිඩ්-19 වසංගත තත්ත්වය අතරතුර ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කිරීමේ අඛණ්ඩ සේවාව

වරින් වර නියාමනය කරන ලද සංචරණය සහ කාර්යාල විවෘත කිරීම මෙන්ම වැඩවාර ක්‍රමයට කාර්ය මණ්ඩලය සමඟ කටයුතු කිරීම හමුවේ වුවත්, ප්‍රභවස්ථාන නීති අංශය 2021 වසරේදී ත් අඛණ්ඩව සේවය කරන ලදී. 2021 තුළ, දෙපාර්තමේන්තුව සාමාන්‍යයෙන් දිනකට COO සහතික පත් 150ක් පමණ සකසන ලදී; වසර පුරාවට, දෛනිකව සපයන ලද සංඛ්‍යාව140 සිට 220 දක්වා පරාසයක පවතී.

වාණිජ දෙපාර්තමේන්තුව ක්‍රමයෙන් COO අයදුම්පත් භෞතිකව පිළිගැනීම නැවත ආරම්භ කළ ද ඊමේල් හරහා සමාගම් ලියාපදිංචි කිරීම් සහ පිරිවැය ප්‍රකාශයන් සැකසීම අඛණ්ඩව සිදු කරයි.මෙම ඉල්ලුම්පත්‍ර සඳහා වගකිව යුතු නිලධාරීන් වැඩවාර ක්‍රමයට අනුව ක්‍රියා කළ බැවින්, නිවසේ සිට සේවය කරන නිලධාරීන්ට ප්‍රමාදයකින් තොරව අයදුම්පත් සැකසීමට මෙමගින් හැකි විය. ඒ අතරම, දෙපාර්තමේන්තු කාර්යාලයට භෞතිකව ඉදිරිපත් කරන ලද COO පැයක් ඇතුළත සැකසීමට වාණිජ දෙපාර්තමේන්තුව සහතික කර ඇති අතර, අපනයනකරුවන්ට / නියෝජිතයින්ට ඔවුන්ගේ ලේඛන ඉක්මනින් ලබා ගැනීමට මෙමඟින් හැකි විය.

වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ප්‍රභවස්ථාන සහතික (2015- 2021)

ගිවිසුම්	2016	2017	2018	2019	2020	2021
යුරෝපා සංගමයේ වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමය (EU GSP)*	74,003	80,867	43,680	4328	REX	REX
වෙනත් රටවල වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමය (GSP Other Countries)*	12,495	12,468	10,884	8775	6,775	7,209
අනු එකතුව 1	***86,498***	***93,335***	***54,564***	***13,103***	***6,775***	***7,209***
ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)	12,621	12,864	12,882	13,743	9,972	12,085
පකිස්තාන් -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)	6,673	6,703	5,265	6,669	5,608	4,373
ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)	4,508	6,038	4,290	5,515	5,806	6,135
දකුණු ආසියානු වෙළඳ ගිවිසුම (SAFTA)	149	679	557	1,323	671	1,240

දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)	288	277	239	220	117	135
ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)	143	100	143	137	187	139
අනු එකතුව 2	***24,382***	***26,661***	***23,376***	***27,607***	***22,361***	**24,107**
මුලු එකතුව	**110,880**	**119,996**	**77,940**	**40,710**	**29,136**	**31,316**

*REX ක්‍රමය (අපනයනකරුගේ ප්‍රකාශය) 2019.07.01 දින සිට ක්‍රියාත්මක කරන ලද බැවින් වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික පත්‍ර සංඛ්‍යාව අඩු වී ඇත.

ඊට අමතරව, අපනයනකරුවන් සහ සාමාන්‍ය ජනතාව සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් සේවාවන් ලබා දී හෝ සම්පූර්ණ කර ඇත.

ලබා දුන් සේවාව	සංඛ්‍යාව **(2021)**
සමාගම්ලියාපදිංචිකිරීම්	191
පිරිවැයප්‍රකාශයන්	3,522
දිවුරුම්ප්‍රකාශ	643
විමසීම්	14,260
තහවුරුකිරීම්	352

II. EU GSP REX ලියාපදිංචි ක්‍රමය

ලියාපදිංචි අපනයන ක්‍රමය (REX) යනු යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය යටතේ අපනයනය කෙරෙන භාණ්ඩ සඳහා ප්‍රභවස්ථාන සහතික ලබාගැනීම පිළිබඳව 2017 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන ක්‍රමයකි. REX ක්‍රමය යටතේ ප්‍රභවස්ථාන සහතිකය වෙනුවට අපනයනකරුවාගෙන් ප්‍රකාශයක් පමණක් අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව මෙම ක්‍රමය අදාල කිරීම 2018.01.01 ආරම්භ කරනලදඅතරසම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම 2019.07.01 දින සිටබලපැවැත්වෙනලදී.2021වන විට REX ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සමාගම් ගණන 99 ක් වන අතර සමාගම් 1,023 ක් මේ වන විට යුරෝපා සංගමයට අපනයනය කිරීම සඳහා REX ක්‍රමය භාවිතා කරයි.

III.විද්‍යුත් ප්‍රභවස්ථාන නිකුත් කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාවට නැංවීම (E-COO System)

ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ GIZ හි තාක්ෂණික හා මූල්‍යමය සහයෝගය ඇතිව වාණිජ දෙපාර්තමේන්තුව විසින්, ඉලෙක්ට්‍රොනිකහෙවත්විද්‍යුත් ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම සඳහා දැනට පවතින ක්‍රමය, තවදුරටත් එහි වර්තමාන දුර්වලතා පියවා ගැනීම සහ නව අංග එකතු කිරීමේ අරමුණින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. COVID-19 වසංගත තත්ත්වය තුළ මෙම ව්‍යාපෘතිය දියත් කරන ලද්දේ, වර්තමාන ආරක්ෂක අවශ්‍යතා හේතුවෙන් සංචරණ සීමා කිරීම්, වරින් වර අගුලු දැමීම හෝ ඇදිරිනීතිය ක්‍රියාත්මක කිරීම සහ මුහුණට මුහුණලා

සිදුකෙරෙන අන්තර්ක්‍රියා අවම කිරීම හේතුවෙන් අපනයනකරුවන් මුහුණ දෙන අභියෝගයන්ට මුහුණ දීම සඳහා ය. ඒ අතරම, සාමාන්‍යයෙන් ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම සහ වෙනත් උපකාරක සේවා විධිමත් කිරීම හා කඩිනම් කිරීම සඳහා එම ක්‍රමය යුහුසුළුව සිදුකරන ලදී.

2021 අවසානයේ ITC සහ වාණිජ දෙපාර්තමේන්තුවව්‍යාපෘතිය යටතේ පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇත:

- ප්‍රභවස්ථාන සහතික පද්ධතිය භාවිතා කරන පුද්ගලික අංශ සමඟ වත්මන් ක්‍රියාපටිපාටි පිළිබඳ ඔවුන්ගේ උපදෙස් සහ නිරීක්ෂණ ලබාගැනීම සහ මාර්ගගත පද්ධතියක් සඳහා ඔවුන්ගේ අපේක්ෂාවන් සහ නිර්දේශ ලබාගැනීම සඳහා මූලික උපදේශන.
- විශාල සහ කුඩා සමාගම්, අධික සහ අවම වශයෙන් සහතික පත් පරිශීලණය කරන සමාගම් සහ ප්‍රධාන අපනයන අංශ ලෙස සමාගම් හඳුනාගෙන තෝරාගන්නා ලදී.
- ITC විසින්ප්‍රසම්පාදන ක්‍රියාවලියසහ මෘදුකාංග ඉංජිනේරුසමාගමතෝරා ගැනීම
- ව්‍යාපෘතිය සහ වාණිජ දෙපාර්තමේන්තුක්‍රියා පටිපාටි පිළිබඳ තෝරාගත් මෘදුකාංග ඉංජිනේරුසමාගමවෙත මූලික සංක්ෂිප්තයන් ඉදිරිපත් කිරීම
- ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුපරිශ්‍රයේ මෘදුකාංග ඉංජිනේරු කණ්ඩායම පිහිටුවීම
- මෘදුකාංග ඉංජිනේරුකණ්ඩායම සහ ව්‍යාපෘතිතොරතුරු තාක්ෂණ උපදේශකයින් සමඟ එක්ව අපනයනකරුවන් සමඟින් දෙවන වටයේ උපදේශනපැවැත්වීම

IV. අපනයනකරුවන් වෙනුවෙන් අත්පොතක්

සමාගම් ලියාපදිංචි කිරීම්, REX ලියාපදිංචිය, උපකාරක ලේඛන ඉදිරිපත් කිරීම සහ ප්‍රභවස්ථාන සහතික සඳහා අයදුම් කිරීම සඳහා වන ක්‍රියා පටිපාටි සවිස්තරාත්මකව සඳහන් කරමින් අපනයනකරුවන් සඳහා අත්පොතක් වාණිජ දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී. එහි පළමු කෙටුම්පත 2021 අවසානය වන විට සකස් කර අවසන් කරන ලදී. මෙම අත්පොත සකස් කිරීමෙහි අරමුණ වූයේ, විශේෂයෙන්ම පළමු වරට අපනයනය කරන්නන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා, ඔවුන්ගේ ලේඛනවල දෝෂ සහිත වීම හෝ පරතරයන් සහිත වීම නිසා ඇති විය හැකි ප්‍රමාදයන් වළක්වා, එම ක්‍රියා පටිපාටි අවබෝධ කර ගැනීමට මෙන්ම සිය අවශ්‍යතා සපුරාලීමට ඔවුන්ට සහාය විය හැකි මූලාශ්‍රයක් සම්පාදනය කොට සැපයීමයි.
සකස් කර නිම වූ පසු, එම අත්පොත වාණිජ දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ලබා ගත හැකි අතර, වාණිජ දෙපාර්තමේන්තුව සමඟ ලියාපදිංචි වූ සමාගම්වලට මෙන්ම වාණිජ මණ්ඩල සහ EDB හරහා ද බෙදා හරිනු ලැබේ.

V. වරණීය නොවන අපනයන සඳහා ප්‍රභවස්ථාන සහතික (COO) නිකුත් කිරීම පිණිස වාණිජ මණ්ඩල සඳහා සංශෝධිත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

VI. ප්‍රභවස්ථානය පිළිබඳ මගහැරීම් වැළක්වීම (ශ්‍රී ලංකාව වෙත යොමුවන) සඳහා වරණීය නොවන අපනයනයන් සඳහා ප්‍රභවස්ථානික රට පිළිබඳව සහතික නිකුත් කිරීමට බලය ලත් මණ්ඩලය වෙත EU සහ USA හි ප්‍රපාතන විරෝධී බදුවලට යටත් වන නිෂ්පාදන ලැයිස්තුව ලබා දීමට කටයුතු කිරීම.

පරිච්ඡේදය 02 -ප්‍රගතිය සහ ඉදිරිදැක්ම

ඵලදායී එන්නත්කරණය හමුවේ 2021 වසර පුරාවටත් කොවිඩ් 19 වසංගතය විවිධ මාර්ග ඔස්සේ පැතිරීම හේතුවෙන් එම අවධානමෙන් සිය ජනතාව ආරක්ෂා කර ගැනීම උදෙසා ලොව පුරා රටවල් විසින් පනවා තිබූ සංචරණ සීමාවන් ඉවත් කිරීම මන්දගාමී විය.කෙසේ වෙතත්, 2020 දී ගෝලීය වර්ධනය 3.4 %කින් සංකෝචනය වී ඇතත් ඇස්තමේන්තුගත ලෙස 2021 දී එය 5.5% දක්වා යළිත් ඉහළ ගොස් ඇත.භාණ්ඩ වෙළඳාම ශක්තිමත් අයුරින් නැවත ප්‍රකෘතියට පත් වීම මේ සඳහා සාධනීය ලෙස බලපා ඇත. දැඩි පාරිභෝජන වියදම් සහ ආයෝජනවල යම් ඉහළ නැංවීම් මගින් බොහෝ දුරට මෙහෙයවනු ලැබූ ලෝක දළ නිෂ්පාදිතය 2019 වර්ෂයට වඩා 2021 දී 1.9% කින් වැඩි වී ඇත.කෙසේ වෙතත් සේවා වෙළඳාම තව දුරටත් අවපාතික තත්ත්වයේ පවතී. පූර්ව වසංගත තත්ත්වය මර්ධනය කරමින් භාණ්ඩ වෙළඳාම ඉහළ ගිය ද, රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය උත්තේජක නාස්ති වීමත් ප්‍රධාන සැපයුම් දාමයන්ට බාධා මතු වීමත් නිසා චීනය, යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපදය ඇතුළු ප්‍රබල ආර්ථිකයන් සහිත රටවල ද වර්ධන ගම්‍යතාවය සැලකිය යුතු ලෙස 2021 වසරේ දී පහත වැටී ඇත. බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල සහ සංක්‍රාන්ති ආර්ථිකයන්හි වර්ධන වේගය සාමාන්‍යයෙන් දුර්වල වී ඇත.විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය මත යැපෙන සංවර්ධනය වෙමින් පවතින කුඩා ආර්ථිකයන් සහිත රටවල් නැවත ප්‍රකෘති තත්ත්වයට පත්වීම ද සැලකිය යුතු ලෙසින් මන්දගාමී වී ඇත. එහෙත්ලෝක ආර්ථිකය වසර 2022 දී 4% කින් සහ 2023වර්ෂයේදීදී 3.5% කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. (WTO; 2021 ලෝක වෙළඳ වාර්තාව සහ UN;ලෝක ආර්ථික තත්ත්වය සහ අපේක්ෂාවන්)

2021 වර්ෂයේ මහ බැංකු වාර්තාවලින් පිළිබිඹු වන පරිදි, 2021වසරේපළමු භාගයේදී ආර්ථිකය කැපී පෙනෙන ප්‍රකෘතියක් අත්පත් කරගෙන ඇති අතර, කොවිඩ්-19 වසංගතයට එරෙහි වේගවත් එන්නත් කිරීමේ මෙහෙයුම සහ ආධාරක මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල පසුගාමී බලපෑම් එහි වර්ධන වේගයට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව සාමාන්‍යකරණය වීමත් සමඟ පළමු මාස 8 අවසන් වන විට අපනයන ඉපැයීම් පූර්ව වසංගත මට්ටමේ දී පැවති පරිදි යථා තත්ත්වයට පත් විය. 2021 වසරේජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ සමුච්චිත අපනයන ඉපැයීම් 2020 වසරේඊට අනුරූප කාලපරිච්ඡේදයේ තිබූ ඇ.ඩො. බිලියන 6.4 ට සාපේක්ෂව ඇ.ඩො. බිලියන 7.9 දක්වා 22.6% ක වර්ධනයක් වාර්තා කර ඇත. කොවිඩ්-19 වසංගතයේ බලපෑම් ගෝලීය වශයෙන් සම්පූර්ණයෙන්ම පහව ගොස් නැතත්, ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වේගවත් ප්‍රකෘතියක් ලබා ගැනීමට දියුණු ආර්ථිකයන්හි වර්ධන වේගය බලාපොරොත්තු වූවාට වඩා උපකාරී වී ඇත.

2020 වසරේ රජය විසින් පනවන ලද ඇතැම් ආනයන සීමා කිරීම් අඛණ්ඩව පැවතියද ශ්‍රී ලංකාවේ ආනයනය 2021වසරේ පළමු මාස අට තුළ 2020 වසරේ එම කාලයට සාපේක්ෂව 30.7% ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙයට බොහෝ දුරට හේතු වී ඇත්තේ විශේෂයෙන් ඉන්ධන ඇතුළු ගෝලීය මිල ඉහළ යාමත් සමඟ ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීමයි. තොරතුරු තාක්ෂණය, භාහිර සේවා ලබා ගැනීම් (IT/BPO)අංශයේ මනා වර්ධනයක් තිබියදීත්, සංචාරක ව්‍යාපාරයෙන් ලැබූ සීමිත ඉපැයීම් සමඟ සේවා අංශය 2021වසරේ පළමු භාගයේදී අවම මට්ටමක් ගන්නා ලදී. 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ භාණ්ඩ වෙළඳ ගිණුමේ හිඟය 2020 සහ 2019 වසරවලඊට අනුරූප කාලපරිච්ඡේදවල පිළිවෙලින් වාර්තා වී ඇති ඇ.ඩො.බි. 3.8 සහ ඇ.ඩො.බි 4.9 සිට ඇ.ඩො.බි 5.5 දක්වා වැඩි වී ඇත.

ශ්‍රීලංකාවේවිදේශවෙළඳප්‍රතිපත්තිය,වෙළඳාමප්‍රවර්ධනයකිරීමසහආයෝජනආකර්ෂණයකරගැනීමඉල
ක්කකරගත්ද්විපාර්ශ්වික, කලාපීයසහබහුපාර්ශ්විකවෙළඳගිවිසුම්කෙරෙහිඅඛණ්ඩවඅවධානයයොමුකර ඇත.නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) සහ වරණීය වෙළඳ ගිවිසුම් (PTAs) ඔස්සේ වරණයන්ගේ උපරිම

භාවිතය හා වෙළඳ පොළ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකාව සිය වෙළඳ පාර්ශවකරුවන් සමඟ තවදුරටත් කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකාව,ලෝකවෙළඳසංවිධානයේ(WTO) සාමාජිකයෙකු ලෙස නීතිපාදක බහු පාර්ශ්වික වෙළඳ පද්ධතියට සහය දක්වන අතර වෙළඳාම පහසුකරණ ගිවිසුම (Trade Facilitation Agreement – TFA) ක්‍රියාත්මක කිරීම සඳහා සක්‍රීයව නියැලී සිටී. පහසුවෙන් ප්‍රවේශ විය හැකි අයුරින් කාලානුරූපව යාවත්කාලීන කරන ලද වෙළෙඳාම සම්බන්ධ තොරතුරු සැපයීම මගින් දේශ සීමා වෙළඳාමට තවදුරටත් පහසුකම් සැලසීමේ ප්‍රයත්නයක් ලෙස, ශ්‍රී ලංකා වෙළඳ බිහිදොරට (ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය/ SLTIP) "පියවරෙන් පියවර ක්‍රියාකාරීත්වය" නමින් නව ක්‍රියාකාරීත්වයක් එක් කරන ලදී.

2021 අගභාගයේදී ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ කලාපීය වෙළඳ මණ්ඩල සමඟ සම්බන්ධ වෙමින් බස්නාහිර පළාතෙන් පිටත පිහිටි ව්‍යාපාරික ප්‍රජාවට ශ්‍රී ලංකා වෙළඳ බිහිදොර හඳුන්වා දීම සඳහා දැනුවත් කිරීමේ සැසි කිහිපයක් වාණිජ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී.

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ අපනයන කේන්ද්‍ර කරගත් ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගතකිරීම සඳහා විදේශ වෙළෙඳාම වැඩිදියුණුකිරීම ඉවහල් වේ.ගෝලීය අපනයන සහ දළ දේශීය නිෂ්පාදනය සඳහා පවතින අඩු අපනයන දායකත්වය සහ මන්දගාමී සෘජු විදේශ ආයෝජන අවශ්‍යතා සම්බන්ධ වර්තමාන අභියෝග සඳහා පිළියම් යෙදිය යුතු වේ. අපනයන භාණ්ඩවල තරහකාරිත්වය වැඩිදියුණු කිරීම, අපනයන භාණ්ඩවල පටු සංයුතිය විවිධාංගිකරණය කිරීම, අපනයන ගමනාන්ත පුළුල් කිරීම, සේවා අපනයන හඳුනාගැනීම, ගෝලීය වෙළඳ පොළට අවතීර්ණ වීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වැඩි දියුණු කිරීම, නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම, ගෝලීය අගය දාම වෙත එකතුවීම සඳහා ඉහළ අගය එකතු කළ හා ඉහළ තාක්ෂණික මට්ටමකින් යුතු භාණ්ඩ නිෂ්පාදනය කිරීමට නිෂ්පාදන හා කාර්මික අංශ විවිධාංගීකරණය හා දැනුම පාදක කර්මාන්ත සඳහා සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම යනාදිය රටේ තිරසාර ආර්ථික වර්ධනය හා ඉලක්කගත අරමුණු හා දැක්ම සාක්ෂාත් කර ගැනීමහා තහවුරු කර ගැනීම සඳහා හඳුනාගත් ප්‍රධාන අංශ වේ.

තවද, එසේ කටයුතු කිරීමේදී, ප්‍රමිති ආශ්‍රිත ගැටළු ඇතුළුව, දේශීය සැපයුම් සහ ධාරිතා සීමා, අපනයන තරහකාරිත්වය, භාණ්ඩ හා සේවා සඳහා අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් වැනි අත්‍යවශ්‍ය අනුකූලතා; ශ්‍රී ලංකාවේ අපනයන කෙරෙහි බලපාන තීරු බදු නොවන සාධක, ලෝක බැංකුව (WB)විසින් නිර්මාණය කරන ලද ව්‍යාපාර කිරීමේ පහසුව සහ ලෝක ආර්ථික සංසදයේ (WEF) ගෝලීය තරහකාරිත්වය වැනි ජාත්‍යන්තර ආයෝජන දර්ශක/ ප්‍රමිතීන් හි ඉහළ ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම ඒ හා අනුබද්ධිතඅත්‍යවශ්‍ය කරුණුවලට පිළියම් යෙදීම තවමත් කළ යුතුව පවතී.සෘජු විදේශ ආයෝජන සැලකූ විට, යටිතල පහසුකම් සඳහා කරනු ලබන ආයෝජන මඟින් තවමත් කර්මාන්ත අංශය උත්තේජනය කර නොමැත. නිෂ්පාදන කර්මාන්තවල, කෘෂි ව්‍යාපාරවල හා විකිණිය හැකි සේවාවල සිදුකරන ආයෝජන ආසියාවේ අනෙකුත් ආර්ථිකයන් හා සංසන්දනය කිරීමේදී ඉතා අවම අගයක් ගනී. එබැවින් ශ්‍රී ලංකාව වෙත වඩාත්ම ප්‍රයෝජනවත් ආයෝජන ව්‍යාපෘති ආකර්ෂණය කරගැනීම සඳහා වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

ආර්ථික සබඳතා මෙහෙයවීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සමඟින්, වෙළඳ පාර්ශවකරුවන් සමඟ ආර්ථික සබඳතා වැඩිදියුණු කරගැනීම හා ස්ථාවර කර ගැනීම, දැනට පවතින හා නව ජාත්‍යන්තර වෙළඳ පොළවල්හි වෙළඳපොළ කොටස්කාරිත්වය තවදුරටත් වැඩිකර ගැනීම, තීරු බදු ක්‍රමය හා බදු සංශෝධන සඳහා යෝජිත සරලකිරීම් ඔස්සේ ආයෝජකයන්ගේ විශ්වාසය වැඩි දියුණු කර ගැනීම, සුළු

හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය කිරීම හා ව්‍යාපාරික මෙහෙයුම් සඳහා පහසුකම් සැපයීම උදෙසා රජය විසින් සිය ප්‍රයත්න අඛණ්ඩවම දියත් කර ඇත.

2010-2021 **දක්වා ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන, අපනයන සහ වෙළඳ ශේෂය පහත පරිදි වේ.**

(වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන වලිනි.)

වර්ෂය	අපනයන	වර්ධනය %	ආනයන	වර්ධනය %	සමස්ත වෙළඳාම	වෙළඳ ශේෂය
2011	10,018	20.8	19,703	59.7	29,721	-9,685
2012	9,181	-8.4	17,889	-9.2	27,069	-8,708
2013	10,009	9.0	17,098	-4.4	27,107	-7,088
2014	11,044	10.3	19,246	12.6	30,290	-8,202
2015	10,212	-7.5	18,989	-1.3	29,201	-8,777
2016	10,217	0.1	19,515	2.7	29,732	-9,298
2017	11,411	11.69	21,324	9.2	32,735	-9,913
2018	11,687	2.42	22,069	3.5	33,756	-10,382
2019	11,769	0.7	19,486	-11.7	31,255	-7717
2020	9,912	-15.7	15,606	-19.9	25,518	-5,694
2021	12,249	23.9	20,052	28.66	32,301	-7,803

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

.....
Accounting Officer D.G.A.P. Dharmapriya
Name: Actg. Director General of Commerce
Designation:
Date: 23/02/2022

පරිච්ඡේදය 03- 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		110,746,000	88,880,000	ඒසීඒ-3
-	තැන්පතු		645,812	384,350	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		5,179,548	4,681,883	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**116,571,360**	93,946,233	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**116,571,360**	93,946,233	
	භාණ්ඩාගාරයටප්‍රේෂණ (ඇ)		5,929,621	490,303	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		110,641,739	93,455,930	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
65,750,000	වැටුප්, වේතනසහඅනෙකුත්සේවකප්‍රතිලාභ	**5**	65,664,514	57,796,266	
29,275,000	අනෙකුත්භාණ්ඩහාසේවා	**6**	24,496,616	27,208,816	ඒසීඒ-2(ii)
46,000,000	සහනාධාර, ප්‍රදානසහමාරුකිරීම්	**7**	45,254,127	40,852,360	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
141,025,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**135,415,257**	125,857,442	
	මූලධන වියදම්				
13,050,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	11,429,567	27,000	

500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	490,188	1,181,127	
5,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	3,099,376	4,003,501	ඒසිඒ-**2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
500,000	හැකියා වර්ධනය	**14**	61,900	328,209	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
19,050,000	**මුළු මූලධන වියදම් (උ)**		**15,081,031**	5,539,837	
	තැන්පතු ගෙවීම්		31,535	384,350	ඒසිඒ-**4**
	අත්තිකාරම් ගෙවීම්		5,472,093	3,140,090	ඒසිඒ-**5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		5,503,628	3,524,440	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		155,999,916	134,921,719	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(45,358,177)	(41,465,789)	
	අග්‍රමසැසඳුම්ප්‍රකාශයඅනුවශේෂය		(45,358,177)	(41,465,789)	ඒසිඒ-**7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසිඒ-**3**
			(45,358,177)	(41,465,789)	

පිටු අංක 18 සිට 51 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 54 සිට 59 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිතකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර : ජේ. එම්. භද්‍රානි ජයවර්ධන
දිනය : 2022.02.24
වේළෙඳ අමාත්‍යාංශය
අංක.492. ආර්. ඒ. ද මැල් මාවත.
කොළඹ 03.

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2022/02/22
ඩී.පී.ඒ.පී. ධර්මප්‍රිය
වැඩ බලන වාණිජ අධ්‍යක්ෂ ජනරාල්

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2022/02/22
කේ. එච්. විජේසිංහ
ගණකාධිකාරි
වාණිජ අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	60,014,462	77,328,929
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	13,109,522	12,816,977
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**73,123,984**	**90,145,906**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		12,495,245	12,816,977
දේපළ පිරියත හා උපකරණ සංචිතය		60,014,462	77,328,929
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	614,277	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**73,123,984**	**90,145,906**

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන්අවසන්වර්ෂයසඳහා

මුදල්ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය නැවත ගලපන ලද 2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-

ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	41,247,230	38,318,501
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	110,746,000	88,880,000
අත්තිකාරම් අයකර ගැනීම්	3,396,259	2,447,779
තැන්පතු ලැබීම්	645,812	384,350
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**156,035,301**	**130,030,630**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	101,614,047	85,286,391
සහනාධාර සහ මාරුකිරීම්	42,442,605	38,043,981
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	300,000	1,526,653
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	5,929,621	490,303
අත්තිකාරම් ගෙවීම්	5,227,305	3,140,090
තැන්පතු ගෙවීම්	31,535	384,350
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**155,545,113**	**128,871,768**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**490,188**	**1,158,862**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	22,265
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**22,265**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	490,188	1,181,127
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**490,188**	**1,181,127**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(490,188)**	**(1,158,862)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**0**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-

මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**0**	**0**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**0**	**0**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**0**	**0**

3.4 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදනවර්ගය	වෙන්කරනලදප්‍රතිපාදන		තත්‍යවියදම	උපයෝගීකරනුලැබූප්‍රතිපාදනය,අවසන්කරනලදඅවසානප්‍රතිපාදනයප්‍රමාණයේ **%** ලෙස
	මුල්ප්‍රතිපාදනය	අවසානප්‍රතිපාදනය		
පුනරාවර්තන	154,025,000	141,025,000	135,415,257	96%
ප්‍රාග්ධන	6,050,000	19,050,000	15,081,031	79%

3.5 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම්කේතය	කේතවිස්තරය	**31.12.2021**දිනට භාණ්ඩසමීක්ෂණ වාර්තාවඅනුවශේෂය	**31.12.2021**දිනට මූල්‍යතත්ත්වවාර්තාවඅනුවශේෂය	ඉදිරියේදීගිණුම්කරණයටනියමිත	ප්‍රගතිය **%** ලෙසවාර්තාකිරීම
9152	යන්ත්‍රෝපකරණ සහ උපකරණ	77,328,929.22	60,014,462.27	නැත	100%

3.6 විගණකාධිපතිගේවාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PAF/A/COM/01/FS/2021 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 මැයි 31 දින

වාණිජ අධ්‍යක්ෂ ජනරාල්

වාණිජ දෙපාර්තමේන්තුව

වාණිජ දෙපාර්තමේන්තුවේ **2021** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **11(1)** වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.ජී.එන්. මැණිකේ

නියෝජ්‍ය විගණකාධිපති.

විගණකාධිපති වෙනුවට

පිටපත් - 01. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව
02. ලේකම් - වෙළඳ අමාත්‍යාංශය

අංක 306/72, පොළුවිල පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PAF/A/COM/01/FS/2021 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 මැයි 3 දින

වාණිජ අධ්‍යක්ෂ ජනරාල්
වාණිජ දෙපාර්තමේන්තුව

වාණිජ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

වාණිජ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාණිජ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වාණිජ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වාණිජ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72. பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මූදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ පරමුණ වේ. සාධාරණ සහතිකවීම උපස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාන්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරනා ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාපූර්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ආ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවන්ව නිවැරදිවත්ව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද එසේ කටයුතු නොකිරීම හේතුවෙන් වැය විෂයන් 03 ක් සඳහා ප්‍රතිපාදිත මුදලින් සියයට 60 ක සිට සියයට 88 ක් දක්වා පරාසයකින් මුලු වටිනාකම රු. 976,961 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණි.

2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සළුලදායි අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

නීති රීති, රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවිධානවලට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
මුදල් රෙගුලාසි 1646	රෙගුලාසි ප්‍රකාරව ධාවනයේ යොදවා ඇති වාහන සඳහා ධාවන සටහන් නඩත්තු කළ යුතු අතර එම ධාවන සටහන්වල පිටපත් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද, ධාවනයේ යෙදවිය හැකි වාහන 07 ක් සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකරන ලදි.
මුදල් රෙගුලාසි 1647(ඉ)	රෙගුලාසි ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් නොපැවතුණි.

(ආ)	2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ චක්‍රලේඛයෙහි 06 ඡේදය	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පහත සඳහන් ආකෘතීන් මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කර නොතිබුණි. • සටහන (i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය • සටහන (ii) පොත් වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශය • CIGAS ඩෙස්ක්ටොප් යෙදුම මඟින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම සහ නව CIGAS වෙබ් යෙදුම් පද්ධතිය මඟින් ලබාගත් අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ
(ඇ)	2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 3.1.6. ඡේදය	2021 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2022 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2022 මැයි 10 දින වන විටත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
(ඈ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	දෙපාර්තමේන්තුවේ ධාවන තත්ත්වයේ පවතින වාහන 07 ක් පැවති අතර ඉන් වාහන 04 ක චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි.
(ඉ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	දෙපාර්තමේන්තුව ස්ථාපිත ගොඩනැඟිල්ලෙහි කොටස් වෙන් කිරීම (Partition) සඳහා රු. 10,751,459 ක් වූ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.
	2.8.1(ආ) මාර්ගෝපදේශ	• විෂය පිළිබඳ විශේෂඥයෙකුගෙන් සහ ප්‍රසම්පාදන කාර්යය පටිපාටිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති අවම වශයෙන් එක් සාමාජිකයෙකුගෙන්ද තාක්ෂණික ඇගයීම් කමිටු සමන්විත විය යුතු වුවද වාණිජ අධ්‍යක්ෂවරයෙකු හා සහකාර වාණිජ අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් සමන්විත වී තිබුණි.

2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් " බී " ගිණුමෙහි 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ශේෂයෙහි රු. 278,944 ක වෙනසක් පැවති අතර එම වෙනස වර්ෂ 15 කට අධික කාලයක සිට පැවත එමින් පැවතුණි.

(ආ) 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය අනුව විශ්‍රාම ගනු ලබන හා මිය ගිය නිලධාරීන්ගේ අත්තිකාරම් කඩිනමින් පියවා ගත යුතු වුවත් 2021 නොවැම්බර් මස විශ්‍රාම ගිය නිළධාරිණියකගෙන් රු. 154,995 ක ණය ශේෂයක් අය නොවී මාස 02 ක කාලයක් ගත වී තිබුණි.

(ඇ) 2021 ජනවාරි 01 දිනට නිලධාරීන් 04 දෙනෙකුගෙන් අය විය යුතුව තිබූ එකතුව රු. 60,319 ක ආපදා ණය ශේෂයන්ට අදාළ කිසිදු අය කිරීමක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර නොමැති බව නිරීක්ෂණය විය

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

ශ්‍රී ලංකාවේ ආනයන අපනයන නොරතුරු, තීරුබදු අනුපාත හා අනෙකුත් අදාළ සටහන් ලෝක වෙළඳ සංවිධානයේ ඒකාබද්ධ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම් දෙපාර්තමේන්තුව මඟින් කළ යුතු වුවද 2017 වර්ෂයෙන් පසු එම කාර්යය ඉටු කර නොනිබුණි.

3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වසර 50 කට පෙර කාලයක සිට ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන සඳහා වන තීරුබදු බැඳීම සියයට 50 ක් වන අතර එය සංවර්ධනය වෙමින් පවතින රටවලට සාපේක්ෂව පහළ අගයක්

වන බැවින් විශේෂ ආරක්ෂණ යාන්ත්‍රණයක් සම්බන්ධව සැලසුම් සකස් කර තිබුණද ලෝක වෙළඳ සංවිධානය සමඟ පවත්වන ලද සාකච්ඡාවන්හිදී ප්‍රගතියක් ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් ජාත්‍යාන්තර වෙළඳාම තුළ වත්මන් සංවර්ධන අවස්ථා යහ තර්ජන හඳුනා ගැනීම සඳහා පර්යේෂණ කර්යයන් 14 ක් ඉටු කිරීමට ඉලක්ක සකසා තිබුණද විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව ඉන් කාර්යයන් හතරක් පමණක් නිම කර තිබූ බව නිරීක්ෂණය විය.

3.2 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවට අයත් මෝටර් රථයක් දුම් පරීක්ෂාව අසමත් වීම හේතුවෙන් 2019 වර්ෂයේ සිට නිෂ්කාර්යයව පැවති අතර එම වත්කම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3 අනාර්ථික ගනුදෙනු

දෙපාර්තමේන්තුව මඟින් මහජනතාවට සපයන සේවාවන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා 2019 වර්ෂයේ රු. 3,584,470 ක් වැය කර විදුලි පෝලිම් කළමණාකරණ ක්‍රමය හඳුන්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට මෙම පද්ධතිය භාවිතයෙන් ඉවත් කර තිබුණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර විගණක පත් කිරීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය හා 40 (2)(1) වගන්තිය ප්‍රකාර ගණන් දීමේ නිළධාරියා විසින් එම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම පිණිස සුදුසු විගණකවරයෙකු පත් කරනු ලැබිය යුතු වුවද පනතේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය දක්වාම අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.2 සේවක මණ්ඩල කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 151 ලෙස දක්වා තිබුණද තථ්‍ය කාර්යය මණ්ඩලය 115 ක් වූයෙන් මුළු පුරප්පාඩු තනතුරු 36 ක් විය.

(ආ) දෙපාර්තමේන්තුවේ විධායක මට්ටමට අයත් ඉහළම තනතුරු දෙක වන වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුර හා අතිරේක වාණිජ අධ්‍යක්ෂ ජනරාල් යන තනතුර ඇතුළත්ව විශේෂ හා පළමු ශ්‍රේණියේ අනුමත තනතුරු 10 න් තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතුණි. තවද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තථ්‍ය කාර්යය මණ්ඩලය 56 ක් වූ අතර ඉන් 30 ක් විදේශ දූත මණ්ඩල සේවයට අනුයුක්ත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා යන්ත්‍රවේදන තාක්ෂණ) තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා නොගෙන නිලධාරියෙකු බඳවාගෙන තිබුණි.

ඩබ්ලිව්.ජී.එන්. මැණිකේ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් - 01. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
02. ලේකම් - වෙළඳ අමාත්‍යාංශය

පරිච්ඡේදය 04 -කාර්යසාධන දර්ශක

5.1 දෙපාර්තමේන්තුව සඳහා වන කාර්යසාධන දර්ශක

#	කාර්යසාධන දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස
1	අන්‍යොන්‍ය නොවන වෙළෙඳ ගිවිසුම් යටතේ තීරු බදු සහන අත්කරගැනීම සඳහා ඉල්ලීම් පැවැත්වීම	සිදුකරමින්පවතී
2	අන්‍යොන්‍ය වෙළෙඳ ගිවිසුම් යටතේ තීරු බදු සහන අත්කර ගැනීම සඳහා ඉල්ලීම් පැවැත්වීම	සිදු කරමින් පවති
3	පවත්වන ලද ඒකාබද්ධ කමිටු රැස්වීම් වාර ගණන	කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් නොපැවැත්වෙන ලදී.පසු විපරම් කටයුතු සිදු කෙරිණි
4	බහු පාර්ශවීය තලය හමුවේ ශ්‍රී ලංකාවේ අභිරුචිය ආරක්ෂා කිරීම	සිදු කරමින් පවති
5	වාර්තා කරන ලද වෙළෙඳ පොළ ප්‍රවේශය සම්බන්ධ ගැටලු සඳහා මැදිහත්වීම් සහ විසඳීම	සිදු කරමින් පවති
6	පැය දෙකක් තුල ප්‍රභවස්ථාන සහතික පත් නිසි ලෙස නිකුත් කිරීම	100%
7	ව්‍යාපාරික ගැලපුම් හමු (තනි තනි වශයෙන්)	118%
8	සංවිධානය කරන ලද ව්‍යාපාරික ජාලගතකිරීමේ සැසි වාර ගණන	108%
9	සංවිධානය කරන ලද ආයෝජන සම්මන්ත්‍රණ ගණන	41%
10	විදේශ රටවල පවත්වන ලද ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ගණන.	222%
11	තෝරා ගන්නා ලද විදේශ රටවල වෙළෙඳ ප්‍රදර්ශන/ සල්පිල් සංවිධානය කිරීම	-25%
12	ශ්‍රී ලංකාවේ පවත්වනලද වෙළෙඳ ප්‍රදර්ශන/ සල්පිල් සඳහා සහභාගිවීමට මිලදී ගැනීමේ විදේශ දූත කණ්ඩායම් සංවිධානය කිරීම.	-89%
13	නිදහස් සහ වරණීය වෙළෙඳ ගිවිසුම් යටතේ පවතින ඉඩ ප්‍රස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීමේ සැසිවාර පැවැත්වීම.	-50%
14	විදේශ වෙළෙඳාම සහ ලෝක වෙළෙඳ සංවිධානයේ ගිවිසුම්හි නව වර්ධනයන් පිළිබඳ තේමා කරගත් පුහුණු වැඩසටහන්/ වැඩමුළු පැවැත්වීම සංවිධානය කිරීම.	කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් නොපැවැත්වෙන ලදී.

පරිච්ඡේදය 05 -තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීම
ඉලක්ක 17: තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය සම්බන්ධතාව පවත්වා ගැනීමේ ක්‍රම ශක්තිමත් කිරීම සහ පුනර්ජීවනය කිරීම.	ඉලක්ක 17:10 ලෝක වෙළෙඳ සංවිධානය යටතේ එහි දෝහා සංවර්ධන සැලැස්මේ සාකච්ඡාවන් නිමා කිරීම මඟින් විශ්වීය, නීතිමය, විවෘත, වෙනස් කොට නොසැලකෙන සහ සමානාත්මතාවයෙන් යුතු බහු පාර්ශවීය වෙළෙඳ පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම	එකම ස්ථාවරයන්හි සිටින අනෙකුත් රටවල් සමඟින් සම්බන්ධවීමෙන් බහු පාර්ශවීය සම්මේලනයන්හි පොදු ස්ථානයක් සකස් කර ගැනීම, ලෝක වෙළෙඳ සංවිධානයේ සාකච්ඡාවන් සඳහා ක්‍රියාකාරීව සහභාගිවීම, අන්‍යොන්‍ය සහ අන්‍යොන්‍ය නොවන වෙළෙඳ ගිවිසුම් යටතේ තීරු බදු සහන අත්කරගැනීමේ සාකච්ඡාවන්හි නිරත වීම.	සිදුකරමින් පවතී
	ඉලක්ක 17:11 2020 වනවිට ඌණ සංවර්ධිත රටවල ගෝලීය අපනයනයේ කොටස ද්විත්ව කිරීමේ අරමුණින් යුතුව සංවර්ධනය වෙමින් පවතින රටවල අපනයනයන් සුවිශේෂී අයුරින් ඉහළ නැංවීම.	ව්‍යාපාරික ගැලපුම් හමු (තනිතනිවශයෙන්) සංවිධානය කිරීම, තෝරාගත් විදේශීය රටවල ව්‍යාපාරික ජාලගතකිරීමේ සැසිවාර සංවිධානය කිරීම, අපනයනාභිමුඛ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා තෝරාගන්නාලද විදේශීය රටවල ආයෝජන සමුළු සංවිධානය කිරීම ප්‍රදර්ශන/ තෝරාගත් රටවල වෙළෙඳ සල්පිල් සංවිධානය කිරීම, ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු බිහිදොර පිළිබඳ සත්කාරක ආයතනය ලෙස කටයුතු කිරීම, ශ්‍රී ලංකාවේ පවත්වන වෙළෙඳ ප්‍රදර්ශන/ සල්පිල් සඳහා සහභාගිවීමට මිලදීගැනීමේ විදේශීය දූත කණ්ඩායම් සංවිධානය කිරීම, තෝරාගත් විදේශ රටවල වෙළඳ සල්පිල් හා ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකා සහභාගීත්වය සංවිධානය කිරීම ,නිදහස් සහ වරණීය වෙළෙඳ ගිවිසුම් යටතේ පවතින ඉඩ ප්‍රස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීමේ සැසිවාර පැවැත්වීම, වෙළෙඳ ගිවිසුම් යටතේ බදු සහන පහසු කරණය කිරීමට ප්‍රභවස්ථාන සහතික පත් කඩිනමින් නිකුත් කිරීම, ඒකාබද්ධ කමිටු රැස්වීම් වාර සංවිධානය කිරීම/ සහභාගි වීම, වාර්තා කරන ලද වෙළෙඳපොළ ප්‍රවේශය සම්බන්ධ ගැටලු සඳහා මැදිහත්වීම සහ විසඳීම.	සිදු කරමින් පවති

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අභියෝග

i. ප්‍රධාන සාමාජිකයින්ගේ අර්බුදකාරී ගැටළු සහ අභිරුචියන්ගේ ගැටීම් එකිනෙකට පටහැනිවීම හේතුවෙන් කලාපීය මට්ටමේ සාකච්ඡාවන්ට බාධා ඇතිවීම.

ii. විවිධ මතවාදයන් හේතුවෙන් ද්වී පාර්ශවීය ගිවිසුම් පිළිබඳ සාකච්ඡාවන් නතර වීම.

iii. උරුගුවේ සාකච්ඡා වටය සිදුකෙරුණු කාලසීමාවෙන් පසු, සාකච්ඡා ක්‍රියාවලිය හමුවේ විශාල රටවල ආධිපත්‍යය සැලකියයුතු ලෙස අඩු වී ඇත. එම නිසා ලෝක වෙළඳ සංවිධානයේ සාකච්ඡාවලදී එකඟතාවයකින් ගිවිසුමකට එළඹීම ආසන්න වශයෙන් කළ නොහැකි දෙයක් බවට පත්ව ඇත. ඒ වෙනුවට ආයෝජන පහසුකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රසම්පාදනය ආදී ක්ෂේත්‍රයන්ගේ බහු පාර්ශවීය මට්ටමේ සාකච්ඡා සිදු කරමින් පවතී.

iv. ශ්‍රී ලංකාවේ අපනයනයන් ප්‍රවර්ධනය කිරීමේදී අනෙකුත් බාධක අවහිරතා අතර සැපයුම් අංශයේ පවතින බාධා.

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	66	56	10
තෘතීක	03	01	02
ද්විතියික	61	43	18
ප්‍රාථමික	21	16	05

6.2 දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපෑ ආකාරය

දෙපාර්තමේන්තුව වෙත සහකාර වාණිජ අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකු බඳවා ගැනීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව, විභාග දෙපාර්තමේන්තුව හා එක්ව කටයුතු කරමින් සිටී. කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් 2021 ප්‍රවේශ විභාගය පැවැත්වීම ප්‍රමාද විය.රියදුරන් සඳහා පවතින පුරප්පාඩු හේතුවෙන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා වාහන පැවරීම සහ දෙපාර්තමේන්තුවේ වාහන සමූහය කළමනාකරණය කිරීමේදී දුෂ්කරතා ඇති විය.

කොවිඩ් - 19 තත්ත්වයන් මධ්‍යයේ වුවද මානව සම්පත් හිඟය 2021 වසරේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වයට කිසිදු බලපෑමක් සිදු නොවීය.කෙසේ වෙතත්, සුවිශේෂී තත්වයන් යටතේ, දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන් ක්‍රියාත්මකව තබා ගැනීම සඳහා අධීක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් යටතේ වූ කාර්යයන් කිහිපයක් එකවර සිදු කිරීමට පැමිණ සිටි නිලධාරීන්ට සිදු විය.

6.3 කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් 2021

වැඩසටහනේනම	පුහුණුව ලත්නිල ධාරී න්සං ඛ්‍යාව	වැඩසට හනේ කාලසී මාව	සමස්තආයෝජ නය (Rs '000)		වැඩසටහ නේස්වභා වයදේශීය / විදේශීය	වැඩසටහනේ පරමාර්ථය
			දේශී ය	විදේශීය		
සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ පුළුල් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	01	දින14	-	-	මාර්ගගත	අපනයන ප්‍රවර්ධනය පිළිබඳ දැනුම

රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ WTO උසස් ගෝලීය විද්‍යුත් වැඩමුළුව	01	දින 30	-	-	මාර්ගගත	WTO යටතේ රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ ඉහළ අවබෝධයක් ලබා දීම
ආනයන බලපත්‍ර සහ දැනුම්දීම් පිළිබඳ WTO මාර්ගගත වැඩමුළුව	02	දින 3	-	-	මාර්ගගත	දැනුම ලබා ගැනීම
එළඹෙන ඉදිරි WTO අමාත්‍ය සමුළුව සඳහා තෝරාගත් ගැටළු පිළිබඳව ආසියානු රටවල් සඳහා විශේෂිත පුහුණු වැඩසටහනක්	02	දින5	-	-	මාර්ගගත	මීළඟ WTO අමාත්‍ය රැස්වීමේදී ශ්‍රී ලංකාවට වැදගත් විය යුතු කරුණු පිළිබඳ අවබෝධයක් ලබා දීම්
IDEAS පුහුණු වැඩසටහන	01	මාස 5	-	-	මාර්ගගත	ජාත්‍යන්තර වෙළඳාම සහ ප්‍රතිපත්ති පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීම
අර්බුද සහ වසංගත කාලවලදී වෙළඳාම පිළිබඳ කලාපීය වෙළඳ ගිවිසුම් සාකච්ඡා කිරීම පිළිබඳ නියමු පාඨමාලාව	01	දින 15	-	-	මාර්ගගත	FTA සාකච්ඡා පිළිබඳ ශක්‍යතා ගොඩනැගීම
නිපුණතා සංවර්ධන අරමුදල විසින් සංවිධානය කරන ලද ඉංග්‍රීසි පාඨමාලාව	01	මාස 4	25		ශ්‍රී ලංකාව	භාෂාමය කුසලතාවය
තරඟකාර ප්‍රතිපත්ති, වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ WTO විද්‍යුත් සම්මන්ත්‍රණය	01	දින 4	-	-	මාර්ගගත	දැනුම ලබා ගැනීම
අසීරු ආරවුල් විසඳීම පිළිබඳ WTO මාර්ගගත වැඩමුළුව	02	දින4	-	-	මාර්ගගත	දෙපාර්තමේන්තු නීති කාර්ය මණ්ඩලයේ ශක්‍යතාව වැඩි දියුණු කිරීම
සංවර්ධනය වෙමින් පවතින රටවල රජය සතු ව්‍යවසාය විධායකයින් සඳහා වන සම්මන්ත්‍රණය	01	දින 14	-	-	මාර්ගගත	චීනයේ අත්දැකීම් පිළිබඳ අවබෝධයක්

						ලබා ගැනීම
ආහාර සැපයුම් දාමයන් පිළිබඳ WTO-සිංගප්පූරු කලාපීය වැඩමුළුව	01	දින 4	-	-	මාර්ගගත	ආහාර වෙළෙඳපොළ සඳහා ඇති අවස්ථා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම
ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව	01	දින 03			ශ්‍රී ලංකාව	භාෂාමය කුසලතාවය
වෙළඳාම පහසුකරණයේ වැදගත්කම පිළිබඳ ජ්‍යෙෂ්ඨ රේගු නිලධාරීන් සඳහා වන ජාත්‍යන්තර පාඨමාලාව	01	දින 7	-	-	මාර්ගගත	WTO යටතේ වෙළඳාම පහසුකරණ ගිවිසුම සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම
පුද්ගලික ගොනු කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	02	දින 1	11.4		ශ්‍රී ලංකාව	කාර්යාල කළමනාකරණය පිළිබඳ කුසලතා වර්ධනය
රාජ්‍ය මූල්‍ය රෙගුලාසි	02	දින 3			ශ්‍රී ලංකාව	මූල්‍ය කළමනාකරණය පිළිබඳ කුසලතා වර්ධනය
WTO ප්‍රංශ-අයර්ලන්ත දූත මෙහෙවර සීමාවාසික වැඩසටහන - 2021	01	මාස9 &දින 17	-	10,000	ජිනීවා	සහ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති සහ සාකච්ඡා සඳහා කාර්යය පුහුණුව පිළිබඳ සවිස්තරාත්මක අවබෝධය

6.4 ආයතනයේ කාර්ය සාධනය සඳහා පුහුණු වැඩසටහන දායක වූ ආකාරය

ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්ති සැලසුම් වර්ධනය කිරීමෙහිලා වාණිජ දෙපාර්තමේන්තුව බහු පාර්ශවීය, කලාපීය සහ ද්වී පාර්ශවීය යන මට්ටම් තුනකින් සිය මූලික කාර්යභාරය ඉටුකරයි. ලෝක වෙළඳ සංවිධානය මෙන්ම වෙනත් බහු පාර්ශවීය තලයන්හිදී ශ්‍රී ලංකාවේ අභිරුචියන් නියෝජනය කිරීම, කලාපීය සහ ද්වී පාර්ශවීය නිදහස්/ වරණීය වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කිරීම සහ ක්‍රියාත්මක කිරීම, වෙළඳ හා ආර්ථික සහයෝගීතාව සඳහා ඒකාබද්ධ කමිටු මෙහෙයවීම සහ වෙනත් රජයන් සමඟ ඒ හා සමාන ගිවිසුම්වලට එළඹීම යනාදිය මෙම සන්දර්භය තුළ වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකළයුතු ප්‍රධාන වගකීම් කිහිපයකි. වෙළඳාම, ආයෝජනය, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයට දායකවන සහ පහසුකම් සලසන වාණිජ දෙපාර්තමේන්තුව විදේශීය රටවල ස්ථාපිත සිය වාණිජ නිලධාරීන් මඟින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය දායක වන පරිදි වැදගත් කාර්යයක් ඉටුකරනු ලබයි.

වාණිජ දෙපාර්තමේන්තුවේ සේවයට කුසලතා මත පදනම් වූ විධිමත් තරඟකාරී විභාග ක්‍රමයකින් දිවයිනපුරා අපේක්ෂකයින් අතරින් නිසි විශේෂිත සුදුසුකම් සහිත පුද්ගලයන් රාජ්‍ය සේවා කොමිසම මඟින් තෝරාගෙන බඳවාගැනීමට කටයුතු කරනු ලැබේ. බඳවාගැනීමේ දිනසිට එම නිලධාරීන් හට දේශීය මෙන්ම ජාත්‍යන්තරතලයේ නිසි පුහුණු වැඩසටහන් සහ අත්දැකීම් ලබාදෙනු ලබයි. ඒ අතර වෙළඳ ප්‍රතිපත්ති හා ප්‍රවර්ධනය පිළිබඳ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ, පශ්චාත් උපාධි, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යටතේ සේවා පුහුණුව ලැබීම් ඇතුලත්වේ. විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ රාජ්‍ය තාන්ත්‍රික සේවා (වාණිජ සහ ආර්ථික) කාර්ය වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත පැවරී ඇත. ඔවුන් බඳවාගැනීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා කාලයතුල නොකඩවා ලබාදෙන සේවයේදී ලැබෙන තාක්ෂණික පුහුණුව සහ අත්දැකීම් වාණිජ දෙපාර්තමේන්තුවේ ඔවුන්ගේ සේවය සඳහා ප්‍රයෝජනවත් වේ.

පරිච්ඡේදය 07 -අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර	අනුකූල වේ		

	පවත්වාගෙන යාම			
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති	අනුකූල වේ		

	දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම			
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2)DMA/1-2019අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම	අනුකූල වේ		

	නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහනකළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම		ගර්හිතවාහන නැත	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම		වාහනඅනතුරුසිදුවීනැත	
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල නොවේ	අවශ්‍යපියවරගෙනඇත	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදනඋපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය	අනුකූල වේ		

	අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම			
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාලනොවේ		
15.2	රැස් කර තිබු ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාලනොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාලනොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ	අනුකූල වේ		

	මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම			
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	විමසුම් ප්‍රමාණාත්මකව ලැබී නොමැත	ක්‍රියාත්මකකිරීමේමට්ටමේපවතී
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලනොවේ	කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් සකස් කිරීම ප්‍රමාද විය	ක්‍රියාත්මකකිරීමේමට්ටමේපවතී
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් සකස් කිරීම ප්‍රමාද විය	ක්‍රියාත්මකකිරීමේමට්ටමේපවතී
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් සකස් කිරීම ප්‍රමාද විය	ක්‍රියාත්මකකිරීමේමට්ටමේපවතී

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම .	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		